ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

වාර්ෂික වාර්තාව

2020

පටුන

- සම්බන්ධීකරණ තොරතුරු..... 01
- දැක්ම සහ මෙහෙවර 02
- සංස්ථාමය තොරතුරු 03-07
- සභාපතිතුමාගේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව..... 08-38
- මූල්‍ය වාර්තා 39-42
    - මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය.....39
    - ආදායම පිළිබඳ ගිණුම් ප්‍රකාශය..... 40
    - ස්කන්ධය මත වෙනස්වීම් පිළිබඳ ගිණුම් ප්‍රකාශය..... 41
    - මුදල් ප්‍රවාහ ප්‍රකාශය..... 42
- ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන්..... 43-58
- විගණකාධිපති වාර්තාව..... 59-76
- විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් ආයතන ගත් ක්‍රියාමාර්ග.....77-86



දැක්ම හා මෙහෙවර

දැක්ම

වැවිලි ක්ෂේත්‍රයේ රජය සතු ප්‍රබලතම වාණිජ ව්‍යවසායකත්ව ආයතනය බවට පත්වීම

මෙහෙවර

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු වත්කම් සේවක සහභාගිත්වයෙන් නිසි කළමනාකරණය කරමින් රටේ දේශීය නිෂ්පාදනයට සහ වතු සේවක පවුල්වල සහ අසල්වැසි ගම්මානයන්හි යහ සාධනය ඇති කිරීමට උපරිම දායකත්වයක් ලබාදීම.

අධ්‍යක්ෂක මණ්ඩලය

නම	තනතුර	පත්වීම් ලබාගත් දිනය
නීතිඥ ශ්‍රීමාල් විජේසේකර මහතා	සභාපති	2020.01.23
ආර්.ඒ.ආර්.එස්.මායාදුන්න මහත්මිය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික/ අමාත්‍යාංශ	2020.01.28
ඩී.ඒ.මනෝරත්න මහත්මිය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	2020.01.28
ජේ.එල්.ඒ.සම්පත් නලින්ද මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	2020.01.28
එස්.එම්.සී.එස්.සිරිවර්ධන මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	2020.01.28
ඩී.ආර්.සුසන්ත සේනාරත්න මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	2020.01.28
ඒ.එම්.සුමේධ රේණුක බණ්ඩාර මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	2020.01.28
කුෂාන් වැගොඩපොළ මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	2020.01.28
ඩබ්.ඩබ්.එම්.බී.පී.කඹුරාදෙනිය මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	2020.10.12


කළමනාකරණය - ප්‍රධාන කාර්යාලය 2020

නම	තනතුර
නීතිඥ ශ්‍රීමාල් විජේසේකර මහතා	සභාපති
එච්.එන්.පී.ජිනසේන මහතා	සාමාන්‍යාධිකාරී
ජේ.එච්.අයි.ජයසුන්දර මහතා	වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - පරිපාලන
එස්.අයි.එම් හසන් මහතා	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය)
කේ.ඒ.එච්.ඩී.පෙරේරා මහත්මිය	කළමණාකාරිනි - ප්‍රසම්පාදන
කේ මුණසිංහ මහතා	කළමණාකරු- නීති
බී.වී.එල්.සී.බෙනරගම මහත්මිය	කළමණාකරු - ඉඩම්
ඩබ්.ඩී.ඩබ්.කීර්ති මහතා	කළමණාකරු - අළෙවි
ඊ.ආර්.අයි.බී.එස්.එස්.බණ්ඩාර මහතා	අභ්‍යන්තර විගණක
ආර්.ජී.එස්.එච්.ගුණතිලක මහතා	ගණකාධිකාරී
ආර්.වයි.ජී.එස්.යාපා මහතා	සහකාර කළමණාකරු -ප්‍රවාහන
ජී.ඩී.එස්.සී.සුදසිංහ මෙනවිය	සහකාර කළමණාකරු - පාලන/මානව සම්පත්
පී.වී.ප්‍රදීප් මහතා	සහකාර කළමණාකරු - ඉඩම්
එච්.එම්.එස්.එන්.හේරත් මිය	සහකාර කළමණාකාරිනී- අළෙවි
පී.සී.ජේ.පනාගොඩ මහතා	සහකාර ගණකාධිකාරී
අයි.පී.කුරුප්පු මහතා	විගණන නිළධාරී
ජී.බී.සී.ෆොන්සේකා මහතා	පරිපාලන නිළධාරී

කළමණාකරණය - වැවිලි 2020

නම	තනතුර
පී. අයි.එල්.පෙරේරා මහතා	වතු අධිකාරී, කැලෑබොක්ක රාජ්‍ය වතුයාය
ඒ.සී.අබේවර්ණ මහතා	වතු අධිකාරී, රංගල රාජ්‍ය වතුයාය
කේ.ඩී.එම්.පී.වීරසිංහ මහතා	වතු අධිකාරී,හෙයාපාර්ක් රාජ්‍ය වතුයාය
එස්.වයි.ලියනගේ මහතා	වතු අධිකාරී, කොටගඟ රාජ්‍ය වතුයාය
ආර්.ඒ.ආර්.එම්.රණවක මහතා	වතු අධිකාරී,හුන්නස්ගිරිය රාජ්‍ය වතුයාය
ටී.එම්.පී.අයි.කේ.තෙන්නකෝන් මහතා	වතු අධිකාරී, ගල්පිහිල්ල රාජ්‍ය වතුයාය
ආර්.ඒ.එම්.දයාරත්න මහතා	වතු අධිකාරී,ගෝමර රාජ්‍ය වතුයාය
ඩබ්.ටී.කේ.සමරතුංග මහතා	වතු අධිකාරී,මිඩ්ලන්ඩ්ස් රාජ්‍ය වතුයාය
ටී.ආර්.එච්.හේවගේ මහතා	වතු අධිකාරී,හාගල රාජ්‍ය වතුයාය
වයි.ඒ.ටී.බී.වඩුගොඩපිටිය මහතා	වතු අධිකාරී, අලකොල්ල රාජ්‍ය වතුයාය
ජී.ඩබ්.ජී.විජේරත්න මහතා	වතු අධිකාරී, ඕපල්ගල රාජ්‍ය වතුයාය
අයි.ඩබ්.ආර්.ජයවර්ධන මහතා	වතු අධිකාරී, වලහන්දුව රාජ්‍ය වතුයාය
ඩී.ඩබ්.ටී.සී.දන්තසිංහ මහතා	වතු අධිකාරී,වයිතලාව රාජ්‍ය වතුයාය
ජී.කේ.ආර්.බී.කිරිඇල්ල මහතා	වතු අධිකාරී, විහාරගල රාජ්‍ය වතුයාය
එම්.එම්.සී.බී.ඇහැලමල්පෙ මහතා	වතු අධිකාරී,වුඩ්සයිඩ් රාජ්‍ය වතුයාය
සී.ජේ.දසනායක මහතා	විදේශ නිවාඩු
සී.එච්.එච්.කේ.ජී.ලක්රුවිර මහතා	වැඩ ආවරණ වතු අධිකාරී, නිකොළොය රාජ්‍ය වතුයාය
එස්. ඩබ්.එම්.සි.එස්. අලදෙණිය මහතා	කුඩාඔය රාජ්‍ය වතුයාය


සංවිධාන ව්‍යුහය



ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය කාර්යාලය සහ විතුයායන්හි කාර්යමණ්ඩලය		
HM 2-1	සංකීනායාධිකාරී	1
HM 1-1	නි.සංකීනායාධිකාරී - මූලය, පංලන	3
MM 1-1	කළමණාකරු -නිති, පංලන, ඉංජි, විදිලි, අලෙවිකරණ, ප්‍රසම්පාදන , අභ්‍යන්තර විගණක ,ගණකාංධිකාරී, විතු අධිකාරී	21
JM 1-1	විගණන නිලධාරී, සහකාර ගණකාංධිකාරී, සහකාර කළමණාකරු - ප්‍රවාහන , අලෙවිකරණ, පංලන , සහකාර විතු අධිකාරීවරු, පරිපාලන සහකාර	24
MA 5-2	මුද්ගලික සහකාර-සභාපති සහ මුද්ගලික සහකාර -සංකීනායාධිකාරී	2
MA 1-1	කළමණාකරණ සහකාර	30
PL 3	මියැදුරු	5
PL 1	අයතන සහකාර	3
එකතුව		89

රූපය 01- සංවිධාන ව්‍යුහය

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු ශ්‍රී ලංකාවේ තේ වතු ව්‍යාප්තිය



රූපය 02- ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ තේ වතු ව්‍යාප්තිය

සභාපතිතුමාගේ සමාලෝචනය



ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ දැක්ම වනුයේ " වැවිලි ක්ෂේත්‍රයේ ප්‍රබලම වාණිජ ව්‍යවසායකත්ව ආයතනය බවට පත් කිරීම" වේ. ඒ අනුව, 2020 වර්ෂයේ දී වැවිලි කර්මාන්ත හා අපනයන කෘෂිකර්ම ගරු අමාත්‍ය වෛද්‍ය රමේෂ් පතිරණ මහතා විසින් 1958 අංක 4 දරණ පනතින් සංස්ථාපිත ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව කළමනාකරණය කිරීම සඳහා එකී පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව නව අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්කරමින් මා එහි සභාපතිවරයා ලෙස පත් කර තිබුණි. "සෞභාග්‍යයේ දැක්ම" රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුව සංස්ථාවේ කළමනාකරණ කිරීමේ කටයුතු සිදු කිරීම 2020.02.06 දින මා විසින් ආරම්භ කරන ලදී.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ කලමනාකරණය භාරගන්නා විට පසුගිය කාලය තුළ (2020 වර්ෂයට පෙර) එහි අභ්‍යන්තර පරිපාලනය හා කළමනාකරණය බොහෝ සෙයින් පහත සඳහන් කරුණු මත බිඳවැටී ඇති බව නිරීක්ෂණය වූ අතර කඩිනමින් ආයතනය තුළ මනා පරිපාලනයක් හා කළමනාකරණයක් ඇති කිරීමට පියවර ගනු ලැබීය.

1.) ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2012 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

2.) ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව 2009 වර්ෂයන් පසු ලාභ උපයා නොතිබූ රාජ්‍ය ව්‍යවසායක් වූ අතර 2019 වර්ෂයේ ලබා තිබූ සමස්ත අලාභය රුපියල් මිලියන 329ක් විය.

3.) සංස්ථාවේ වැටුප් හා සේවකයින්ගේ ව්‍යවස්ථාපිත දීමනා ගෙවීම සඳහා 2013 - 2019 වර්ෂය දක්වා වූ වසර 07ක් තුළ කාල පරිච්ඡේදය තුළ රුපියල් මිලියන 1,550ක ප්‍රදානයන් මහා භාණ්ඩාගාරය මගින් මෙම ආයතනය වෙත වාර්ෂිකව සපයා තිබුණි. සංස්ථාවේ 2003 සිට 2016 වර්ෂය දක්වා සේවකයන්ගේ පැරණි ව්‍යවස්ථාපිත දීමනා නිසි වේලාවට නොගෙවීම මත අධිකරණයන්හි රාජ්‍ය වැවිලි සංස්ථාවට එරෙහිව නඩු විශාල සංඛ්‍යාවක් පවරා තිබුණි.

4.) ආයතනයේ අභ්‍යන්තර මූල්‍ය කළමනාකරණය බිඳ වැටී තිබුණු අතර 2020 වර්ෂය වන විට කොන්ත්‍රාත් පදනම මත සේවක බඳවා ගැනීම් රාශියක් පැවතුණි. 2020 වර්ෂයේ ආරම්භ වන විට ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය කාර්යාලයේ හා වතුයායන් තුළ තිබූ සමස්ත කොන්ත්‍රාත් බඳවා ගැනීම් සංඛ්‍යාව 22 කි.

5.) රාජ්‍ය ව්‍යවසායක් ලෙස මෙම ආයතනයට ව්‍යාපාරික සැලැස්මක් සහ ඒ මත පදනම් වූ ක්‍රියාකාරී සැලැස්මක් නොතිබූ අතර සාකච්ඡා වෙමින් පැවැති අනුමත නොවූ බඳවා ගැනීමේ පටිපාටියක් පැවතිණි.

6.) සංස්ථාවේ වතුයායන් 17 පුරා 3,500කට අධික කම්කරු කාර්ය මණ්ඩලයේ අධීක්ෂණය හා පාලනය සිදුකළ යුතු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වැවිලි) තනතුරට නිසි ක්‍රමවේදය යටතේ බඳවා ගැනීම සිදු නොකොට

පුරප්පාඩුව පැවතුණි. ප්‍රධාන කාර්යාලය තුළ හෝ ප්‍රාදේශීය කාර්යාලය තුළ හෝ වතු යායන්හි දෛනික ආදායම් හා වියදම් නිසි පරිදි අධීක්ෂණය කිරීමක් සිදු නොවීය.

7.) ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව විසින් මහනුවර, මාතලේ, ගාල්ල සහ බදුල්ල යන දිස්ත්‍රික්ක ආශ්‍රිතව රාජ්‍ය වතුයායන් 17ක් කළමනාකරණය සිදු කරමින් පැවතුණු අතර තේ කර්මාන්තශාලා 10 ක් එම වතුයායන් තුළ තිබුණද ක්‍රියාත්මක තත්වයේ පැවතියේ කර්මාන්තශාලා 03ක් පමණි.

8.) කැලෑබොක්ක හා රංගල කර්මාන්තශාලා දෙක නිසි පරිදි යන්ත්‍ර නවීකරණය හා නඩත්තුව සිදු නොකිරීමේ හේතුව මත ප්‍රමිතිගත තේ නිෂ්පාදනයක් සිදු නොවූ අතර සහ තේ වෙන්දේසියෙදී සංස්ථාව විසින් ඉදිරිපත් කරන නිමි තේ සඳහා අවම මිල ගණන් ලැබුණි. එම කර්මාන්තශාලා ක්‍රියාත්මක වුයේද අනතුරුදායක තත්වයන් යටතේය.

9.) වතුයායන් වලින් නෙලනු ලබන අමු තේ දළු ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ කර්මාන්තශාලාවන්හි නිමි තේ නිෂ්පාදනයක් සිදු නොකොට අමු තේ දළු මිලදී ගනු ලබන ගැනුම්කරුවන් වෙත විකිණීමේ ක්‍රමවේදයක් පවත්වාගෙන යමින් තිබූ අතර එම මිල ගණන් ප්‍රසිද්ධ පුවත්පත් මගින් දැනුවත් නොකොට පිළිගත් නිසි ප්‍රසම්පාදන ක්‍රමවේදයෙන් බැහැර ක්‍රියාපටිපාටියක් මත බාහිර පුද්ගලයින් හා ආයතන සමඟ ගිවිසුම් ගත වීම් මත විකිණීමේ ක්‍රමයක් ක්‍රියාත්මක විය.

10.) රාජ්‍ය වතුයායන් තුළ ඇති වන කළමනාකරණ සැලැස්මට අනුව සිදු කරන වාණිජ දැව නිස්සාරණය නිසි පරිදි රාජ්‍ය ආයතනයන් මගින් ලබා ගනු ලබන තක්සේරු වාර්තා මත සිදුවී නොමැත.

11.) සංස්ථාවේ ක්‍රියාකාරීත්වය හා මූල්‍ය කටයුතු පිළිබඳ අභිතකර මතයන් රජයේ විගණකාධිපති විසින් විගණන වාර්තා මගින් ඉදිරිපත් කර තිබුනද එම අභිතකර මතයන් නිවැරදි කර ගැනීමට කලමනාකරණය විසින් සුදුසු වැඩපිළිවෙලක් ක්‍රියාත්මත කර නොතිබුණි.

<u>2020 වර්ෂය තුළ දී ආයතනය තුළ සිදු කරන ලද කාර්ය සාධනය</u>

ප්‍රධාන වශයෙන් ආයතන තුළ වියදම් පරිපාලනය කරමින් රාජ්‍ය චක්‍ර ලේඛන හා නීති රීතීන්ට අනුකූලව නියමිත ප්‍රසම්පාදන ක්‍රමවේදයන් යටතේ කළමනාකරණය සිදු කිරීම පවත්වාගෙන යාම ප්‍රධාන කාර්යාලය මඟින් හා වතුයායන්ට අදාළව ක්‍රියාත්මක කරන ලදී.

2020 වර්ෂයේ මාර්තු මාසයේ සිට කොවිඩ් වසංගත තත්තවයට මුහුණ පෑමට සිදු වූ අතර එහිදී පනවන ලද සංචරණ සීමාවන් හේතුවෙන් ප්‍රධාන කාර්යාලයේ කාර්ය මණ්ඩලය අවම ලෙස සේවයට වාර්තා කිරීම සිදු වූ අතර විශාල අභියෝග රැසකටද මුහුණ පෑමට සිදු විය. එවැනි තත්ත්වයක් යටතේ වුවද 2019 වර්ෂයේ අවසානය දක්වා මහා භාණ්ඩාගාරය මත යැපෙමින් තිබූ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව 2020 වර්ෂය තුළ මහා භාණ්ඩාගාරයට කිසිදු බරක් නොවෙමින් ආයතනයේ පරිපාලන කටයුතු සිදු කර ගැනීමට හැකි විය.

ආදායම් වියදම් කළමනාකරණය සඳහා දෛනික වතුයායන් කටයුතු අධීක්ෂණය කිරීමේ වැඩපිළිවෙලක් ආරම්භ කරන ලද අතර එමගින් වියදම පාලනය කර ගැනීමට හැකි විය. අමු දළු විකිණීම හා වාණිජ දැව නිසි ප්‍රසම්පාදන ක්‍රමවේදයන් ඔස්සේ විකිණීම සිදු කිරීම හේතුවෙන් ආයතනයේ ආදායම වැඩිකර ගැනීමට හැකිවීම මත 2019 වර්ෂයේ රුපියල් මිලියන 329ක් වූ අලාභය 2020 වර්ෂය අවසානයේ මිලියන 149ක් දක්වා රුපියල් මිලියන 180කින් අඩු කර ගැනීමට හැකි විය.

වතුයායන්හි අමු දළු අස්වැන්න වැඩි කිරීම ආදායම් වැඩි කිරීමේ ප්‍රධාන අභියෝගය ලෙස හඳුනා ගත් අතර ඒ සඳහා පසුගිය වර්ෂ වල නිසි පරිදි පොහොර හා කෘෂිකාර්මික යෙදවුම් සිදුකර නොතිබීම අස්වැන්න අඩුවීමට බලපා ඇති

ප්‍රධාන ගැටලුව වන බව හඳුනා ගන්නා ලදී. ඒ අනුව, ආයතනයේ මූල්‍ය තත්ත්වය මත හැකි පරිදි ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ රාජ්‍ය වතු යායන් තුළ නිසි පරිදි නඩත්තු වෙමින් නොතිබූ තේ වගාව සඳහා පොහොර හා අනෙකුත් කෘෂි යෙදවීම් ලබාදීමට කඩිනම් පියවර ගනු ලැබූ අතර ඒ හේතුව මත 2020 වර්ෂයේ අමු දළු අස්වැන්න කිලෝ ග්‍රෑම් 8,101,974 වූ අතර පෙර වර්ෂයේදී (2019) අමු දළු අස්වැන්න කිලෝ ග්‍රෑම් 6,535,701විය. ඒ අනුව, සංස්ථාව විසින් ලබා ගත් අමු තේ දළු අස්වැන්න පෙර වර්ෂයට (2019) සාපේක්ෂව 123.96% ඉහළ නැංවීමට හැකිවිය. තවද, 2020 වර්ෂයේ ලබාගත් අමු දළු අස්වැන්න 2013 වර්ෂයෙන් පසු ලබාගත් වැඩිම අස්වැන්න බවට වාර්තා විය.

නිමි තේ මගින් ලබා ගනු ලබන ආදායම වැඩිකර ගැනීම සඳහා ප්‍රසිද්ධ වෙන්දේසියේ දී වැඩි මිලක් ලබාගත හැකි පරිදි ප්‍රමිතිගත තේ නිෂ්පාදනය කිරීම අත්‍යවශ්‍ය කරුණකි. ඒ සඳහා ප්‍රධාන බාධාවක්ව පැවැතියේ කැලෑබොක්ක සහ රංගල කර්මාන්තශාලා නිසි පරිදි නඩත්තු වීම් සහ නවීන තාක්ෂණයට ගැළපෙන පරිදි නවීකරණය වී නොතිබීමයි. මේ සඳහා කඩිනම් පියවරක් ලෙස ආයතනයේ මූල්‍ය තත්ත්වය අනුව කැලෑබොක්ක කර්මාන්තශාලාව අත්‍යවශ්‍ය නවීකරණය කිරීම් සිදු කිරීමට අවශ්‍ය පියවර 2020 වර්ෂය තුළදීම ගන්නා ලදී.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් තේ කර්මාන්තශාලා තිබියදී බාහිර ආයතනයන්ට දළු විකිණීම රාජ්‍ය ආයතනයක් ලෙස සතුටු විය හැකි තත්ත්වයක් නොවන බව පැහැදිලිය. ප්‍රථම පියවරක් ලෙස ආයතනය පැවැති මූල්‍ය තත්ත්වය සලකා බලා වතුයායන් කිහිපයක් අමු දළු ආයතනයේ තේ කර්මාන්තශාලා වෙත යොමුකර තේ නිෂ්පාදනය වැඩි කිරීමට පියවර ගන්නා ලදී. මෙහෙයුම් වියදම් සඳහා වූ මූල්‍ය තත්ත්වය යථාතත්වයට පත් කර ගන්නා තෙක් බාහිර පාර්ශවයන් සඳහා වූ අමු දළු විකිණීම මාස 02කට වරක් ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පළ කර වඩාත් තරගකාරී ක්‍රමවේදයක් ඇති කරමින් නිසි ප්‍රසම්පාදන ක්‍රමවේදයට ලක් කරන ලදී. එසේම වාණිජ දැව විකිණීමට අදාළවද රජයේ පිළිගත් ආයතන මගින් තක්සේරු වාර්තා ලබාගැනීම සිදුකෙරිණි. මේ නිසා එතෙක් අමු දළු විකිණීමෙන් හා වානිජ දැව විකිණීමෙන් ලද ආදායමද පෙර වර්ෂයට සාපේක්ෂව වැඩි කරගැනීමට හැකි විය.

ආයතනයේ මූල්‍ය කළමනාකරණයෙන් ලැබෙන අදායම පවත්වාගෙන යාමට නොහැකි වීමට බලපානු ලබන ප්‍රධාන කරුණ වනුයේ සේවකයන්ගේ පැරණි ව්‍යවස්ථාපිත දීමනා නිසි පරිදි නොගෙවීම හේතුවෙන් එකතු වී ඇති වගකීම් සමුදායයි. මෙම හේතුව මත අධිභාර සමඟ 2020 වර්ෂය ආරම්භ වන විට ගෙවීමට තිබූ ව්‍යවස්ථාපිත දීමනා ප්‍රමාණය රුපියල් මිලියන 1050.0 වූ අතර රුපියල් මිලියන 388.383 ක් පමණ මුදලක් අයකර ගැනීම සඳහා විශාල නඩු ප්‍රමාණයක් අධිකරණයේ ව්‍යවස්ථාපිත දීමනා නොගෙවීම මත පවරා තිබිණි. භාණ්ඩාගාරයෙන් කිසිදු ප්‍රතිපාදනයක් ලබා නොගෙන හිඟව පැවති ව්‍යවස්ථාපිත දීමනා වෙනුවෙන් රුපියල් 21.34 පමණ මුදලක් අධිකරණයන්ට ගෙවමින් නඩු 77 අවසන් කරන ලදී. මෙසේ ගෙවීමට සිදු වූ හිඟ ව්‍යවස්ථාපිත දීමනා හා රාජ්‍ය බැංකු මඟින් ලබාගෙන තිබූ බැංකු ණය හා බැංකු අයිරා වෙනුවෙන් මාසික වාරිකයන් හා පොළී මුදල් ගෙවීම සඳහා ආයතනය උපයන ලද මුදල් භාවිත කිරීමට සිදුවීම මත මෙම වර්ෂයට (2020) තුළ සේවකයින් සඳහා ව්‍යවස්ථාපිත දීමනා නිසි පරිදි ගෙවීමට සිදු වූයේ මාස 03ක් පමණි.

ආයතනයේ මූල්‍ය කළමනාකරණය හා යහපත් මූල්‍ය විනය පවත්වා ගැනීම උදෙසා ගත යුතු පියවර රාශියක් අනුගමනය කරන ලදී. ඒ අනුව ප්‍රථමයෙන් 2012 වර්ෂයේ සිට ඉදිරිපත් නොකළ වාර්ෂික වාර්තා එනම් 2012 සිට 2016 දක්වා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී.

එසේම, ආයතනයේ නිසි කළමනාකරණය සඳහා ව්‍යාපාරික සැලැස්මක් සකස් කිරීම ආරම්භ කළ අතර බදවා ගැනීමේ පටිපාටි සකස් කර අමාත්‍යාංශය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබීය. කොන්ත්‍රාත් පදනම යටතේ සිදුකර තිබූ බදවා ගැනීම් බොහෝ ප්‍රමාණයක් අවසන් කල අතර

කොවිඩ් 19 තත්ත්වය හේතුවෙන් රජය විසින් වරින් වර නිකුත් කල චක්‍ර ලේඛන මත සමහර කොන්ත්‍රාත් බදවා ගැනීම් සඳහා නිසි ක්‍රමවේදය යටතේ 2020 වර්ෂය තුළ පුරප්පාඩු පිරවීම සිදු කිරීමට නොහැකි විය.
පසුගිය කාලය තුළ සංස්ථාව විසින් නිෂ්පාදන කරනු ලබන නිමි තේ ‘‘සංස්ථා තේ’’ නමින් වෙළඳපලට නිකුත් කිරීමේ ක්‍රමවේදයක් ආරම්භ කර තිබිණි. මෙය ඉතා හොඳ පියවරක් වූ අතර කොවිඩ් තත්වය හමුවේ වුවද එම නිෂ්පාදන වල විකිණීම මෙම වර්ෂය තුළ වැඩි කර ගැනීමට හැකි විය.

2020 වර්ෂයේදී ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ වතුයායන්හි ප්‍රධාන ආදායම වන තේ හා රබර් ආදායම වැඩිවීමේ ප්‍රතිශතය 41.52% වූ අතර වතුයායන්හි හා ප්‍රධාන කාර්යාලයේ අමතර ආදායම් 55.64%ක ප්‍රතිශතයකින් වැඩි වී ඇත. 2020 වර්ෂයේ තේ නිෂ්පාදනය 22.65% කින් සහ සමස්ත තේ විකුණුම් මිලෙහි සාමාන්‍ය අගය 15.63% කින්ද වැඩි වී ඇත.

පෙර වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේ සංස්ථාවේ තේ කිලෝ ග්‍රෑම් එකක නිෂ්පාදන වියදම 10.30% කින් අඩු වී ඇත. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ අලාභය 54.64% කින් අඩු වී ඇත.

2020 වර්ෂය තුළ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට විසින් ලගා කර ගන්නා ලද මූල්‍ය හා මෙහෙයුම් කාර්යසාධනයන් සඳහා මෙම වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා ගත් නිවැරදි තීරණ ඉවහල් වූ බව සඳහන් කරමි. එසේම සංස්ථාවේ සාමාන්‍යාධිකාරී ප්‍රමුඛ සියලුම කාර්ය මණ්ඩලය සිදු කරන ලද කැපකිරීමද අගය කරමි.

ඒ අනුව, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි.

නීතිඥ ශ්‍රීමාල් විජේසේකර
සභාපති
ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

සංස්ථාපිත පසුබිම

නීතිමය පිහිටුවීම

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව 1958 දී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනත අංක 4 යටතේ පිහිටුවන ලද අතර පසුව 1962 අංක 12 සහ 1979 අංක 49 දරන පනත් මගින් සංශෝධනය කරන ලදී.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ ඓතිහාසික පසුබිම

1958 අංක 4 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනත යටතේ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව පිහිටුවා ඇති අතර, ගරු විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතියෙන් පවරා දෙනු ලැබූ වතුයායන් සහ රජය සතු වගාකල බිම් සංවර්ධනය කර නගාසිටුවීමත්, වගාව මනා ලෙස කළමනාකරණය කිරීමත් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව පිහිටුවීමේ ප්‍රධාන අරමුණ විය. තවද, ඉඩම් කොමසාරිස් සහ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්තුමා විසින් පවරා ගන්නා ලද වතුයායන් කළමනාකරණය කර පවත්වාගෙන යාමට පවරාදීම ද ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව පිහිටුවීමේ තවත් අරමුණක් විය.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව ආරම්භයේ සිටම ක්‍රියාත්මක වූයේ රජයට පවරා ඇති වතු කිහිපයක් සමඟ බැවින්, සංස්ථාව පිහිටුවීමේ අරමුණ ඉතා හොඳින් ක්‍රියාත්මක විය. එබැවින් කෙටි කාලයක් තුළ හෙක්ටයාර 15,000 ක පමණ වතු මිලදී ගැනීමට හැකි විය. ශක්තිමත් පනතක් මගින් ස්ථාපිත කිරීම සහ ඒ අනුව නිසි කළමනාකරණය මෙම වර්ධනයට හේතු විය.

1972 ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ සහ 1975 සංශෝධිත පනත යටතේ ජනසතු කරන ලද වතුවලින් වතු 250ක් පමණ සහ පවතින භාරයන් අවලංගු කිරීම නිසා අත්පත් කරගත් වතුවලින් වතු 250ක් පමණ එතෙක් හිමිව තිබූ වතු 25ක් පමණ පවත්වාගෙන ගිය ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට සංවර්ධනය හා නගාසිටුවීමේ අරමුණ පෙරදැරිව හිමිකර දෙන ලදි. එලෙසම අත්පත් කරගත් අනෙකුත් වතු ජනතා වතු සංවර්ධන මණ්ඩලයට පිහිටුවීමෙන් පසු එම ආයතනය වෙත පවරාදී ඇත.

විශාල වශයෙන් පුළුල් කළ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වැඩිදියුණු කිරීමට කළමනාකරණ ව්‍යුහය වෙනස් කිරීමට අවශ්‍ය විය. එමනිසා වතු වඩාත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා 1977 දී බලයට පත් රජය විසින් ප්‍රාදේශීය කාර්යාල පිහිටුවා ඇත. ඒ අනුව වතු පරිපාලනය විමධ්‍යගත විය.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනත 1979 අංක 4 දරන පනත මගින් සංශෝධනය කර ඇත. එම පනතේ 2 වැනි වගන්තියට අනුව ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව යන නම ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව ලෙස සංශෝධනය විය.

තවද, 1979 අංක 49 (සංශෝධිත) පනතේ අංක 6 වැනි වගන්තියට අනුව ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සමාගමේ අරමුණු පහත පරිදි පුළුල් වී ඇත.

අ) නිසි කෘෂිකාර්මික කළමනාකරණයකින් උපරිම ඵලදායිතාවයක් ලබා ගැනීම සඳහා වතු ඉඩම් ප්‍රවර්ධනය කිරීම.

ආ) ඉඩම්වල පවතින වගාවන් ප්‍රතිසංස්කරණය කිරීමෙන් නිසි කළමනාකරණයක් සහ සම්බන්ධීකරණයක් ඇතිව කෘෂිකාර්මික වගාවන් විවිධාංගීකරණය කිරීම.

ඇ) කෘෂිකාර්මික නිෂ්පාදන සැකසීම සහ විකිණීම.

ඈ) වතුවල සත්ව පාලනය සංවර්ධනය.

ඉ) වතුවල කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ සහ උපකරණ ස්ථාපිත කිරීම සහ හොඳින් නඩත්තු කිරීම.

ඊ) වැවිලි සංස්ථාවේ ඵලදායී ක්‍රියාකාරිත්වය සහ කළමනාකරණය සඳහා අවශ්‍ය සියලුම ක්‍රියා පටිපාටි සහ ක්‍රියාකාරකම් සිදු කිරීම.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ වතු කළමනාකරණය සහ විමධ්‍යගත ආයතනික ව්‍යුහය ශක්තිමත් කිරීම සඳහා 1980 වර්ෂය තුළ බොහෝ පියවර ගන්නා ලදී. ඒ අනුව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පැවති ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව අතිගරු ජනාධිපතිතුමාගේ සෘජු අධීක්ෂණය යටතට පත්ව ඇත. 1980 පෙබරවාරි මාසයේදී ප්‍රාදේශීය කාර්යාලවල කාර්යසාධනය වැඩි කිරීම සඳහා වැඩි බලතල සහිත ප්‍රාදේශීය මණ්ඩල හතරක් පිහිටුවන ලදී. ඒවා SLSPC I, II, III සහ IV ලෙස නම් කර ඇත. 1984 දී මෙම ක්‍රියාවලිය තවදුරටත් පුළුල් කරමින් බලංගොඩ සහ මාතලේ අවට වතු නිසිලෙස කළමනාකරණය කිරීම සඳහා SLSPC V සහ VI ලෙස නම් කරමින් තවත් මණ්ඩල දෙකක් ස්ථාපිතකර ඇත. මේ ආකාරයට වතු කළමනාකරණය විමධ්‍යගත කළද ප්‍රතිපත්ති සම්පාදනය, අලෙවිකරණය, ගබඩාකරණය සහ මූල්‍ය කටයුතු කොළඹ පිහිටි ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි නීතිගත සංස්ථාවේ මධ්‍යම මණ්ඩලය මගින් සිදු කරන ලදී.

මෙම ප්‍රතිසංස්කරණවල අකාර්යක්ෂමතාවය සහ අඩු ඵලදායිතාව අවබෝධ කර ගැනීමෙන් පසුව රජය 1992 දී රාජ්‍ය සංස්ථා සහ දේපළ පෞද්ගලික සමාගම් බවට පත්කිරීමේ පනත යටතේ වැවිලි සමාගම් 22ක් පිහිටුවන ලදී. එම ප්‍රාදේශීය වැවිලි සමාගම් 22 වෙත ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සහ ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු ලාභදායී සහ ඉහළ කෘෂිකාර්මික ඵලදායිතාවයක් සහිත වතු 402 දිගුකාලීන බදු පදනම යටතේ පවරා දී ඇත. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට සහ ජනතා වතු සංවර්ධන මණ්ඩලයට ඉතිරිව තිබුණේ දිගුකාලීන පාඩු ලබන උඩරට සහ පහතරට තේ වල ඇති ලාක්ෂණික ගුණාංග නොමැතිකම හේතුවෙන් අඩු විකුණුම් මිලක් සහිත මැදරට තේ නිෂ්පාදනය කරන වතුයායන් 55ක් පමණි. මෙම වතු 55 න් වතු 32 ක් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් විය. මෙම වතු 32 න් වතු 11 ක් 1993 දී සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගමට පවරා දී ඇත. ඒ අනුව, ඉතිරි වතු 11 ක් ඒකාබද්ධ කර වතු 16 ක් පිහිටුවා ඒවා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට යටත් කර ඇත. මෙම වතුවල විශාල ප්‍රදේශයක් පැරණි බීජ තේ වලින් සමන්විත වන අතර මහනුවර සහ මාතලේ දිස්ත්‍රික්කවල නකල්ස් කඳුවැටිය අවට ඉඩම් දුර්වල පස් තට්ටුවකින් සමන්විත වේ. එම නිසා මෙම මැදරට වතුවල ස්වභාවිකව කොළ පැහැති දළු අස්වැන්න ඉතා අඩු මට්ටමක පවතී. වෙළෙඳ පොළ මිල පහළ මට්ටමක පැවතීම සහ අස්වැන්න අඩු මට්ටමක පවතින බැවින් මෙම වතු දිගුකාලීන පාඩු සහිත වතු ලෙස සැලකේ.

එසේම 1992 වර්ෂයේ දී ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ සියලුම කාර්ය මණ්ඩලයම විශ්‍රාම ගැන්වීමෙන් සියලු කටයුතු නවතා දමා තිබුණි. 1994 දී නව කාර්ය මණ්ඩලයක් බඳවා ගනිමින් මෙහෙයුම් නැවත ආරම්භ කර ඇත. එදා සිට 2006 වර්ෂය දක්වා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව ද රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ විෂය පථයට යටත් කර තිබුණි. 2001 සිට 2004 දක්වා කාලය තුළ පාඩු ලබන මෙම සංස්ථාව රජයට බරක් ලෙස සැලකේ. එබැවින් රජයට බරක් වීම අවම කර ගැනීමේ අරමුණින් සමහර වතු සහ වත්කම් දිගුකාලීන බදු පදනම මත ලබා දී ඇත.

ආයෝජන මණ්ඩලයේ නිර්දේශය යටතේ ඇතැම් ව්‍යාපෘති සඳහා පෞද්ගලික අංශයට බදු දී තිබූ වෛතලාව, වුඩ්සයිඩ්, හෙයාර්පාර්ක්, කොටගහ කර්මාන්තශාලාව වැනි වතු එම ව්‍යාපෘති අසාර්ථක වීම නිසා බදු දුන් පාර්ශව විසින් අත්හැර දමා ඇත. පසුව ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට හෙයාර්පාර්ක් වත්ත සහ කොටගහ කර්මාන්තශාලාව වගකීම් රැසක් සමඟ පවරා ගැනීමට සිදු විය. අයහපත් කළමනාකරණය හේතුවෙන් අනවසර

අත්පත් කර ගැනීම් සහ නඩත්තු නොකිරීම හේතුවෙන් වතුයාය වඩ වඩාත් පාඩු ලබන ආකාරය අත්හැර දැමූ හෙයාර්පාර්ක් වත්තෙන් මනාව පිළිබිඹු විය. පසුව වෛතලාව සහ වුඩ්සයිඩ් වතු වෙනත් පෞද්ගලික සමාගමකට පවරා දුන් අතර නිසි කළමනාකාරීත්වය නොමැතිකම හේතුවෙන් එම සමාගම වුඩ්සයිඩ් වත්ත අතහැර වෛතලාව වත්ත පමණක් තම පාලනය යටතේ තබාගෙන ඇත.

2006 දී රාජ්‍ය ප්‍රතිපත්ති වෙනස් කර ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව රාජ්‍ය ව්‍යවසායක ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ විෂය පථයෙන් බැහැර කර උපාය මාර්ගික ව්‍යවසායකයින්ගේ ආයතනයේ විෂය පථයට යටත් කරමින් රජයේ උපායමාර්ගික සංවිධානයක් ලෙස කළමනාකරණය කිරීමට නව ප්‍රතිපත්තියක් හඳුන්වා දී ඇත. කළමනාකරණ උපාය මාර්ගික ව්‍යවසායක කළමනාකරණ ආයතනයේ මැදිහත්වීම යටතේ තේ වගාවන් වෙනස් වූවා සේම මෙම වතු පරිපාලනය කිරීමේ ක්‍රමවේදයද වෙනස් විය. ඒ අනුව වතුයායේ වත්කම් කළමනාකරණය පිළිබඳ නව සංකල්පයක් හඳුන්වා දී ඇත. සංස්ථාවේ විවිධ වත්කම් එනම්, දැව සම්පත රු. මිලියන 3000ක් වන අතර, කුඩා පරිමාණ ජල විදුලි බලාගාර ඉදිකිරීමට ශක්‍යතාවක් ඇති ස්ථාන, කාබන් තිරකිරීම ගණනය කිරීම මගින් අලෙවි කිරීම සහ පාඩු ලබන වතුවල බෝග විවිධාංගීකරණය කිරීම මෙම නව සංකල්පය යටතේ හඳුනාගෙන ඇත.

2007 වසරේ නකල්ස් ලෝක උරුම ගැසට් පත්‍රය සමඟින් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත්ව තිබූ ඉඩම් ප්‍රමාණයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් මෙම ලෝක උරුමයට නතුවිය. ඒ අනුව වාණිජ වනවගාව, එනසාල් වගාව ඇති ඉඩම් මෙන්ම තේ වගාව ඇති ඉඩම් ද නකල්ස් රක්ෂිතය යටතට පත්ව ඇත. කෙසේවෙතත්, ඉඩම් ප්‍රමාණය රක්ෂිතය යටතට පත් වූ නිසාත් මායිම් අවිනිශ්චිත වූ නිසාත් වතු කළමනාකරණය මෙන්ම රක්ෂිතය කළමනාකරණය කිරීම ගැටලු සහගත විය.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් වඩාත් ආකර්ෂණීය ස්ථාන

කැලෑබොක්ක 360^0 දර්ශන පථය (වීව් පොයින්ට්)





කැලෑබොක්ක 360^0 වීව් පොයින්ට් (උස: මීටර් 1,175) ප්‍රවනතා ගමනාන්තයක් බවට පත් විය. කඳු මුදුන මාතලේ සහ මහනුවර දිස්ත්‍රික්කවල මායිමේ පිහිටා ඇති අතර හත්ලේ කුඩා ලෝකාන්තය සහ හුන්නස්ගිරිය කන්ද සෑදෙන එකම කඳු මුදුන බෙදා ගනී. කඳුවැටිය උතුරට විහිදෙන අතර නකල්ස්හි බටහිර ස්කන්ධය සමඟ සම්බන්ධ වේ. පැහැදිලි දිනයක, නරඹන්නන්ට මධ්‍යම කඳුකරය, මහනුවර නගරය, සෙම්බුවත්ත වැව සහ නකල්ස් කඳුකරය නිරීක්ෂණය කළහැකි ආකර්ෂණීය ස්ථානයක් වේ.

අමුත්තන්ට නවාතැන් ගැනීමට කඳවුරු බිමක් සහ වතු බංගලා 02ක් ඇත. පැතලි කඳු මුදුනේ මැද භාගයේ නිම කරන ලද හින්දු සිද්ධස්ථානයක් සහ දර්ශන භුක්ති විඳීමට කූරු භාවිතයෙන් සාදන ලද පැල්පතක් ඇත. දහවල් කාලයේදී ප්‍රදේශය ආවරණය වන පරිදි මීදුම නිසා බාධාවකින් තොරව දර්ශන භුක්ති විඳීමට උදෑසන සංචාරය කිරීම වඩා යෝග්‍ය වේ.

බර්න්සයිඩ්





මහනුවර පිහිටා ඇති, බර්න්සයිඩ් බංගලාව රංගල පොල්ගොල්ල ජලාශයේ සී ප්ලේන් ගුවන් තොටුපළේ සිට සැතපුම් 13 ක් දුරින් පිහිටා ඇති ආකර්ෂණීය ස්ථානයකි.

දන්කන්ද වැව - මිඩ්ලන්ඩ්ස්





දර්ශනීය දන්කන්ද වැව මධ්‍යම පළාතේ ජලාශයක් වන අතර එහි උස මීටර් 957 කි. මෙම දන්කන්ද වැව, කිරිමැටියාරන්දට සහ දංකන්ද වත්තට ආසන්නව සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු මිඩ්ලන්ඩ්ස් වතුයායට නුදුරින් පිහිටා ඇත.


හුන්නස්ගිරිය





මහනුවර නගරයේ සිට කිලෝමීටර 22ක දුරින් හා මාතලේ දිස්ත්‍රික්කයේ ඇල්කඩුව ගම්මානයට ආසන්නයේ පිහිටි නකල්ස් කඳු පංතියත් හුන්නස්හෝල්ස් දිය ඇල්ලත් දෙස් විදෙස් සංචාරකයින්ගේ සිත්ගත් ආකර්ෂණීය ස්ථානයකි. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් හුන්නස්ගිරිය රාජ්‍ය වතුයාය මඟින් මෙම දිය ඇල්ල නැරඹීමට පැමිණෙන සංචාරකයින් සඳහා පහසුකම් සලසා දී ඇත.

වැවතැන්න - වූඩ්සයිඩ්







වැවතැන්න කඳවුරු භූමිය, මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයෙහි මැදමහනුවර ප්‍රදේශයේ පිහිටා ඇති වූඩ්සයිඩ් රාජ්‍ය වතුයායෙහි පිහිටා ඇති අතර මහනුවර නගරයේ සිට කිලෝමීටර 37.9ක දුරින් පිහිටා ඇත. මෙම සුන්දර කඳවුරු භූමියවෙත යන මාවත තරමක් දුෂ්කර වුව ද එය ඉතා සුන්දර අත්දැකීම් බහුල ගමනකි. මහනුවර සිට වැවතැන්න දක්වා යන අතරමහදී විස්මිත සහ ලෝක ප්‍රසිද්ධ වික්ටෝරියා වේල්ල (ඩෑම්) හමුවීම ද තවත් අපූර්වත්වයකි.

සම්බන්ධීකරණ තොරතුරු

සම්බන්ධීකරණ නිලධාරී : අමිල ජයවර්ධන මහතා
සම්බන්ධීකරණ මධ්‍යස්ථානය : ප්‍රාදේශීය කාර්යාලය
ලිපිනය : ප්‍රාදේශීය කාර්යාලය,
ගල්පිහිල්ල, පන්විල.
දුරකථන අංකය : 081-5634903
ෆැක්ස් අංකය : 081-5634902
විද්‍යුත් තැපෑල : regionalofficegp@gmail.com

2020 වර්ෂය තුළ රාජ්‍ය වැවිලි සංස්ථාව මඟින් පාලනය වන වතුයායන්හි තත්ත්වය

2020 ආරම්භයේදී ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙහි කළමනාකරණය යටතේ වතු 15 ක් තිබූ අතර ඉන් වැවිලි 14 ක් මහනුවර සහ මාතලේ දිස්ත්‍රික්කවල පිහිටා ඇති අතර, වලහන්දුව වතුයාය ගාල්ල දිස්ත්‍රික්කයේ පිහිටා ඇත.

වගුව 01- ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ වතුයායන්හි මුළු භූමි ප්‍රමාණය

අංකය	වතුයායෙහි නම	දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	මුළු භූමි ප්‍රමාණය (හෙක්ටයාර)
1	අලකොල්ල	මහනුවර	පන්විල	819.86
2	කොටගහ	මහනුවර	මැදදුම්බර	1,059.81
3	ගල්පිහිල්ල	මහනුවර	පන්විල/කුණ්ඩසාලේ	761.24
4	ගෝමර	මහනුවර	පන්විල	731.13
5	හාගල	මහනුවර	පන්විල	449.49
6	හෙයාපාර්ක්	මහනුවර	උඩුකුඹුර	976.75
7	හුන්නස්ගිරිය	මාතලේ	උකුවෙල	739.72
8	කැලැබොක්ක	මහනුවර	පන්විල	1,370.36
9	කුඩාඔය	මාතලේ	රත්තොට	176.00
10	මිඩ්ලන්ඩ්	මාතලේ	රත්තොට	1,221.31
11	නිකොළාඔය	මාතලේ	රත්තොට	332.41
12	ඔපල්ගල	මාතලේ	මැදදුම්බර	723.10
13	රංගල	මහනුවර	මැදදුම්බර	630.60
14	වෛයිතලාව	මහනුවර	මැදදුම්බර	551.05
15	විහාරගල	බදුල්ල	හල්දුම්මුල්ල	41.90
16	වුඩ්සයිඩ්	මහනුවර	මැදදුම්බර	472.75
17	වලහන්දුව	ගාල්ල	අක්මීමණ	95.22
	මුළු එකතුව			**11,152.70**

වගුව 02 - ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව විසින් මිල දී ගෙන ඇති වතුයායන්

අංකය	වතුයාය	මිල දී ගත් දිනය	භූමි ප්‍රමාණය (හෙක්ටයාර)
1	හපුගස්තැන්න	1/1/1972	1,709.31
2	අළුපොළ	1/1/1972	1,228.74
3	ගලබොඩ	1/1/1972	376.92
4	හල්ගොල්ල	1/1/1972	1,006.88
5	රාස්සගල	1/1/1972	776.49
6	විකිලිය	1/1/1972	805.67
7	තිස්පනේ	1/1/1972	384.62
8	මැද්දේකන්ද	1/1/1972	676.11
9	සොගම	1/1/1972	476.11
10	මතුරට	15/05/1975	278.54
11	ඔඩුවෙල	1/6/1973	659.51
12	අයිස්ලැබ්	26/11/1973	382.59
13	වෙදමුල්ල	1/9/1973	484.62
14	රම්බොඩ	1/9/1973	765.18
15	ග්‍රේට්වැලි	1/1/1974	320.24
16	දකුණු මැදඋම්බර	1/2/1974	505.26
17	කැරොලිනා	1/7/1974	1,063.56
18	ගල්ලේබොද්ද	1/7/1974	752.63
19	ගෙතන්ටි	1/7/1974	203.24
20	සෙනට් හේලියර්	1/7/1974	172.87
21	රොහැමප්ටන්	15/3/1974	100.61
22	නන්පේරියල්	11/4/1974	203.64
23	උඩපොළ	27/5/1975	278.54
24	ඩෙල්කිත්	19/5/1975	1,223.38
25	ඇල්පිටිය	1/6/1975	785.02
26	ගලහ-සිලික් ප්‍රොජෙක්ට්	1/7/1975	694.33
27	හොටිවිල්	1/7/1975	412.15
28	කැම්පියන්	1/7/1975	848.99
29	ඇහැලියගොඩ	1/8/1975	410.93
30	සපුමල්කන්ද	1/8/1975	646.96
31	දියදාව		280.57
එකතුව			**18,914.21**

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව විසින් තම ප්‍රාග්ධනය යොදවමින් ඉහත සඳහන් වතුයායන් මිළදී ගෙන ඇත. එම සියළුම වතුයායන් 1992 වතු පුද්ගලීකරණ ප්‍රතිපත්තිය යටතේ වැවිලි සමාගම්වල කළමනාකරණයට පත් වී ඇත. එබැවින් එම කිසිදු දේපලකින් අප සංස්ථාවට කිසිදු ආදයමක් නොලැබේ.

වගුව 03 - ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙත ගැසට්පත්‍ර මඟින් ලැබුණු ඉඩම්

ගැසට් අංකය	දිනය	ලැබුණු ආකාරය	වතුයායන් ගණන		නාමික වටිනාකම
			ප්‍රාදේශීය වැවිලි සමාගම්	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව	
150/12	7/24/1981	ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව	38	0	නැත
181/12	2/27/1989		55	25	නැත
815/10	4/21/1994		122	1	123
195/6	5/31/1982		6	8	123
569/14	8/2/1989		3	0	123
571/14	8/14/1989		1	0	123
206/15	8/20/1982		0	1	123
230/12	2/2/1983		1	0	123
937/2	8/19/1996		8	0	123
157/13	4/3/1975	රජය	5	0	123
439/18	2/6/1987		0	1	123
මුළු එකතුව			**239**	**36**	

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙත ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙතින් සහ රජයේ විවිධ ආයතනවලින් වතු වල අයිතිය පවරා ඇත. එම පැවරීම් ඉහත සඳහන් ගැසට් පත්‍ර මඟින් සිදු කර ඇති අතර ඒ අනුව ලැබී ඇති වතු ප්‍රමාණය 275 කි.

වගුව 04- රජයේ විවිධ ආයතන හරහා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙත ලැබුණු ඉඩම්

වතුයාය	ලැබුණු ආකාරය	ලැබුණු දිනය	භූමි ප්‍රමාණය (හෙක්ටයාර)
හිග්ගොඩ	ඉඩම් කොමසාරිස්	1/10/1960	319.81
රදෙල්ල	දේශීය ආදායම් කොමසාරිස්	1/10/1960	633.60
යටවත්ත	දේශීය ආදායම් කොමසාරිස්	1/10/1960	522.67
නෙලිඋල	දේශීය ආදායම් කොමසාරිස්	1/10/1960	337.65
පල්ලේකැලේ	ඉඩම් කොමසාරිස්	1/1/1968	1270.04
මුළු එකතුව			**3,083.77**

ඉහත සඳහන් රජය සතුව තිබූ වතුයායන් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව 1958 වර්ෂයේ දී පිහිටුවීමත් සමඟ සංස්ථාවට පවරා ඇත.ශ්‍රී ලංකා රාජ්‍ය සංස්ථාව විසින් තම ප්‍රාග්ධනය යොදවා වැවිලි කටයුතු සිදුකර ඇත.

වතුයායන්හි භූමි පරිභෝජනය 2020

වගුව 05 - වතුයායන්හි භූමි පරිභෝජනය 2020

හෙක්ටයාර ප්‍රකාශය , ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව -2020

වතුයාය	තේ වගා කළ ඉඩම් ප්‍රමාණය (හෙක්ටයාර)					රබර් (හෙක්ටයාර)		සුළු අපනයන බෝග (හෙක්ටයාර)	දැව වගාව (හෙක්ටයාර)	වෙනත් (හෙක්ටයාර)	මුළු ඉඩම් ප්‍රමාණය (හෙක්ටයාර)
	ආදායම සහිත තේ		කොන්ත්‍රාත් පදනම මත දළු	තේ තවාන්	නැවත වගාව	පැරණි රබර් වගාව	රබර් නැවත වගාව		ඉන්ධන දැව		
	ඇට තේ	රිකිළි තේ	ඇට තේ								
අලකොළ	155.75	114.95	124.50	1.00	13.00	-	-	68.60	76.38	265.68	**819.86**
කොටගහ	264.46	34.42	141.31	0.40	3.00	-	-	60.69	24.14	531.39	**1,059.81**
ගල්පිල්ල	33.13	165.01	3.24	2.21	7.04	-	-	15.85	70.21	464.55	**761.24**
ගෝමර	96.85	116.73	136.61	-	9.00	-	-	74.80	53.30	243.84	**731.13**
හාගල	77.78	101.80	84.66	0.42	7.00	-	-	1.00	89.62	87.21	**449.49**
හෙයාර්පාර්ක්	164.50	-	183.50	-	-	-	-	60.00	-	568.75	**976.75**
හුන්නස්ගිරි	153.14	37.78	34.21	0.60	2.00	-	-	74.77	7.00	430.22	**739.72**
කැලැබොක්ක	113.22	288.74	272.73	1.21	5.00	-	-	211.98	350.46	127.02	**1,370.36**
කුඩා ඔය	36.00	-	-	-	-			140.00	-	-	**176.00**
මීඩිලන්ඩ	104.42	117.41	57.17	1.34	10.00	-	-	271.79	219.84	439.34	**1,221.31**
නිකොලඔය	-	47.14	2.43	-	-	-	-	58.89	18.00	205.95	**332.41**
ඔපල්ගල	36.10	48.90	13.00	1.80	-	53.00	-	170.50	68.00	331.80	**723.10**
රංගල	124.10	85.44	112.70	2.00	5.00	-	-	11.50	152.52	137.34	**630.60**
වෛයිතලාව	34.00	39.20	74.69			-	-	62.06	47.39	293.71	**551.05**
විහාරගල	0.81	41.09	-		-						**41.90**
වුඩ්සයිඩ්	-	-	195.31	0.20	19.33	-	-	43.69	30.77	183.45	**472.75**
වලහන්දුව	0.30	-	-		1.60	62.56	2.00	7.40		21.36	**95.22**
එකතුව	**1,394.56**	**1,238.61**	**1,436.06**	**11.18**	**81.97**	**115.56**	**2.00**	**1,333.52**	**1,207.63**	**4,331.61**	**11,152.70**


වතුයායන්හි ප්‍රධාන ආදායම් බෝගය වන තේ හා රබර් අස්වැන්න පසුගිය වසර 10ක් සමඟ සංසන්දනාත්මකව

වගුව 06 - වතුයාන්හි ප්‍රධාන ආදායම් බෝගය වන තේ හා රබර් අස්වැන්න පසුගිය වසර 10ක් සමඟ සංසන්දනාත්මකව


වතුයාය	තේ -අමු දළු (කිලෝ ග්‍රෑම්)									
	2011	2012	2013	2014	2015	2016	2017	2018	2019	2020
අලකොළ	1,077,059	952,633	880,458	769,499	787,217	705,364	759,745	734,923	617,413	755,844
කොටගඟ	312,648	370,453	258,308	194,663	216,383	170,940	205,002	293,452	253,262	303,817
ගල්පිල්ල	971,105	879,545	880,379	665,646	690,856	675,717	775,779	790,235	681,020	833,568
ගෝමර	647,939	566,360	574,639	486,583	547,711	667,328	764,337	743,270	706,865	849,230
හංගල	985,357	843,579	774,142	682,702	682,097	429,360	482,980	547,672	412,474	578,153
හෙයාර්පාර්ක්	455,650	399,609	463,485	375,497	298,837	229,330	252,911	298,088	252,867	362,826
හුන්නස්ගිරිය	370,875		520,190	431,449	578,320	515,374	528,226	496,959	487,032	544,822
කැලෑබොක්ක	2,153,655	2,006,814	1,762,933	1,331,815	1,608,769	1,373,408	1,382,689	1,468,809	1,435,669	1,780,625
කුඩාඔය	-	-	-	-	-	-	-	-	2,581	18,791
මීඩිලන්ඩ්	998,500	669,558	730,241	395,511	586,442	438,614	503,015	586,207	494,211	520,382
නිකොලාඔය****				458	1,122	1,550	2,979	159,993	138,379	191,445
ඔපල්ගල	369,534	369,158	430,719	297,287	301,755	247,751	305,494	354,023	263,246	399,514
රංගල	948,550	739,211	658,274	521,922	678,266	604,332	492,346	606,262	579,595	662,545
වෛයිතලාව***								228,362	157,356	211,812
විහාරගල	-	-	-	-	-	-	-	-	9,267	20,116
වූඩ්සයිඩ්**								22,153	44,463	68,485
එකතුව	**9,290,872**	**7,796,920**	**7,933,768**	**6,153,032**	**6,977,775**	**6,059,068**	**6,455,503**	**7,330,409**	**6,535,701**	**8,101,974**

වතුයාය	*රබර් - ලේටෙක්ස් (කිලෝ ග්‍රෑම්)									
	2011	2012	2013	2014	2015	2016	2017	2018	2019	2020
වලහන්දුව	49,332	39,218	44,861	40,140	36,809	37,522	42,470	33,395	28,122	29,660

****	නිකොලාඔය රාජ්‍ය වතුයාය 2010-2013 සිට මීඩිලන්ඩ්ස් සමඟ ඒකාබද්ධ කෙරිණි
***	වෛයිතලාව රාජ්‍ය වතුයාය 2008-2017 සිට මරුකි සමාගම විසින් කළමනාකරණය කෙරේ
**	2018 වර්ෂයට පෙර, වූඩ්සයිඩ් වතුයාය පිටතට පවරා දී තිබුණි
*	රබර් කිරිවල DRC අගය කිලෝග්‍රෑම් වලට පරිවර්තනය කර ඇත (Dry Rubber Content)



රූපය 03 – අමු තේ දළු අස්වැන්න පසුගිය වසර 10ක් සමඟ සංසන්දනාත්මක




රූපය 04 - රබර් අස්වැන්න පසුගිය වසර 10ක් සමඟ සංසන්දනාත්මකව


වගුව 07 - හෙක්ටයාරයකට ලබාගත් අස්වැන්න අමු තේ දළු හා රබර් (ලේටෙක්ස්) ප්‍රමාණය - 2011-2020

වතුයාය	අමු තේ දළු ප්‍රමාණය - හෙක්ටයාරයට කිලෝ ග්‍රෑම්										
	2010	2011	2012	2013	2014	2015	2016	2017	2018	2019	2020
අලකොල්ල	2,828	3,070	2,856	2,660	2,321	2,293	2,121	2,479	2,367	2,032	2,513
කොටගහ	1,523	1,353	1,316	1,400	1,060	860	819	935	930	809	1,028
ගල්පිහිල්ල	4,228	5,088	4,009	3,819	2,926	2,981	2,916	3,656	3,901	3,362	4,183
ගෝමර	2,958	3,772	3,474	3,363	3,121	3,363	3,084	3,451	3,139	3,027	3,677
හාගල	2,781	2,851	3,595	3,223	2,772	2,716	2,447	2,781	2,883	2,241	3,141
හෙයාපාර්ක්	1,807	1,633	1,274	1,633	1,274	995	674	795	1,260	1,102	1,491
හුන්නස්ගිරිය	3,242	3,474	3,321	2,828	2,181	2,744	2,749	2,823	2,599	2,548	2,844
කැලැබොක්ක	2,791	3,795	3,479	3,079	2,353	2,828	2,888	2,777	2,651	2,553	3,617
කුඩාඔය	-	-	-	-	-	-	-	-	-	70	488
මිඩ්ලන්ඩ්	3,088	2,851	2,498	2,460	2,084	2,167	1,995	2,293	2,585	2,204	2,334
නිකොලාඔය	-	-	-		1,772	1,702	2,544	2,884	3,218	2,860	3,715
ඔපල්ගල	3,791	3,228	3,619	3,972	2,944	2,814	2,309	2,940	4,013	2,999	4,317
රංගල	3,456	367	3,772	3,256	2,553	3,247	2,916	2,316	2,581	2,660	2,723
වෛයිතලාව			-	-	-	-	-	-	2,688	2,093	2,894
විහාරගල	-	-	-	-	-	-	-	-	-	223	480
සාමාන්‍ය	**3,110**	**3,140**	**3,042**	**2,828**	**2,298**	**2,433**	**2,386**	**2,474**	**2,537**	**2,282**	**2,768**

වතුයාය	රබර් (ලේටෙක්ස්) - හෙක්ටයාරයට කිලෝ ග්‍රෑම්										
	2010	2011	2012	2013	2014	2015	2016	2017	2018	2019	2020
වලහන්දුව	776	763	603	690	618	566	577	649	510	430	474



රූපය 05 -හෙක්ටයාර එකකට අමු තේ දළු අස්වැන්න (2011-2020)



රූපය 06: හෙක්ටයාර එකකට රබර් අස්වැන්න (2011-2020)

බටහිර මැදරට කලාපයේ 2020 වසරේ වාර්ෂික වර්ෂාපතනය

වගුව - 08 – බටහිර මැදරට කලාපයේ 2020 වසරේ වාර්ෂික වර්ෂාපතනය

වාර්ෂික වර්ෂාපතනය - 2020	
වතුයාය	වර්ෂාපතනය (මි.මී.)
අලකොළ	1765
කොටගහ	2717
ගල්පිල්ල	2225
ගෝමර	1917
හාගල	2133
හෙයාර්පාර්ක්	2284
හුන්නස්ගිරිය	1038
කැලෑබොක්ක	2822
කුඩාඔය	1681
මිඩ්ලන්ඩ්	3110
නිකොළොය	3555
ඔපල්ගල	1900
රංගල	6057
වෛතලාව	1690

ඉහත විස්තර වලට අනුව, 2020 වර්ෂය පුරාවටම බටහිර මැද රට කලාපයට හොඳ වර්ෂාපතනයක් ලැබී තිබුණි.

පසුගිය වර්ෂ 03 සඳහා පොහොර භාවිතය

වගුව - 09 – පසුගිය වර්ෂ 03 සඳහා පොහොර භාවිතය


වර්ෂය	භාවිතා කළ පොහොර ප්‍රමාණය (මෙ.ටොන්)	පොහොර පිරිවැය (රු.)	භාවිත කළ වල් නාශක ප්‍රමාණය (ලීටර/කි.ග්‍රෑ)	වල් නාශක පිරිවැය (රු.)
2018	229	7,530,941.60	3347 ලීටර	14,308,425.00
2019	215	4,794,652.50	3207 ලීටර	14,431,500.00
2020	350	8,548,750.00	5156 ලීටර	22,740,604.00

2020 වර්ෂයේ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව මඟින් නිෂ්පාදනය කරනු ලැබූ අමු දළු කිලෝග්‍රෑම් එකක විකුණුම් මිල රුපියල් 91.11 වූ අතර බටහිර මධ්‍යම කලාපයේ අමු දළු කිලෝග්‍රෑම් එකක විකුණුම් මිල රුපියල් 135.09ක් විය. ඒ අනුව, 2020 වර්ෂයේදී ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ විකුණුම් අනුපාතය, බටහිර මධ්‍යම කලාපයේ විකුණුම් අනුපාතයට වඩා රුපියල් 43.99 කින් අඩු අගයක පවත්වා ගෙන ඇත.

පසුගිය වසර 03ක සංස්ථාවේ අමු දළු කිලෝ ග්‍රෑම් එකක නිෂ්පාදන වියදම

වගුව - 10– පසුගිය වසර 03ක කාලය තුළ සංස්ථාවේ අමු දළු කිලෝ ග්‍රෑම් එකක සංඝන්දනාත්මක නිෂ්පාදන පිරිවැය

වර්ෂය	අමු තේ දළු කිලෝ ග්‍රෑමයකට නිෂ්පාදන පිරිවැය (රුපියල්)					
	දළු නෙලීම	ක්ෂේත්‍ර වැඩ	පොහොර	වල්නාශක	පොදු වියදම්	එකතුව
2018	32.44	13.24	2.59	7.84	45.96	102.07
2019	45.34	18.34	2.15	12.34	44.19	122.36
2020	45.47	15.44	2.18	9.96	39.18	112.23



රූපය 07– පසුගිය වසර 03ක කාලය තුළ සංස්ථාවේ අමු දළු කිලෝ ග්‍රෑම් එකක සංඝන්දනාත්මක නිෂ්පාදන පිරිවැය

ඒ අනුව අමු දළු කිලෝග්‍රෑම් එකක සමස්ත නිෂ්පාදන වියදමෙන් පොහොර පිරිවැය ඉතා අඩුය. නිෂ්පාදන පිරිවැයේ විශාල පංගුවක් ගන්නා අමු දළු නෙලීමේ සහ පොදු වියදම් කළමනාකරණය නොකර පොහොර පිරිවැය පාලනය


කර ඇති බැවින් අපේක්ෂිත අස්වැන්න අඩු වී ඇත. පාලන අධිකාරියට සහ කළමනාකාරීත්වයට මේ තත්ත්වය වටහා නොගැනීම ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ පවතින දිගුකාලීන පාඩුවට එය එක් හේතුවක් වී ඇත.

තේ නිෂ්පාදනය


ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතුව දැනට තේ නිෂ්පාදන කර්මාන්තශාලා දහයක් ඇති අතර එයින් සී.ටී.සී තේ කර්මාන්තශාලා තුනක් පමණක් ක්‍රියාකාරී තත්ත්වයේ පවතී. කැලැබොක්ක, මිඩ්ලන්ඩ්ස් සහ රංගල තේ කර්මාන්තශාලා තුන මගින් අපගේ වතුයායන් කිහිපයකින් ලබා ගන්නා අමු දළුවලින් තේ නිෂ්පාදනය කරයි. පහත වගුවෙන් එම කර්මාන්තශාලා මඟින් සිදු කරන ලද තේ නිෂ්පාදනය නිරූපණය වේ.

වගුව 11 නිමි තේ නිෂ්පාදනය 2019-2020

කර්මාන්තශාලාව	අමු තේ දළු (කිලෝ ග්‍රෑම්)		නිමි තේ (කිලෝ ග්‍රෑම්)		නිපදවූ නිමි තේ ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස		නිෂ්පාදන පිරිවැය- කිලෝ ග්‍රෑම් එකකට රුපියල්		ශුද්ධ විකුණුම් සාමාන්‍ය - කිලෝ ග්‍රෑම් එකකට රුපියල්	
	2019	2020	2019	2020	2019	2020	2019	2020	2019	2020
කැලැබොක්ක	1,435,669.00	1,742,062.00	308,746.00	382,930.00	22.79	21.98	710.28	655.26	362.11	453.69
මිඩ්ලන්ඩ්	494,211.00	506,119.00	106,282.00	111,910.00	23.40	22.11	659.94	610.65	414.87	409.48
රංගල	579,595.00	642,059.00	124,644.00	142,483.00	23.22	22.19	660.02	604.41	358.71	469.82
එකතුව	**2,509,475.00**	**2,890,240.00**	**539,672.00**	**637,323.00**						



රූපය - 08– නිමි තේ නිෂ්පාදනය



රූපය - 09- කර්මාන්තශාලාවන්ට අදාළ අමු තේ දළු ප්‍රමාණය නිෂ්පාදනය

වගුව 12- කර්මාන්තශාලා පිළිබඳ විස්තර

කර්මාන්තශාලාව	පිහිටි දිස්ත්‍රික්කය	නිෂ්පාදනය කරන තේ වර්ගය	පෙරීමේ ධාරිතාවය (කිලෝ ග්‍රෑම්)	වර්තමාන තත්ත්වය
කොටගඟ	මහනුවර	ඕතඩොක්ස්	1290	ක්‍රිය
ගෝමර	මහනුවර	ඕතඩොක්ස්	8000 (සමස්ත ධාරිතාවය)	ක්‍රිය
හාගල	මහනුවර	ඕතඩොක්ස්	1419	ක්‍රිය
හුන්නස්ගිරිය	මාතලේ	සීටීසී	1720	ක්‍රිය
කැලෑබොක්ක	මහනුවර	සීටීසී	12000(සමස්ත ධාරිතාවය)	ක්‍රියාත්මකයි
මිඩ්ලන්ඩ්	මාතලේ	සීටීසී	1400	ක්‍රියාත්මකයි
දන්කන්ද	මාතලේ	ඕතඩොක්ස්	860	ක්‍රිය
නිකොළොය	මාතලේ	ඕතඩොක්ස්	645	ක්‍රිය
රංගල	මහනුවර	සීටීසී	1500	ක්‍රියාත්මකයි

අපගේ කර්මාන්තශාලාවල නිෂ්පාදන පිරිවැය ඉතා ඉහළ මට්ටමක පැවතීම සහ අපගේ නිෂ්පාදන සඳහා අලෙවි වන ඉතා අඩු මිල යන හේතු මත ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව දැඩි මූල්‍ය අර්බුදයකට මුහුණ දී තිබේ.

මනා පළපුරුදු සහ පුහුණු කළමනාකාරීත්වයක් සහ අධීක්ෂණ කාර්ය මණ්ඩලයක් සිටින ශ්‍රී ලංකා වැවිලි රාජ්‍ය වැවිලි සංස්ථාව විසින් නිෂ්පාදනය කරනු ලබන අමු දළු සහ තේ සඳහා මැදරට සාමාන්‍ය මිලට වඩා අඩු මිළක් ලැබීම කණගාටුදායක තත්ත්වයකි.

මිඩ්ලන්ඩ්ස් තේ කර්මාන්තශාලාව මාතලේ දිස්ත්‍රික්කයේ පිහිටි එකම සී.ටී.සී තේ කර්මාන්තශාලාවයි. කැලෑබොක්ක සහ රංගල තේ කර්මාන්තශාලා මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටා ඇත.

මිඩ්ලන්ඩ්ස් තේ කර්මාන්තශාලාව



කැලෑබොක්ක තේ කර්මාන්තශාලාව




රංගල තේ කර්මාන්ත ශාලාව




සංස්ථා තේ

දේශීය වෙළඳපොළට සංස්ථා තේ ලබා දීම තුළින් සංස්ථා තේ මිල, තේ වෙන්දේසිය තුළ උච්චාවචනය වීමෙන් ඇතිවන තාවකාලික මූල්‍ය අර්බුදයන්ට සහනයක් ලබා දීම පිණිස 2016 වර්ෂයේ නොවැම්බර් මස "සංස්ථා තේ" නිෂ්පාදනය ආරම්භ කරන ලදී.



වගුව 13: සංස්ථා තේ අලෙවිය - ප්‍රමාණාත්මක සංසන්දනය (2018-2020)


මාසය	අලෙවි වූ තේ පුමාණය (කිලෝග්‍රෑම්)		
	2018	2019	2020
ජනවාරි	2,540	2,602	2,788
පෙබරවාරි	2,080	4,636	2,675
මාර්තු	3,948	2,789	3,275
අප්‍රේල්	2,156	939	3,709
මැයි	3,370	2,475	2,878
ජුනි	3,502	1,134	2,921
ජුලි	3,379	3,270	5,587
අගෝස්තු	4,037	2,683	4,472
සැප්තැම්බර්	3,664	3,159	2,617
ඔක්තෝම්බර්	2,507	3,043	4,859
නොවැම්බර්	2,919	4,313	3,846
දෙසැම්බර්	3,494	3,032	5,750
එකතුව	**37,595**	**34,075**	**45,375**



රූපය 10: සංස්ථාතේ අලෙවිය - ප්‍රමාණාත්මක සංසන්දනය (2018-2020)

වගුව 14 සංස්ථා තේ අළෙවි ආදායම (2018-2020)

මාසය	සංස්ථා තේ අළෙවි අදායම (රුපියල්)		
	2018	2019	2020
ජනවාරි	1,717,816	1,948,166	1,543,704
පෙබරවාරි	1,488,563	3,210,598	1,975,437
මාර්තු	2,812,307	2,117,157	1,352,505
අප්‍රේල්	1,602,651	747,593	1,492,498
මැයි	2,418,044	1,661,434	2,158,450
ජූනි	2,609,889	939,405	2,249,149
ජූලි	3,098,106	2,490,901	4,081,756
අගෝස්තු	3,141,932	2,080,813	3,294,264
සැප්තැම්බර්	2,900,447	2,261,770	2,008,403
ඔක්තෝම්බර්	1,934,504	2,139,277	3,561,445
නොවැම්බර්	2,354,412	3,112,667	2,833,044
දෙසැම්බර්	2,877,599	2,345,364	4,267,934
එකතුව	**28,956,270**	**25,055,143**	**30,818,588**




රූපය 11: සංස්ථා තේ අලෙවි ආදායම මාසිකව (2018-2020)

රබර් නිෂ්පාදනය

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතුව පවතිනුයේ එක් රබර් වතුයායක් පමණි. එය ගාල්ල දිස්ත්‍රික්කයේ වලහන්දුව ප්‍රදේශයේ පිහිටා ඇත. වර්ෂ තුනක් සඳහා මුළු රබර් කිරි නිෂ්පාදනය පහත වගුවෙන් නිරූපණය වේ.

වගුව 15- වර්ෂ තුනක් සඳහා මුළු රබර් නිෂ්පාදනය

වර්ෂය	ලේටෙක්ස් (කිලෝ ග්‍රෑම්)	මුළු වියදම (කිලෝ ග්‍රෑම්)	ලාභය / (අලාභය) (රු.)	ශුද්ධ විකිණුම් අගය (රු.)	නිෂ්පාදන පිරිවැය කිලෝ ග්‍රෑම් එකකට (රු.)	කිලෝ ග්‍රෑමයකට ලාභය / (අලාභය) (රු.)
2020	29,660	13,494,113.60	(5,151,942.00)	281.26	454.96	(173.70)
2019	28,122	14,686,995.72	(7,806,787.00)	300.00	522.26	(222.26)
2018	33,395	10,423,247.40	(397,747.00)	220.00	312.12	(92.12)



රූපය 12-රබර් නිෂ්පාදනය (2018-2020)

භාණ්ඩාගාර ප්‍රතිපාදන

මෙම වසරේදී පසුගිය වසර මෙන් වැටුප් හා එදිනෙදා වියදම් කළමනාකරණය කිරීම සඳහා මහා භාණ්ඩාගාරය මඟින් මූල්‍ය ප්‍රතිපාදන ලබා ගෙන නොමැත.

වගුව - 16– ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙත මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රදානයන් පිළිබඳ සාරාංශය

අයිතමය	2016	2017	2018	2019	2020
මෙහෙයුම් වියදම් (කම්කරු වේතන සහ කාර්ය මණ්ඩල වැටුප්)	100	130	68	222	-
ව්‍යවස්ථාපිත ගෙවීම් (සේවක අර්ථ සාධක අරමුදල /සේවක භාරකාර අරමුදල /පාරිතෝෂික)	-	134	90	-	-
ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ සංවර්ධන කටයුතු	-	-	-	-	-
මුළු ලැබීම් (රුපියල් මිලියන)	100	264	158	222	-

2020 වර්ෂය සඳහා වාර්ෂික ඇස්තමේන්තුව සහ 2020 වර්ෂයේ ගිණුම් ප්‍රකාශය අනුව සංස්ථාවේ මූල්‍ය තත්ත්වය පහත පරිදි නිරූපණය වේ


වගුව 17 – 2020 – 2019 වර්ෂයන් සඳහා සංසන්දනාත්මක මූල්‍ය කාර්ය සාධනය

විස්තරය	2020 ඇස්තමේන්තුව	වාර්ෂික ගිණුම් - 2020	කාර්ය සාධනය	2019 ඇස්තමේන්තුව	වාර්ෂික ගිණුම් - 2019	කාර්ය සාධනය
සැකසූ තේ - නිෂ්පාදන පිරිවැය (C.O.P.)	490.68	492.88	100.45	460.55	549.50	119.31
- ශුද්ධ අලෙවි සාමාන්‍යය (N.S.A.)	452.48	432.14	95.51	436.12	373.70	85.69
රබර් - නිෂ්පාදන පිරිවැය (C.O.P.)	312.85	428.06	136.83	287.72	429.52	149.28
- ශුද්ධ අලෙවි සාමාන්‍යය (N.S.A.)	300.00	277.73	92.58	300.00	246.61	82.20
ඇස්තමේන්තුගත නිෂ්පාදනය - සැකසූ තේ (කිග්‍රෑ)	1,980,891	1,728,728	87.27	2,057,042.00	1,409,509.00	68.52
ඇස්තමේන්තුගත නිෂ්පාදනය - රබර් (කිග්‍රෑ)	43,500	29,660	68.18	45,500.00	28,122.00	61.81
ආදායම	රු:	රු:	රු:	රු:	රු:	රු:
සැකසූ තේ සහ තේ දළු	896,312,171	758,598,254	84.64	897,108,237	526,735,834	58.71
රබර් -ලේටෙක්ස්	13,050,000	8,237,326	63.12	13,650,000	6,935,151	50.81
මුළු ආදායම	**909,362,170.68**	**766,835,579.56**	**84.33**	**910,758,237**	**533,670,985**	**58.60**
අඩු කළා: නිෂ්පාදන පිරිවැය						
සැකසූ තේ සහ තේ දළු	971,988,808	852,056,592	87.66	947,367,672	774,529,082	81.76
රබර්	13,608,793	12,696,168	93.29	13,091,117	12,078,825	92.27
මුළු නිෂ්පාදන පිරිවැය	**985,597,601**	**864,752,760**	**87.74**	**960,458,789**	**786,607,907**	**81.90**
දළ ලාභය/(පාඩුව) - වතුයාය	**(76,235,430)**	**(97,917,181)**	**128.44**	**(49,700,551)**	**(252,936,922)**	**508.92**
එක් කළා: වෙනත් ආදායම්						
වෙනත් ආදායම් - වතුයාය	447,155,724	108,706,579	24.31	432,961,589	52,160,715	12.05
වෙනත් ආදායම් - ප්‍රධාන කාර්යාලය	59,930,000	49,771,702	83.05	55,630,000	57,076,072	102.60
මුළු වෙනත් ආදායම් - වතු සහ ප්‍රධාන කාර්යාලය	**507,085,724**	**158,478,281**	**31.25**	**488,891,038**	**109,236,787**	**22.36**
මුළු ආදායම	**430,850,294**	**60,561,100**	**14.06**	**438,891,038**	**(143,700,135)**	**(32.74)**
අඩු කළා: වියදම්						
පරිපාලන වියදම් - වතුයාය	88,602,646	81,860,486	92.39	62,536,441	73,625,149	117.73
-ප්‍රධාන කාර්යාලය	38,905,198	40,726,247	104.68	39,938,603	39,371,623	98.58
පුද්ගල වියදම් - ප්‍රධාන කාර්යාලය	60,421,500	58,338,254	96.55	55,783,280	52,477,079	94.07
මූල්‍ය ගාස්තු - වතුයාය	7,949,744	5,597,184	70.41	7,301,793	5,049,882	69.16
-ප්‍රධාන කාර්යාලය	23,220,000	23,666,011	101.92	12,200,000	15,660,522	128.36
මුළු වියදම	**219,099,087**	**210,188,182**	**95.93**	**177,760,116**	**186,184,255**	**104.74**
ලාභය/(පාඩුව) - වතු සහ ප්‍රධාන කාර්යාලය	**211,751,207**	**(149,627,081)**	**(70.66)**	**261,130,922**	**(329,884,390)**	**(126.33)**

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ පසුගිය වසර 05 තුළ ලාභ/අලාභය

වගුව 18 – ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ පසුගිය වසර 05 තුළ ලාභ /අලාභය

වර්ෂය	ලාභ/අලාභ
2015	(222,236,596)
2016	(150,916,820)
2017	(94,932,600)
2018	(147,798,507)
2019	(329,884,391)
2020	(149,627,081)



රූපය- 13– පසුගිය වසර 5 මත පදනම්ව ලාභ හා අලාභ සංසන්දනය කිරීම

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු මානව සම්පත්

2020 වර්ෂයේ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ කළමනාකරණ, අධීක්ෂණ සහ නිෂ්පාදන කාර්ය මණ්ඩලය පහත වගුවෙන් නිරූපණය වේ.

වගුව - 19– රාජ්‍ය වැවිලි සංස්ථාවේ සතු මානව සම්පත්

වතුයාය	වතු අධිකාරිවරුන් ගණන	සහකාර වතු අධිකාරිවරුන් ගණන	කාර්යය මණ්ඩලය		කම්කරුවන්		එකතුව
			ස්ථිර	කොන්ත්‍රාත්	ස්ථිර	අනියම්	
අලකොළ	1	2	13	.	277	.	293
කොටගඟ	1	1	13	.	197	.	212
ගල්පීල්ල	1	2	19	.	191	8	221
ගෝමර	1	2	17	2	246	4	272
හාගල	1	1	11	.	206	-	219
හෙයාර්පාර්ක්	1	1	11	1	143	2	159
හුන්නස්ගිරිය	1	2	16	-	211	5	235
කැලැබොක්ක	1	4	34	2	731	53	825
මිඩිලන්ඩ්	1	2	24	1	296	13	337
නිකොළොය	1	-	6	-	70	-	77
ඔපල්ගල	1	2	10	1	81	-	95
රංගල	1	1	22	1	195	55	275
වලහන්දුව	1	-	3	1	35	17	57
වෛතලාව	1	-	3	-	66	42	112
වුඩ්සයිඩ්	1	-	2	1	30	-	34
ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාලය	-	-	58	2	3	-	63
එකතුව	**15**	**20**	**262**	**12**	**2978**	**199**	**3486**

2019 වසර අවසන් වන විට ප්‍රධාන කාර්යාලයෙන් වැටුප් ලබා ගත් ප්‍රධාන කාර්යාල සහ ප්‍රාදේශීය කාර්යාල කාර්ය මණ්ඩල සංඛ්‍යාව 63ක් වූ අතර, 2020 වර්ෂයේදීද එම අගය 63ක් ලෙස සමාන සංඛ්‍යාවක් වාර්තා කර ඇත. රුපියල් මිලියන 46.4ක් 2019 වර්ෂයේදී මෙම කාර්ය මණ්ඩලය සඳහා වැටුප් ගෙවීම සඳහා වැය කර ඇති අතර 2020 වර්ෂයේදී රු. මිලියන 48.1 ක් වැය කර ඇත. 2019 ට සාපේක්ෂව 2020 දී රු.මිලියන 1.82 ක් එනම්,4% කින් මෙය වැඩි කර ඇත.

2019 වසර අවසන් වන විට වතු අධිකාරීවරුන් සහ සහකාර අධිකාරීවරුන් ඇතුළු කාර්යාල කාර්ය මණ්ඩලය සහ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය 249ක් වූ අතර 2020 වර්ෂයේදී එය 249ක් ලෙස.සමාන සංඛ්‍යාවක් වාර්තා කර ඇත. රුපියල් මිලියන 103.2ක් 2019 වර්ෂයේදී මෙම කාර්ය මණ්ඩලය සඳහා වැටුප් ගෙවීම සඳහා වැය කර ඇති අතර 2020 වර්ෂයේදී රු. මිලියන 114.72ක් වැයකර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල සහ විගණන කමිටු රැස්වීම්

සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 10ක් හා විගණන කමිටු රැස්වීම් 02 ද පවත්වා ඇත.

වගුව - 20 – අධ්‍යක්ෂ මණ්ඩලය සහ විගණන කමිටු රැස්වීම්

අංකය	රැස්වීමේ නම	රැස්වීමේ දිනය	රැස්වීමේ අංකය
1	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්	2020.02.12	1
		2020.04.30	2
		2020.05.29	3
		2020.06.25	4
		2020.07.21	5
		2020.08.27	6
		2020.09.24	7
		2020.10.28	8
		2020.12.01	9
		2020.12.23	10
2	විගණන කමිටු රැස්වීම්	2020.06.12	1
		2020.07.09	2

2020 ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ මුල්‍ය ප්‍රකාශනයට රජයේ විගණකාධිපතිවරයා අභිතකර මතයක් ලබාදී ඇත. දීර්ඝ කාලයක් තිස්සේ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ මුල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අයහපත් අදහස් ලැබී ඇති අතර, එය නිවැරදි කර ගැනීමට නොහැකි වී ඇත.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

ශ්‍රී ලංකා රුපියල්

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

දෙසැම්බර් 31 වන දිනට	සටහන්:	2020	2019
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ , පිරියත සහ උපකරණ	8	756,246,749	752,391,710
ජීව විද්‍යාත්මක වත්කම්	9	3,507,753,636	3,483,783,882
ආයෝජන දේපළ	10	1,611,520,641	1,611,520,641
ස්ථාවර තැන්පතු		9,175,806	8,863,799
නොනිමි ප්‍රාග්ධන වැඩ		781,064	781,064
විලම්බිත වත්කම්			
මුළු ජංගම නොවන වත්කම්		**5,885,477,895**	**5,857,341,096**
ජංගම වත්කම්			
බඩු තොගය	11	74,595,535	62,502,640
වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු දෑ	12	184,025,544	175,209,745
මුදල් සහ මුදල් සමාන දෑ	13	45,886,973	37,713,613
මුළු ජංගම වත්කම්		**304,508,052**	**275,425,998**
මුළු වත්කම්		**6,189,985,947**	**6,132,767,094**
ප්‍රාග්ධනය සහ සංචිත			
දායක ප්‍රාග්ධනය	14	5,879,852,850	5,879,852,850
රඳවාගත් අදායම්		(1,725,362,785)	(1,570,849,043)
මුළු ඍකන්ධ		**4,154,490,065**	**4,309,003,807**
ජංගම නොවන වගකීම්			
සේවක ප්‍රතිලාභ වගකීම්	15	469,291,620	417,639,183
මුළු ජංගම නොවන වගකීම්		**469,291,620**	**417,639,183**
ජංගම වගකීම්			
වෙළඳ සහ වෙනත් ලැබීම්	16	1,363,998,504	1,318,555,797
බැංකු ණය	16.1	100,000,000	-
බැංකු අයිරාව		102,205,759	87,568,307
මුළු ජංගම වගකීම්		**1,566,204,263**	**1,406,124,104**
මුළු වගකීම්		**2,035,495,883**	**1,823,763,287**
මුළු ඍකන්ධ සහ බැරකම්		**6,189,985,947**	**6,132,767,094**

මූල්‍ය ප්‍රකාශනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් පිටු අංක 5 සිට 19 දක්වා ඉදිරිපත් කර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිතීන්ට නුව පිළියෙළ කරන ලද බවට පහත අත්සන් තබන අය සහතික කර සිටී.

ඇර.ජී.එච්එස් ගුණතිලක මහතා
ගණකාධිකාරී

එස්.අයි.එම්. හසන් මහතා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූල්‍ය

මෙම මූල්‍ය ප්‍රකාශ සැකසීම් සහ ඉදිරිපත් කිරීම් සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම් දරයි.
ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් කරනු ලැබුවේ,

ශ්‍රීමාල් විජේසේකර මයා — *සභාපති/ප්‍රධිනි*

එස්.එම්.සී.එස් සිරිවර්ධන මයා — *මණ්ඩල සාමාජික*

ජී.ආර්.එස් සේනාරත්න මයා — *මණ්ඩල සාමාජික*

2021 පෙබරවාරි 2 වන දින කොළඹ දිය.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

ආදායම් ප්‍රකාශය

ශ්‍රී ලංකා රුපියල් වලින්

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන්:	2020	2019
ආදායාම	17	**766,835,580**	**535,933,037**
විකුණුම් පිරිවැය		(864,752,760)	(786,607,907)
දළ ලාභය/ (පාඩුව)		**(97,917,181)**	**(250,674,870)**
වෙනත් ආදායම්	18	158,478,281	106,974,735
පරිපාලන වියදම්	19	(180,887,340)	(165,473,851)
මෙහෙයුම් ලාභය/ (පාඩුව)		**(120,326,240)**	**(309,173,987)**
මූල්‍ය වියදම්	20	(29,300,841)	(20,710,404)
කාලය සඳහා ලාභය/ (පාඩුව)		**(149,627,081)**	**(329,884,391)**

පිටු අංක5 සිට 19 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ .

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

ස්කන්ධ වෙනස්වීම පිලිබඳ ප්‍රකාශය ශ්‍රී ලංකා රුපියල්

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	ප්‍රාග්ධනය රු.	ඉඩම් දායකත්වය රු.	සමුච්චිත ලාභය/ (පාඩුව) රු.	එකතුව රු.
2019 ජනවාරි 01 වන දිනට ශේෂය	3,437,250,925	2,220,601,926	(1,067,273,122)	4,590,579,729
භාණ්ඩාගාරයෙන් ලද ප්‍රදාන	222,000,000	-	-	222,000,000
වසර සඳහා පාඩුව	-	-	(329,884,391)	(329,884,391)
පූර්ව වසර ගැලපුම් (සටහන 25)	-	-	(173,691,530)	(173,691,530)
2019 දෙසැම්බර් 31 වන දිනට ශේෂය	**3,659,250,925**	**2,220,601,926**	**(1,570,849,043)**	**4,309,003,808**
2020 ජනවාරි 01 වන දිනට ශේෂය	3,659,250,925	2,220,601,926	(1,570,849,043)	4,309,003,808
භාණ්ඩාගාරයෙන් ලද ප්‍රදාන	-	-	-	-
වසර සඳහා පාඩුව	-	-	(149,627,081)	(149,627,081)
පූර්ව වසර ගැලපුම් (සටහන 25)	-	-	(4,886,661)	(4,886,661)
2020 දෙසැම්බර් 31 වන දිනට ශේෂය	**3,659,250,925**	**2,220,601,926**	**(1,725,362,785)**	**4,154,490,066**

පිටු අංක 5 සිට 19 දක්වා ඇති ගිනුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා රුපියල් වලින්: 2020 දෙසැම්බර් 31න් අවසන් වන වසර සඳහා	සටහන්:	2020	2019
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්			
බදුකරණයට පෙර ශුද්ධ ලාභය/ (පාඩුව)		**(149,627,081)**	**(329,884,391)**
ගැලපීම්;			
ජීව විද්‍යාත්මක වත්කම් ක්ෂය වීම	9.2	4,019,863	3,910,779
වත්කම් ක්ෂය වීම	8	8,667,581	8,804,754
මූල්‍ය වියදම්	20	27,989,617	19,110,404
පාරිතෝෂික දීමනා	15	30,226,545	33,828,923
පෙර වසර ගැලපීම්	25	(4,886,661)	(173,691,530)
කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර ලාභය		(83,610,136)	**(437,921,061)**
කාරක ප්‍රාග්ධනයේ වෙනස්කම්			
බඩු තොගවල (වැඩිවීම)/ අඩුවීම		(12,092,894)	(14,261,485)
වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑවල (වැඩිවීම)/අඩුවීම		(8,815,799)	(59,658,502)
ජංගම වගකීම්වල (වැඩිවීම)/අඩුවීම		172,413,700	286,080,832
මෙහෙයුම්වලින් උත්පාදනය කරන මුදල්		**151,505,007**	**212,160,845**
වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු දෑ			
ගෙවූ පාරිතෝෂික		(7,145,102)	(14,384,929)
ගෙවූ මූල්‍ය පිරිවැය		(26,389,617)	(19,110,404)
ලැබුණු භාණ්ඩාගාර ප්‍රදාන		-	222,000,000
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් උත්පාදිත ශුද්ධ මුදල් ප්‍රවාහය		**(33,534,719)**	**188,504,667**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය			
දේපළ, පිරියත සහ උපකරණ එක් කරගැනීම්	8	(12,522,619)	(4,990,197)
ජීව විද්‍යාත්මක වත්කම් එක් කරගැනීම	9.2	(27,989,617)	(20,841,044)
ස්ථාවර තැන්පතුවල ආයෝජන		(312,007)	(331,022)
ආයෝජන ක්‍රියාකාරකම් තුළ භාවිත ශුද්ධ මුදල්		**(40,824,243)**	**(26,162,263)**
මුදල් හා මුදල් සමාන දෑ හි වැඩිවීම් /(අඩුවීම්)		(6,464,092)	**(63,417,812)**
මුදල් හා මුදල් සමාන දෑ වල සංචලනය			
කාලපරිච්ඡේදය ආරම්භයේදී		(49,854,694)	13,563,118
වසර සඳහා වැඩිවීම/(අඩුවීම)		(6,464,092)	(63,417,812)
වසර අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ		**(56,318,786)**	**(49,854,694)**

1. ආයතනික තොරතුරු

සාමන්‍ය

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව (සංස්ථාව) යනු 1958 අංක 4 දරණ පනත යටතේ 1958 දී සංස්ථාපිත කර ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති රාජ්‍ය ආයතනයකි. එය කොළඹ 12 මීරානියා වීදියේ අංක 21 දරන ස්ථානයෙහි පිහිටා ඇති රජයේ සංස්ථාවකි.

සංස්ථාව විසින් දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මාස දොළහක කාලය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කරන අතර මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බලාත්මක කරයි.

ප්‍රධාන ක්‍රියාකාරකම්

තේ නිෂ්පාදනය කිරීම හා තේ වෙන්දේසි කිරීම මඟින් සකස් කරන ලද තේ අලෙවි කිරීම, රබර් කිරි හා සුළු හෝ අපනයන භෝග (කරාබු නැටි, ගම්මිරිස්, එනසාල්, කුරුඳු යනාදිය) විකිණීම සහ සංස්ථාව මඟින් වාණිජමය දැව වගා කිරීම හා අලෙවි කිරීම.

2. සකස් කිරීමේ පදනම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති සහ ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලින් සමන්විත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇත.

සාධාරණ වටිනාකමට අගයන ලද ජීව විද්‍යාත්මක වත්කම් හැර, වෙනත් ඓතිහාසික පිරිවැයක පදනමක් මත මූල්‍ය මෙම ප්‍රකාශන සකස් කර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත.

3. සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

3.1.1 සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සංස්ථාව විසින් පහත සඳහන් සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගනී.

3.1.2 දේපල පිරියත හා උපකරණ

සමුච්චිත ක්ෂය කිරීම් හා සමුච්චිත හායන පාඩු ඇත්නම්, එවැනි හායන පාඩුවල ශුද්ධ පිරිවැයට දේපල, පිරියත හා උපකරණ දක්වා ඇත. එවැනි පිරිවැයක් තුළ දේපල, පිරියත හා උපකරණවල ආංශික කොටස් ආදේශ කිරීමේ පිරිවැය සහ හඳුනාගැනීමේ පරිපාටිය සපුරාලන්නේ නම්, දිගුකාලීන ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ණය ගැනීමේ පිරිවැය ඇතුළත් වේ. දේපල, පිරියත හා උපකරණවල සුවිශේෂී කොටස් අන්තරයක් සහිතව ආදේශ කිරීමට අවශ්‍ය වන්නේ නම්, සංස්ථාව එසේ ආදේශ කරන ලද කොටස හඳුනාගැනීමෙන් තොරව බැහැර කරන අතර, ඊට අදාළ ප්‍රයෝජ්‍ය ආයුකාලයක් සහිත, ක්‍රමක්ෂය කළ හැකි නව කොටසක් හඳුනාගැනීමට ලක් කරයි. මේ හා සමානව, යම් ප්‍රධාන පෙලේ විමර්ශනය කිරීමක් සිදුකළහොත්, හඳුනාගැනීමේ පරිපාටිය සපුරාලන්නේ නම්, එහි පිරිවැය, ආදේශකයක් ලෙස එම පිරියත හා උපකරණයෙහි ඉදිරියට ගෙන යනු ලබන වටිනාකම තුළ හඳුනාගැනේ. අනෙකුත් සියලුම අලුත්වැඩියා කිරීමේ හා නඩත්තු කිරීමේ පිරිවැය හටගත් පිරිවැය ලෙස මූල්‍ය ප්‍රකාශ තුළ හඳුනාගැනේ.

3.1.3 ක්ෂය කිරීම

මිලදීගත් දිනයේ සිට බැහැර කරන දිනය දක්වා වර්ෂය තුළ අත්පත්කරගත් හා බැහැර කරන ලද දේපල, පිරියත හා උපකරණ මත ක්ෂය කිරීම් සිදු කෙරේ.

ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයුකාලය සහ දේපල, පිරියත හා උපකරණවල ක්ෂය කිරීමේ අනුපාත පහත සඳහන් පරිදි වේ:

අයිතමය	ප්‍රයෝජ්‍ය ආයුකාලය	අනුපාතය
ගොඩනැගිලි	අවුරුදු 20	5%
මෝටර් රථ	අවුරුදු 4	25%
ගෘහභාණ්ඩ හා සවිකිරීම්	අවුරුදු 8	12.5%
කාර්යාල උපකරණ	අවුරුදු 8	12.5%
යන්ත්‍ර	අවුරුදු 8	12.5%
පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර	අවුරුදු 3	33.33%

3.1.4 ජීවවිද්‍යාත්මක වත්කම්

ජීවවිද්‍යාත්මක වත්කම් යම් ජීවී සත්ත්වයෙකුට හෝ පැළෑටියකට අදාළ වේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 41ට අනුව, ජීවවිද්‍යාත්මක වත්කම් සම්බන්ධයෙන් යම් පොදු ලක්ෂණ කිහිපයක් ඇත. එනම් (අ) වෙනස් වීමට ඇති හැකියාව (ජීවවිද්‍යාත්මක ලෙස පරිවර්තනය වීමේ හැකියාව) , (ආ) වෙනස්වීම කළමනාකරණය කරගැනීම (එම ක්‍රියාවලිය සිදුවීම සඳහා අවශ්‍ය තත්ත්වයන් වැඩිදියුණුකිරීමෙන් ජීවවිද්‍යාත්මක පරිවර්තනය වීම සඳහා කළමනාකරණය මගින් පහසුකම් සලසයි. එවැනි කළමනාකරණයක් මගින් කෘෂිකාර්මික කටයුතු වෙනත් කටයුතුවලින් වෙන් කර දක්වයි. උදාහරණයක් ලෙස, කළමනාකරණය නොකරන ලද මූලාශ්‍ර මගින් අස්වැන්න ලබාගැනීම) සහ (ඇ) වෙනස්වීම ගණනය කිරීම (ජීවවිද්‍යාත්මක ලෙස පරිවර්තනය වීමේ හෝ එමගින් ඇති වූ වෙනස දෛනික කළමනාකරණ කාර්යයක් ලෙස ගණනය කර, අධීක්ෂණය කෙරේ.)

ජීවවිද්‍යාත්මක වත්කම්, ස්වයං ප්‍රතිජනන ජීවවිද්‍යාත්මක වත්කම් (bearer biological assets) සහ පරිභෝජනය කළ හැකි ජීවවිද්‍යාත්මක වත්කම් (consumable biological assets) ලෙස දෙවැදෑරුම් වේ.

3.1.4.1 ස්වයං ප්‍රතිජනන ජීවවිද්‍යාත්මක වත්කම් (Bearer Biological Assets)

පරිභෝජනය කළ හැකි ජීවවිද්‍යාත්මක වත්කම් හැර අන් වත්කම් ස්වයං ප්‍රතිජනන ජීවවිද්‍යාත්මක වත්කම් වන අතර, සංස්ථාවට අදාළව තේ පඳුරු, රබර් ගස් හා ඕනෑම ක්ෂේත්‍ර වගාවක් වැනි ප්‍රධාන පෙළේ වැවිලි කටයුත්තක් ඊට අයත් විය හැකිය. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය මගින් ලබා දී ඇති විකල්පය පරිදි යම් සමුච්චිත ක්ෂය කිරීමක් හා යම් සමුච්චිත හායන පාඩුවක් අඩු කර ලැබෙන පිරිවැයට මෙහි අගය ඉදිරියට ගෙන යනු ලැබේ.

ස්වයං ප්‍රතිජනන ජීවවිද්‍යාත්මක වත්කම්හි ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයුකාලය පහත සඳහන් පරිදි වේ:

පොල්	අවුරුදු 25	කොකෝවා	අවුරුදු 20
ගම්මිරිස්	අවුරුදු 15	කුරුඳු	අවුරුදු 25
රබර්	අවුරුදු 35	සාදික්කා	අවුරුදු 30
කරාබුනැටි	අවුරුදු 50	නැවත වන වගාකිරීම	අවුරුදු 25
කෝපි	අවුරුදු 25	ඉඟුරු	එක් වසරයි
පුවක්	අවුරුදු 40	තේ	අවුරුදු 100

3.1.4.2 පරිභෝජනය කළ හැකි ජීව විද්‍යාත්මක වත්කම්

කෘෂිකාර්මික නිෂ්පාදිතයක් ලෙස අස්වැන්න ලබාගත හැකි හෝ ජීවවිද්‍යාත්මක වත්කම් ලෙස අලෙවි කළ හැකි වත්කම් පරිභෝජනය කළ හැකි ජීවවිද්‍යාත්මක වත්කම් වන අතර, ඊට දැව ඇතුළත් වේ. කෘෂිකාර්මික නිෂ්පාදිත වෙළඳපොලය රැගෙන යාම සඳහා අවශ්‍ය පිරිවැය සහ ඇස්තමේන්තුගත අලෙවි පිරිවැය අඩු කර ලැබෙන සාධාරණ වටිනාකමට මෙකී නිෂ්පාදිත අගය කෙරේ. ඇගයීම මත යම් ලාභයක් හෝ පාඩුවක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය යටතේ හඳුනාගැනේ.

3.1.4.3කල් තබන ලද වත්කම්

කල් තබන ලද වත්කම් වාර්ෂිකව 10%ක අනුපාතයට ක්‍රමක්ෂය කෙරේ.

3.1.5 ආයෝජන දේපල

ප්‍රාග්ධන ඇගයීම සඳහා සහ/හෝ කුලී ආදායම් ඉපැයීම සඳහා තබාගත් දේපල ආයෝජන දේපල තුළ අන්තර්ගත වේ. අදාළ ගණුදෙණු පිරිවැය හා ඉන් අනතුරුව යම් දේපලකට එකතු කිරීම, යම් දේපලක් ආදේශ කිරීම හෝ අලුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් හටගත් පිරිවැය ඇතුලු පිරිවැයට මෙම දේපල මූලික වශයෙන් ගණනය කෙරේ. ඉන්පසුව සිදු කෙරෙන ගණනය කිරීම් ද සමුච්චිත ක්‍රමක්ෂය කිරීමෙන් අඩු කර ලැබෙන පිරිවැයට සිදු කෙරේ.

3.1.6 දැනට සිදු කරගෙන යන ප්‍රාග්ධන කාර්යයන් (Capital work in progress)

වර්ෂය තුළ හට ගත්, එහෙත් ශේෂ පත්‍රය සකස් කරන දිනට ප්‍රාග්ධනීයකරණය නොකරන ලද ප්‍රාග්ධන වියදම්, දැනට සිදු කෙරෙන ප්‍රාග්ධන කාර්යයන් ලෙස දක්වා ඇති අතර, වර්ෂය තුළ ප්‍රාග්ධනීයකරණය කරන ලද සහ භාවිත කළ ප්‍රාග්ධන වත්කම්, දේපල, පිරියත හා උපකරණවලට මාරු කර ඇත.

3.1.7 කල්බදු පහසුකම්

යම් පහසුකම් සැලසීමක් කල්බදු පහසුකමක් හෝ ඊට කල්බදු පහසුකමක් ඇතුළත් වන්නේද යන්න තීරණය කිරීම, එකී පහසුකමේ අන්තර්ගතය මත පදනම් වන අතර, එම පහසුකම් සැලසීම සපුරාලීම, යම් නිශ්චිත වත්කමක් හෝ වත්කම් භාවිත කිරීම මත සහ එමගින් වත්කම භාවිත කිරීමට අයිතිය ලබාදෙන්නේද යන්න මත රඳා පවතී.

මූල්‍ය කල්බදු පහසුකම්

වත්කම්හි අයිතියට ආනුශංගික වන, එහෙත් අත්‍යවශ්‍යයෙන් නීතිමය හිමිකම් නොවන සියලුම අවදානම් හා ප්‍රතිලාභ සැලකිය යුතු අන්දමින් ප්‍රතිපාර්ශ්වයන් වෙත මාරු කරන ගිවිසුම්, මූල්‍ය කල්බදු පහසුකම් ලෙස වර්ගීකරණය කෙරේ.සංස්ථාව මූල්‍ය කල්බදු පහසුකම් යටතේ කල්බදු පහසුකම ලබාගන්නා බවට පත්වන විට, කල්බදු පහසුකමට යටත් වත්කම් ප්‍රාග්ධනීයකරණය කර, 'දේපල, පිරියත හා උපකරණ' තුළ ඇතුළත් කරන අතර, කල්බදු පහසුකම් සපයන්නා හට ඇති කෙරෙන වගකීමේ බැඳීම 'කල්බදු ණයහිමිකරුවන්' තුළ ඇතුළත් කෙරේ.

වත්කමේ සාධාරණ වටිනාකමට හෝ වටිනාකම අඩු මට්ටමක පවතී නම්, අවම කල්බදු ගෙවීම්වල වත්මන් වටිනාකමට මූල්‍ය කල්බදු පහසුකමක් හා ඊට අදාළ වගකීම මූලික වශයෙන් හඳුනාගැනේ. වගකීමේ ශේෂය මත ස්ථිර පොලී අනුපාතයක් ලබා දිය හැකි පරිදි කල්බදු පහසුකම තුළ සැඟවුණු පොලී අනුපාතය මත පදනම්ව කල්බදු කාලසීමාව තුළ 'ශුද්ධ පොලී ආදායම' තුළ ගෙවිය යුතු මූල්‍ය ගාස්තු හඳුනාගැනේ.

මෙහෙයුම් කල්බදු

අනෙකුත් සියලුම කල්බදු පහසුකම් මෙහෙයුම් කල්බදු පහසුකම් ලෙස වර්ගීකරණය කෙරේ. සංස්ථාව කල්බදු පහසුකම ලබාදෙන්නා බවට පත්වන විට, කල්බදු දී ඇති වත්කම් ශේෂ පත්‍රය තුළ හඳුනා නොගැනේ. කල්බදු කාලසීමාවන් තුළ මෙහෙයුම් කල්බදු යටතේ ගෙවිය යුතු හා ලැබිය යුතු කුලී ගාස්තු සෘජු රේඛීය පදනම මත ගිණුම්ගත කෙරෙන අතර, පිළිවෙලින් **'**පරිපාලන වියදම්**'** සහ **'**වෙනත් මෙහෙයුම් ආදායම්**'**හි ඇතුළත් කෙරේ.

3.2.1 තොග/භාණ්ඩ ලේඛන

පෙර පිවිසි පෙර නිකුත්(First in first out) පදනම මත අගයන ලද, යල්පැන ඇති හා සෙමින් ක්‍රියාකරන අයිතමයන් සඳහා දීමනා ලබාදීමෙන් අනතුරුව, පිරිවැයට හා නිෂ්කාශනය කළ හැකි ශුද්ධ උපලබ්දි අගයට (Net Realizable Value) හෝ මින් කවර හෝ අඩු අගයකට භාණ්ඩ ලේඛන හඳුනාගැනේ.

භාණ්ඩ ලේඛන ගණනය කිරීම

3.2.2 භාණ්ඩ ලේඛනවල පිරිවැය

අමුද්‍රව්‍ය

යම් ආනුශංගික වියදමක් ද සහිතව මිලදීගැනීම්වල පිරිවැය.

දැනට සිදු කරගෙන යන කාර්යයන්

අමුද්‍රව්‍ය පිරිවැය හා විචලනය වන මුළු නිෂ්පාදන වියදම්.

නිම කර ඇති භාණ්ඩ

අමුද්‍රව්‍ය පිරිවැය හා විචලනය වන මුළු නිෂ්පාදන වියදම්.

3.2.3 මුදල් හා මුදල් සමානයන්

මුදල් හා මුදල් සමානයන් තුළ අතේ හා බැංකුවේ ඇති මුදල්, ස්ථාවර තැන්පතු ආයෝජන, අතිශයින් ඉහළ ද්‍රවශීලතාවකින් යුතු, මාස හයකින් හෝ ඊට අඩු කාලයකින් නියම ලෙස කල් පිරෙන වෙනත් කෙටි කාලීන ආයෝජන ඇතුළත් වේ. මුදල් හා මුදල් සමායනයන් ජංගම වගකීම් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පෙන්නුම්

කෙරෙන අතර බැංකු අයිරාව ජංගම වගකීමක් ලෙස සටහන් කෙරේ. ශේෂ පත්‍රයේ ජංගම වගකීම්හි ණය ගැනීම් තුළ බැංකු අයිරා අගයන් පෙන්නුම් කෙරේ.

3.2.4 පර්යේෂණ පිරිවැය

නව විද්‍යාත්මක හෝ තාක්ෂණික දැනුම හා අවබෝධය ලබාගැනීමේ අරමුණින් සිදු කරන පර්යේෂණ කටයුතු සඳහා දරණ වියදම්, ඒවා හටගැනීමේදී ලාභාලාභ තුළ හඳුනාගැනේ.

4. වගකීම් හා ප්‍රතිපාදන

4.1 විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම්

4.1.1 අර්ථ නිරූපිත ප්‍රතිලාභ සැලැස්ම - විශ්‍රාමික පාරිතෝෂික

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනතට අනුව, සංස්ථාව පාරිතෝෂික ගෙවීමට බැඳී සිටියි. සංස්ථාව සමඟ අඛණ්ඩ වසර පහක කාලසීමාවක් සම්පූර්ණ කිරීම මත පමණක් යම් සේවකයෙකු හට පාරිතෝෂික පිළිබඳ වගකීමක් ඇති කෙරේ. මෙම වගකීම සපුරාලීම පිණිස, ශේෂ පත්‍රය තුළ යම් ප්‍රතිපාදනයක් ඉදිරියට ගෙන යයි. වර්ෂය ආරම්භයේ ඉදිරියට ගෙන ගිය ප්‍රතිපාදන හා වර්ෂය අවසානයේ ඉදිරියට ගෙන ගිය ප්‍රතිපාදනය අතර වෙනස ආදායම් ප්‍රකාශය තුළ ලාභයට එරෙහිව කපා හරිනු ලැබේ.

මෙම වගකීම සඳහා බාහිරව අරමුදල් සපයනු නොලැබේ. මෙම අයිතමය ශේෂ පත්‍රයේ ජංගම නොවන වගකීම් යටතේ වර්ග කෙරේ.

4.1.2 අර්ථ නිරූපිත දායකත්ව සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල

සංස්ථාව මගින් සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල සඳහා දායකත්ව මුදල් සපයනු ලැබේ. අදාළ රෙගුලාසිය හා සමගාමීව, අදාළ දායකත්ව අරමුදල් මගින් මෙම දායකත්ව මුදල් ආවරණය කෙරේ. සේවකයින් ආවරණය කරනු ලබන සැලසුම් සඳහා දායකත්වය ලබාදීමේ වගකීම ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස හඳුනාගැනේ.

සේවක අර්ථසාධක අරමුදල, වතු සේවක අර්ථසාධක අරමුදල, ලංකා වැවිලිකරුවන්ගේ අර්ථසාධක සංගමය

සංස්ථාව හා සේවකයින් විසින් මූලික වැටුප මත ඔවුන් තෝරාගත් ක්‍රමයක් මත සේවක අර්ථසාධක අරමුදල, වතු සේවක අර්ථසාධක අරමුදල සහ ලංකා වැවිලිකරුවන්ගේ අර්ථසාධක සංගමයට 12%ක් සංස්ථාවෙන්ද, 10%ක් සේවකයින්ගෙන්ද දායක මුදලක් ලබා දෙයි.

සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල

සංස්ථාව විසින් මූලික වැටුප මත සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලට 3%ක දායක මුදලක් ලබා දෙයි.

5. ආදායම් ප්‍රකාශය

මෙම ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ කාර්යය වෙනුවෙන්, වියදම් ක්‍රමවේදය මගින් සාධාරණ ලෙස සංස්ථාවේ කාර්යාසාධනයේ අංග නිරූපණය වන හෙයින්, එකී ක්‍රමවේදයේ කාර්යයන් සඳහා අනුගත වේ.

5.1.1 ආදායම් හඳුනාගැනීම

සංස්ථාව වෙත ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමේ හැකියාව සහිත මට්ටම දක්වා ආදායම් හඳුනාගැනෙන අතර, ගෙවීම සිදු කෙරෙන අවස්ථාව නොසලකා හරිමින් සාධාරණ ලෙස ආදායම් ගණනය කළ හැකිය. ගිවිසුම්ගත ආකාරයෙන් අර්ථනිරූපිත ගෙවීම් නියමයන් සැලකිල්ලට ගනිමින්, ලද හෝ ලැබිය යුතු මුදලේ සාධාරණ වටිනාකමට ආදායම් ගණනය කෙරේ.

ආදායම් හඳුනාගැනීමට පෙර පහත සඳහන් නිශ්චිත හඳුනාගැනීමේ පරිපාටිය ද සපුරාලිය යුතුය:

භාණ්ඩ අලෙවි කිරීම

සාමාන්‍යයෙන් භාණ්ඩ බෙදාහැරීම මත භාණ්ඩවල අයිතියේ සුවිශේෂී අවදානම් හා ප්‍රතිලාභ ගැණුම්කරු වෙත විතැන් වන විටදී, භාණ්ඩ අලෙවියෙන් ලද ආදායම් හඳුනාගැනේ.

සේවා සැපයීම

සේවා සපයන ලද හෝ ඉටු කරන ලද ගිණුම්කරණ කාලසීමාවේ සපයනු ලබන සේවාවන්ගෙන් ලද ආදායම් හඳුනා ගැනේ.

වෙනත් ආදායම්

වෙනත් ආදායම් උපචිත පදනමින් හඳුනාගැනේ. මීට ප්‍රධාන වශයෙන් ආදායම් කළමනාකරණය කිරීම, ලියාපදිංචි ගාස්තු, ගස් සම්බන්ධ ටෙන්ඩර්වලින් ලද ආදායම් හා කල්බදු කුලී ආදායම් අයත් වේ.

5.1.2 වියදම්

ව්‍යාපාරය මෙහෙයවීමේදී හටගන්නා සියලුම වියදම් වර්ෂය සඳහා ලාභයට අයත්වන ආදායම් තුළ අන්තර්ගත කෙරේ. අලුත්වැඩියා කිරීම් හා නවීකරණය කිරීම්, එම වියදම් හටගන්නා වර්ෂයේ ලාභාලාභ තුළ අන්තර්ගත කෙරේ.

5.1.3 මූල්‍ය වියදම්

යම් වත්කමක් අපේක්ෂිත ලෙස භාවිත කිරීමට හෝ අලෙවි කිරීමට හෝ සූදානම් කරන තෙක් සැලකිය යුතු කාලසීමාවක් අත්‍යවශ්‍යයෙන්ම වැය වන එකී වත්කම අත්පත්කරගැනීමට, ඉදි කිරීමට හෝ නිෂ්පාදනය කිරීමට සෘජුවම දායක වන ණයට ගැනීමේ පිරිවැය, අදාළ වත්කම්හි පිරිවැයේ කොටසක් ලෙස ප්‍රාග්ධනීයකරණය කෙරේ. අනෙකුත් සියලුම ණයගැනීමේ පිරිවැය එම පිරිවැය හටගන්නා කාලසීමාව තුළ වියදම් සේ සැලකේ. සංස්ථාවේ මූල්‍ය වියදම් අයිරාව මත පොලිය, මුදල් මත කොමිස් ගාස්තු, ණය පොලී (බැංකු හා වෙනත්) හා තැරැව්කරුවන්ගේ පොලී යනාදියෙන් සමන්විත වේ.

6. මූල්‍ය උපකරණ - මූලික හඳුනාගැනීම සහ පසුකාලීන ගණනය කිරීම්

6.1 මූල්‍ය වත්කම්

6.1.1 මූලික හඳුනාගැනීම සහ ගණනය කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 39හි විෂය පථය තුළ පවතින මූල්‍ය වත්කම්, යෝග්‍ය පරිදි ලාභ හෝ පාඩු, ණය හා ලැබිය යුතු, කල් පිරීමට තබා ඇති ආයෝජන සහ විකිණීමට ඇති මූල්‍ය වත්කම් මගින් සාධාරණ වටිනාකමට මූල්‍ය

වත්කම් ලෙස වර්ගීකරණය කර, මූලික හඳුනාගැනීමේදී සිය මූල්‍ය වත්කම් වර්ගීකරණය කිරීම පිළිබඳව නිර්ණය කරයි.

සියලුම මූල්‍ය වත්කම් මූලිකවම සාධාරණ වටිනාකමට හඳුනාගන්නා අතර, ඊට අතිරේකව, ලාභ හෝ පාඩු මගින් සාධාරණ වටිනාකමට නොවන වත්කම් සම්බන්ධයෙන් සෘජුවම ගණුදෙණු පිරිවැයට අදාළව හඳුනාගැනේ.

සංස්ථාවේ මූල්‍ය වත්කම්වලට මුදල් හා කෙටිකාලීන ස්ථාවර තැන්පතු, වෙළඳ සහ වෙනත් ලැබිය යුතු හා අනෙකුත් තැන්පතු ඇතුළත් වේ. ඉහත මූල්‍ය වත්කම් පහත සඳහන් ජංගම වත්කම් යටතේ පෙන්නුම් කරයි.

6.1.2 පසුකාලීන ගණනය කිරීම්

පසුකාලීනව මූල්‍ය වත්කම් ගණනය කිරීම පහත සඳහන් ඒවායේ වර්ගීකරණය මත රඳා පවතී.

6.1.2.1 ලාභ හෝ පාඩු මගින් සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම්

ලාභ හෝ පාඩු මගින් සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කම් තුළ අලෙවිය සඳහා තබා ඇති මූල්‍ය වත්කම් හා ලාභ හෝ පාඩු මගින් සාධාරණ වටිනාකමට මූලික වශයෙන් හඳුනාගැනීම මත නම් කරන ලද මූල්‍ය වත්කම් ඇතුළත් වේ. මූල්‍ය වත්කම් අලෙවි කිරීමේ හෝ නුදුරු කාලයකදී නැවත මිලදීගැනීමේ අරමුණින් අත්පත්කරගන්නේ නම්, එකී වත්කම් අලෙවිය සඳහා තබාගන්නා ලද වත්කම් සේ වර්ගීකරණය කෙරේ. 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ සංස්ථාව සතුව ලාභ හෝ පාඩු මගින් සාධාරණ වටිනාකමට ලද කිසිදු මූල්‍ය වත්කමක් නොවීය.

6.1.2.2 ණය හා ලැබිය යුතු

ණය හා ලැබිය යුතු යනු සක්‍රීය වෙළඳපොලක් තුළ සඳහන් නොකරන ලද ස්ථාවර හෝ නිර්ණය කළ හැකි ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්ය. මූලික ගණනය කිරීමෙන් අනතුරුව, පසුකාලීනව එවැනි මූල්‍ය වත්කම්, භායනය කිරීම් අඩු කර ඵලදායී පොලී අනුපාත ක්‍රමවේදය (EIR) භාවිත කරමින් ක්‍රමක්ෂය කරන ලද පිරිවැයට ගණනය කෙරේ. යම් වට්ටමක් හෝ අත්පත්කරගැනීමක් මත රක්ෂණ වාරිකයක් හා EIRහි වැදගත් අංගයක් අංක 39හි විෂය පථය තුළ පවතින මූල්‍ය වගකීම් වර්ගීකරණය කෙරේ. සංස්ථාව විසින් මූලික හඳුනාගැනීම් වලදී සිය වගකීම් වර්ගීකරණය පිළිබඳව තීරණයකරනු ලබයි.

සියලුම මූල්‍ය වගකීම් මූලික වශයෙන් සාධාරණ වටිනාකමට හඳුනාගනු ලැබුවද, ණය හා ණයගැනීම් සම්බන්ධයෙන් ක්‍රමක්ෂය පිරිවැය ඔස්සේ ඉදිරියට ගෙනයනු ලබයි. මීට සෘජුවම අදාළ වන ගනුදෙනු පිරිවැය ඇතුළත් වේ.සංස්ථාවේ මූල්‍ය වගකීම් තුළ වෙළඳ හා වෙනත් ගෙවිය යුතු බැංකු අයිරා ඇතුළත් වේ.

6.1.2.3 කල් පිරීමට තබා ඇති ආයෝජන

ස්ථාවර හෝ නිර්ණය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් හා ස්ථාවර කල්පිරීම් කල් පිරෙන තෙක් රඳවාගැනීමේ සද්භාවය සහ හැකියාව සංස්ථාව සතු වන විට, එවැනි වත්කම් කල් පිරීමට තබා ඇති මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කෙරේ. මූලික ගණනය කිරීමෙන් අනතුරුව, කල් පිරීමට තබා ඇති ආයෝජන, භායනය අඩු කර, ඵලදායී පොලී ක්‍රමවේදය අනුගමනය කරමින් ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලැබේ. අත්පත්කරගැනීමක් මත යම් වට්ටමක් හෝ රක්ෂණ වාරිකයක් සහ EIRහි වැදගත් අංගයක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය ගණනය කෙරේ. EIR ක්‍රමක්ෂය කිරීම ආදායම් ප්‍රකාශයේ සඳහන් මූල්‍ය ආදායම් තුළ ඇතුළත් කෙරේ. භායනයෙන් ජනනය වන පාඩු ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය ලෙස හඳුනාගැනේ. 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ සංස්ථාව සතුව කල් පිරීමට තබා ඇති කිසිදු ආයෝජනයක් නොමැත.

6.1.2.4 විකිණීමට ඇති මූල්‍ය ආයෝජන

විකිණීමට ඇති මූල්‍ය ආයෝජන යන්නට ස්කන්ධ හා ණය ඇපකර යනාදිය ඇතුළත් වේ. ස්ක්න්ධ ආයෝජන විකිණීමට ඇති සේ වර්ගීකරණය කරනුයේ, අලෙවිය සඳහා ඇති හෝ ලාභ හෝ පාඩු මගින් සාධාරණ වටිනාකම සඳහා යනුවෙන් වර්ගීකරණය කර නොමැති හෙයිනි. මෙම කාණ්ඩයේ ණය ඇපකර යනු අවිනිශ්චිත කාලසීමාවක් සඳහා තබා ගැනීමට අපේක්ෂා කරන, ද්‍රවශීලතා අවශ්‍යතාවලට සහ වෙළඳපොල තත්ත්වයන්හි වෙනස්කම්වලට ප්‍රතිචාරී ලෙස අලෙවි කළ හැකි ඇපකර වේ.

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ සංස්ථාව සතුව විකිණීමට ඇති කිසිදු මූල්‍ය ආයෝජනයක් නොමැත.

6.1.2.5 හඳුනාගැනීමෙන් බැහැර කිරීම

යම් මූල්‍ය වත්කමක් (හෝ අදාළ වන පරිදි, මූල්‍ය වත්කමක කොටසක් හෝ ඒ හා සමාන මූල්‍ය වත්කම් කාණ්ඩයක කොටසක්) හඳුනාගැනීමෙන් තොරව බැහැර කරනුයේ,

i). එම වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය කල් ඉකුත් වූ විට;

ii). සංස්ථාව මගින් එම වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීමේ සිය අයිතිය පවරාදුන් විට හා ‘pass-through’ ක්‍රමය යටතේ යම් තෙවන පාර්ශ්වයක් වෙත කිසිදු ආකාරයක ප්‍රමාදයකින් තොරව ලද මුදල් ප්‍රවාහ ගෙවීමට යම් වගකීමක් භාර ගත් විට; සහ එමෙන්ම

(අ) සංස්ථාව විසින් සැලකිය යුතු ලෙස වත්කමේ සියලුම අවදානම් සහ ප්‍රතිලාභ පවරා දී ඇති විට; හෝ

(ආ) සංස්ථාව විසින් වත්කමේ සියලුම අවදානම් හා ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස පවරා දී හෝ රඳවා ගෙන නොමැති නමුත්, වත්කමේ පාලනය පවරා දී ඇති විට.

6.1.2.6 මූල්‍ය වත්කම් හායනය වීම

මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක් හායනය වී ඇති බවට යම් වාස්තවික සාක්ෂියක් පවතීද යන්න සංස්ථාව විසින් සෑම වාර්තා කිරීමේ දිනයකදීම අගයනු ලබයි. මූලික හඳුනාගැනීමෙන් අනතුරුව සිදුව ඇති යම් සිද්ධියක් හෝ සිද්ධි කිහිපයක ප්‍රතිඵලයක් ලෙස හායනය සිදු ව ඇති බවට වාස්තවික සාක්ෂි ඇත්නම් හා සාධාරණ ලෙස ඇස්තමේන්තු කළ හැකි එම මූල්‍ය වත්කමේ හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයේ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ මත එම පාඩු සිදු කරන ලද සිදුවීම මගින් බලපෑමක් සිදු කර ඇති බවට වාස්තවික සාක්ෂි ඇත්නම් පමණක් එකී මූල්‍ය වත්කම හෝ මූල්‍ය වත්කම් කාණ්ඩය හායනය වී ඇතැයි සැලකිය යුතුය.

යම් ණයගැතියන් හෝ ණයගැතියන් කාණ්ඩයකට සුවිශේෂී මූල්‍ය දුෂ්කරතාවකට මුහුණ දෙමින් සිටින බව, පොලී හෝ ප්‍රධාන ගෙවීම් වංචා කිරීම හෝ පැහැර හැරීම, ඔවුන් බුන්වත්භාවයට පත්වන බව හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානය කිරීමකට සූදානම් වන බව සහ වංචාවන් සමඟ සහසම්බන්ධ වන ගෙවුම් නිහ හෝ ආර්ථික තත්ත්වයන්හි වෙනස්කම් වැනි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ තුළ ගණනය කළ හැකි අඩුවීමක් ඇති බවට නිරීක්ෂණය කළ හැකි දත්ත මගින් පෙන්නුම් කරන විටෙක හායනය වීම පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කළ හැකිය. දැනට සංස්ථාව විසින් ලැබිය යුතු වෙළඳ සඳහා නිශ්චිත ප්‍රතිපාදනයක් හඳුනාගෙන ඇත.

6.1.2.7 ක්‍රමක්ෂය පිරිවැයට ගෙන යන ලද මූල්‍ය වත්කම්

ක්‍රමක්ෂය පිරිවැයට ගෙන යන ලද මූල්‍ය වත්කම් සම්බන්ධයෙන්, සංස්ථාව විසින් පළමුව තනි තනි වශයෙන් වැදගත් හෝ එසේ තනි තනි වශයෙන් සුවිශේෂී නොවන මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් සාමූහික වශයෙන් හායනය වීමක් ඇති බවට වාස්තවික සාක්ෂි පවතින්නේද යන්න අගයනු ලබයි. සුවිශේෂී වන හෝ නොවන යම් තනි තනි වශයෙන් අගයන මූල්‍ය වත්කමක් සම්බන්ධයෙන් හායනය වීමක් පිළිබඳ කිසිදු වාස්තවික සාක්ෂියක් නොමැති බවට සංස්ථාව නිර්ණය කරන්නේ නම්, ඊට සමාන ණය අවදානම් ලක්ෂණ සහිත මූල්‍ය වත්කම් කාණ්ඩයක් තුළ එම වත්කම ඇතුළත් කර, හායනය වීම සම්බන්ධයෙන් සාමූහික ලෙස ඇගයේ. හායනය වීම සම්බන්ධයෙන් තනි තනි වශයෙන් අගයන ලද සහ හායනය වීමක් හඳුනාගත් හෝ එසේ අඛණ්ඩව සිදු වන බව හඳුනාගත් වත්කම් සාමූහික හායන ඇගයුමක් තුළ ඇතුළත් නොකෙරේ.

යම් හායන පාඩුවක් සිදුව ඇති බවට වාස්තවික සාක්ෂි ඇත්නම්, වත්කමේ ඉදිරියට ගෙන යන ශේෂය හා ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවල (දැනට සිදුව නොමැති අනාගතයේ අපේක්ෂා කරන ණය පාඩු හැර) වෙනස ලෙස එම පාඩුවේ ප්‍රමාණය ගණනය කෙරේ. ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන වටිනාකම සඳහා එම මූල්‍ය වත්කමේ මුල් ඵලදායී පොලී අනුපාතයට වට්ටම් ලබා දෙයි.

6.2 මූල්‍ය වගකීම්

මූලික හඳුනාගැනීම හා ගණනය කිරීම

ලාභ හෝ පාඩු මගින් සාධාරණ වටිනාකමට මූල්‍ය වගකීම් හෝ ණය හා ණයගැනීම් හෝ යෝග්‍ය පරිදි ඵලදායී සීමාවක් තුළ සීමාසහිත මූල්‍ය උපකරණ ලෙස හඳුනාගෙන ඇති ව්‍යුත්පන්න ලෙස ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 39හි විෂයපථය තුළ පවතින මූල්‍ය වගකීම් වර්ගීකරණය කෙරේ. සංස්ථාව විසින් මූලික හඳුනාගැනීම්වලදී සිය වගකීම් වර්ගීකරණය පිළිබඳව තීරණය කරනු ලබයි.

සියලුම මූල්‍ය වගකීම් මූලික වශයෙන් සාධාරණ වටිනාකමට හඳුනාගනු ලැබුවද, ණය හා ණයගැනීම් සම්බන්ධයෙන් ක්‍රමක්ෂය පිරිවැය ඔස්සේ ඉදිරියට ගෙන යනු ලබයි. මීට සෘජුවම අදාළ වන ගණුදෙණු පිරිවැය ඇතුළත් වේ. සංස්ථාවේ මූල්‍ය වගකීම් තුළ වෙළඳ හා වෙනත් ගෙවිය යුතු සහ බැංකු අයිරා ඇතුළත් වේ.

පසුකාලීන ගණනය කිරීම්

මූල්‍ය වගකීම් ක්‍රමක්ෂය කරන ලද පිරිවැයට ගණනය කෙරේ.

හඳුනාගැනීමෙන් බැහැර කිරීම

යම් වගකීමක් යටතේ පවතින මූල්‍ය වගකීමක් ඉටු කළ විට හෝ අවලංගු වූ විට හෝ කල් ඉකුත් වූ විට එම වගකීම හඳුනාගැනීමෙන් බැහැර කෙරේ.

7. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් පළමු වරට අදාළ කරගැනීම (SLFRS/LKAS)

2012 ජනවාරි මස 01 දිනට බලාත්මක වන පරිදි ශ්‍රී ලංකා මූල්‍ය ප්‍රමිතිකරණ ප්‍රමිතීන් හා ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වලින් සමන්විත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුකූලව පළමු වරට සංස්ථාව විසින් 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ සකස් කරන ලදී. 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය ඇතුලු සහ ඒ දක්වා කාලසීමාවන් සඳහා සංස්ථාව විසින් මුල් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුකූලව සිය මූල්‍ය ප්‍රකාශ සකස් කරන ලදී.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

මූල්‍ය ප්‍රකාශනවලට සටහන් ශ්‍රී ලංකා රුපියල්

8.දේපළ, පිරියත සහ උපකරණ

ප්‍රධාන කාර්යාලය.	සිත්නක්කර ඉඩම්	ගොඩනැගිලි	උපකරණ	ගෘහ භාණ්ඩ	මෝටර් වාහන	පරිගණක	එකතුව
පිරිවැය හෝ තක්සේරුව							
2020 ජනවාරි 1 දිනට	**4,031,845**	**4,959,427**	**12,048,866**	**5,232,864**	**66,115,401**	**4,420,010**	**96,808,412**
එකතුකිරීම්	-	-	247,300	113,914	-	276,550	637,764
බැහැර කිරීම්							
මාරු කිරීම	-	-	-	-	-	-	-
2020 දෙසැම්බර් 31 දිනට	**4,031,845**	**4,959,427**	**12,296,166**	**5,346,778**	**66,115,401**	**4,696,560**	**97,446,177**
ක්ෂය වීම							
2020 ජනවාරි 1 දිනට	**-**	**4,959,384**	**10,358,506**	**2,604,383**	**66,094,153**	**3,438,162**	**87,454,588**
වර්ෂය සඳහා ක්ෂය ගැලපීම්		-	241,817	442,329	-	619,162	1,303,308
පෙර වසර ගැලපුම්							
බැහැර කිරීම්							
මාරු කිරීම්							
2020 දෙසැම්බර් 31 දිනට	**-**	**4,959,384**	**10,600,323**	**3,046,712**	**66,094,153**	**4,057,324**	**88,757,895**
ශුද්ධ පොත් අගය							
2020 දෙසැම්බර් 31 දිනට	**4,031,845**	**43**	**1,695,843**	**2,300,067**	**21,247**	**639,236**	**8,688,281**

වතු	ඉඩම්	ගොඩනැගිලි	උපකරණ, ගෘහභාණ්ඩ සහ සවිකිරීම්	මෝටර් වාහන	වෙනත් නිහිත වත්කම්	යන්ත්‍ර සූත්‍ර	එකතුව
පිරිවැය හෝ තක්සේරුව							
2020 ජනවාරි 1 දිනට	**645,345,972**	**173,603,294**	**24,782,583**	**80,752,692**	**6,705,259**	**117,017,392**	**1,048,207,192**
එකතුකිරීම්	-	9,186,137	1,031,759	1,666,959	-	-	11,884,855
පෙර වසර ගැලපුම්							
මාරු කිරීම්							
බැහැර කිරීම්							
2020 දෙසැම්බර් 31 දිනට	**645,345,972**	**182,789,431**	**25,814,342**	**82,419,651**	**6,705,259**	**117,017,392**	**1,060,092,046**
ක්ෂයවීම් සහ අපහායන							
2020 ජනවාරි 1 දිනට	**-**	**108,919,463**	**19,125,722**	**70,143,692**	**6,672,972**	**100,366,805**	**305,169,306**
වර්ෂය සඳහා ක්ෂය ගැලපීම්	-	3,926,826	445,410	457,768	-	2,534,269	7,364,273
පෙර වසර ගැලපුම්							
මාරු කිරීම්							
බැහැර කිරීම්							
2020 දෙසැම්බර් 31 දිනට	**-**	**112,846,289**	**19,571,132**	**70,601,460**	**6,672,972**	**102,901,073**	**312,533,579**
ශුද්ධ පොත් අගය							
2020 දෙසැම්බර් 31 දිනට	**645,345,972**	**69,943,142**	**6,243,209**	**11,818,191**	**32,287**	**14,116,319**	**747,558,468**
2020 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලයේ සහ වතුවල ශුද්ධ පොත් අගය (ප්‍රධාන කාර්යාලය සහ වතු එකතුව)	**649,377,816**	**69,943,185**	**7,939,052**	**14,118,258**	**53,534**	**14,755,555**	**756,246,749**

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

9. ජීව විද්‍යාත්මක වත්කම්

9.1 පරිභෝජනීය ජීව විද්‍යාත්මක වත්කම්	31.12.2020 දිනට රු.	31.12.2019 දිනට රු.
දැව	3,314,581,133	3,314,581,133

නකල්ස් සංරක්ෂණ පරාසයට අයත් මෙම දැව ප්‍රදේශවලින් සමහරක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සීමා නිර්ණය කිරීම අවසන් කර නොමැති බැවින් 2020 වර්ෂය තුළ කිසිදු තක්සේරුවක් සිදු කර නොමැත. එසේම තක්සේරුව සඳහා විශාල මුදල් ගලායාමක් අවශ්‍ය වන අතර පවතින දැඩි මුදල් ප්‍රවාහ තත්ත්වය හේතුවෙන් ශ්‍රී.ල.ර.ව.ැ.ස හට මෙම ව්‍යදම් දැරීමට මේ අවස්ථාවේ හැකියාවක් නොමැත. අපි මෙම ජීව විද්‍යාත්මක ක්‍රියාවලිය ආරම්භ කළ අතර මූල්‍යමය වශයෙන් ආධාර කරන ලෙස ඉල්ලා රේඛීය අමාත්‍යාංශයට ලියා ඇත.

9.2 ධාරක ජීව විද්‍යාත්මක වත්කම්

ධාරක ජීව විද්‍යාත්මක වත්කම් සමුච්චිත ක්ෂයවීම් වලට වඩා අඩු ව්‍යදමකින් පවත්වාගෙන යනු ඇත .

	තේ	පොල්	ගම්මිරිස්	රබර්	කෝපි	වෙනත්	ප්‍රතිරෝපණය	එකතුව
පිරිවැය හෝ තක්සේරුව								
2020 ජනවාරි 1 දිනට	**484,999,849**	**3,809,207**	**3,542,092**	**15,270,484**	**1,501,242**	**5,067,379**	**30,313,346**	**544,503,598**
එකතුකිරීම්	21,933,528	-	9,855	-	-	717,380	5,328,855	**27,989,617**
පෙර වසර ගැලපුම්								-
මාරු කිරීම								-
බැහැර කිරීම්								-
2020 දෙසැම්බර් 31 දිනට	**506,933,377**	**3,809,207**	**3,551,947**	**15,270,484**	**1,501,242**	**5,784,759**	**35,642,201**	**572,493,216**
								-
ක්ෂය වීම	තේ	පොල්	ගම්මිරිස්	රබර්	කෝපි	වෙනත්	ප්‍රතිරෝපණය	එකතුව
2020 ජනවාරි 1 දිනට	**361,131,471**	**2,707,628**	**2,130,944**	**3,489,666**	**1,416,920**	**969,796**	**3,454,426**	**375,300,850**
වසර සඳහා ක්ෂය වීම් ගාස්තු	2,146,260	38,690	97,646	370,328	5,132	179,098	1,182,710	4,019,863
පෙර වසර ගැලපුම්								-
බැහැර කිරීම්								
2020 දෙසැම්බර් 31 දිනට	**363,277,731**	**2,746,318**	**2,228,590**	**3,859,994**	**1,422,051**	**1,148,894**	**4,637,136**	**379,320,713**
ශුද්ධ පොත් අගය								
2020 දෙසැම්බර් 31 දිනට	**143,655,645**	**1,062,889**	**1,323,357**	**11,410,490**	**79,190**	**4,635,865**	**31,005,066**	**193,172,503**
මුළු ජීව විද්‍යාත්මක වත්කම් (සටහන 9.1 + 9.2)	**143,655,645**	**1,062,889**	**1,323,357**	**11,410,490**	**79,190**	**4,635,865**	**31,005,066**	**3,507,753,636**

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

10. ආයෝජන දේපළ	**31.12.2020** දිනට	**31.12.2019** දිනට
	රු.	රු.
රජයෙන් ඉඩම් ප්‍රදාන	1,600,601,926	1,600,601,926
ප්‍රාග්ධන අගය සඳහා ඉඩම්	10,918,715	10,918,715
	1,611,520,641	**1,611,520,641**

1982 පෙබරවාරි 27 දිනැති 181/12 අංක දරන ගැසට් පත්‍රිකාව අනුව සමහර වතුවල හිමිකාරිත්වය ශ්‍රී ලංකා රජය විසින් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙත පවරන ලදී. 1992 වසරේදී ඒවා දීර්ඝ කාලීන බද්දට ප්‍රාදේශීය වැවිලි සමාගම් දහනවයකට (19) භාර දෙනු ලැබිණි. කළමනාකාරිත්වයේ අදහස වන්නේ, මෙම ඉඩම් ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙත භාර දුන් දිනය වන විට එම ඉඩම්වල පිරිවැය සාධාරණ ලෙස ඉඩම් පිරිවැය පිළිබිඹු කරන අතර එම මුදල් පොත්වල ඉදිරියට ගෙන යන බවයි.

ශ්‍රී.ලං.ගි.ප්‍ර 40 අනුව, ආයෝජන දේපළක් මුල් අවස්ථාවේදී (මාරු කිරීමේ ස්ථානයේ) එහි පිරිවැයෙන් මනිනු ලබන අතර පසුව සාධාරණ වටිනාකම ආකෘතිය හෝ පිරිවැය ආකෘතිය භාවිතා කරයි. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත වෙත පරිවර්තනය වන අවස්ථාවේදී මාරුකිරීම් සිදුකල දිනයේ අධීක්ෂණ අගයන් ලබා ගැනීමට කළමනාකාරිත්වයට නොහැකි වූ අතර ඒ වෙනුවට ඉඩම් ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙත ලබා දෙන අවස්ථාවේ වටිනාකම වත් වල සාධාරණ වටිනාකම ලෙස සැලකේ. එබැවින් 1992 වන විට ඉඩම් වටිනාකම ප්‍රාදේශීය වැවිලි සමාගම්වල ශේෂ පත්‍රවලින් සම්පූර්ණයෙන් ඉවත් කරන ලදී.

මෙම ආයෝජන දේපල මේ වසරේදී තක්සේරු නොකළේ , තක්සේරු කිරීම සඳහා විශාල මුදලක් අවශ්‍ය වන බැවින් සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ වත්මන් මුදල් ප්‍රවාහ තත්ත්වය හේතුවෙන් විශාල ව්‍යවස්ථාපිත හිඟ මුදල් පවා මේ වනවිට පියවා නොගන්නා මොහොතක මෙවැනි විශාල වියදමක් දැරීමට ඉඩ නොදෙන බැවිනි.

11 බඩු තොග	**31.12.2020** දිනට	**31.12.2019** දිනට
	රු.	රු.
නිමි නිෂ්පාදන	57,919,956	46,371,519
පරිභෝජ්‍ය තොග	16,675,579	16,131,121
	74,595,535	**62,502,640**

අඩු පිරිවැය සහ ශුද්ධ අධිගම්‍ය අගය (NRV) සලකා බැලීමෙන් පසුව ඉන්වෙන්ට්‍රි වටිනාකම ගණනය කෙරිණි.

12 වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු දෑ	**31.12.2020** දිනට	**31.12.2019** දිනට
	රු.	රු.
වෙළෙඳ ණයගැතියන් - ප්‍රධාන කාර්යාලය (අ)	51,009,177	37,326,686
අඩු කළා: ප්‍රධාන කාර්යාලයේ විශේෂ අපහායනයන්	(15,404,568)	(15,404,568)
වෙළෙඳ ණයගැතියන් - සියලුම වතු (ආ)	130,332,495	131,312,469
අඩුවීම්: වතුවල ණයගැතියන්ගේ විශේෂ අපහායනයන්	(49,128,420)	(49,128,420)
වෙනත් අයවීම් - ප්‍රධාන කාර්යාලය	30,966,259	22,173,326
වෙනත් අයවීම් - සියලුම වතු	36,250,601	48,930,252
	184,025,544	**175,209,745**
a)වෙළෙඳ ණයගැතියන් - ප්‍රධාන කාර්යාලය පහත අය ඇතුළත් වේ		
B.C.C. සමාගම	15,404,568	15,404,568
අඩු කළා: ප්‍රධාන කාර්යාලයේ විශේෂ අපහායනයන්	(15,404,568)	(15,404,568)
අමු තේ දළු ගැනුම්කරුවන්ගෙන් ලැබියයුතු අයවීම්	27,487,452	13,720,320
ඇල්කඩුව වතුයාය	1,916,092	1,916,092
වුඩ්සයිඩ් වතුයාය	992,125	992,125
ඩක්වරි	2,500,000	2,500,000
සුළු සහ වෙනත් ණයගැතියන්	2,708,940	2,793,581
	35,604,609	**21,922,118**
b) වෙළෙඳ ණයගැතියන් - ප්‍රධාන කාර්යාලය පහත අය ඇතුළත් වේ		
විවිධ ණයගැතියන්	33,891,252	28,869,877
පාරිභෝගික ණයගැතියන්	41,071,407	41,071,407
සුළු ආදායම් ණයගැතියන්	2,588,530	2,588,530
ජනතා වතු සංවර්ධන මණ්ඩලය	1,668,269	1,668,269
නිෂ්පාදනය සඳහා ණයගැතියන්	726,644	726,644
අඩුවීම: වතුවල ණයගැතියන්ගේ විශේෂ අපහායනයන්	(47,537,070)	(47,537,070)
අඩුවීම: බොල් ණය සඳහා ප්‍රතිපාදන	(1,591,349)	(1,591,349)
අන්තර් වැවිලි ජංගම ගිණුම	-	1,930,180
වෙනත් ණයගැතියන්	50,386,393	54,457,563
	81,204,075	82,184,050

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

මූල්‍ය ප්‍රකාශවලට සටහන්

13. මුදල් හා ඒ හා සමාන දෑ	31.12.2020 දිනට	31.12.2019 දිනට
වාසිදායක ශේෂය	රු.	රු.
අත ඇති හා බැංකුවේ ඇති මුදල්		
-ප්‍රධාන කාර්යාලය	43,342,178	36,406,748
-වතුයායන්	2,544,796	1,306,864
	45,886,973	**37,713,613**

14. දායක ප්‍රාග්ධනය	31.12.2020 දිනට	31.12.2019 දිනට
	රු.	රු.
රජයේ දායකත්වය	3,263,262,947	3,263,262,947
ඉඩම් සඳහා රජයේ දායකත්වය	2,616,589,903	2,616,589,903
	5,879,852,850	**5,879,852,850**

රජයේ සම්පූර්ණ දායකත්වය සමන්විත වන්නේ රජයෙන් (භාණ්ඩාගාරයෙන්) ලැබුණු මුදල් සහ ගැසට් නිවේදන මගින් රජය විසින් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට පවරා දුන් ඉඩම් ය. සමාලෝචිත වර්ෂය තුළ භාණ්ඩාගාර ප්‍රදාන රු. SLSPC හි මෙහෙයුම් වියදම් සඳහා රුපියල් මිලියන 222 ක් ලැබී ඇත.

15. සේවක ප්‍රතිලාභ බැඳීම්	**31.12.2020** දිනට	**31.12.2019** දිනට
	රු.	**රු.**
පටන්ගනිමේදී ශේෂය - වතුයාය	397,512,100	324,998,628
- ප්‍රධාන කාර්යාලය	20,127,083	14,599,498
පාරිතෝෂික ගැලපීම	67,350,179	33,828,923
වසර සඳහා ප්‍රතිපාදන	30,226,545	80,087,086
ප්‍රතිපාදන / අධි ප්‍රතිපාදන ගැලපුම් යටතේ (වතු සහ ප්‍රධාන කාර්යාලය)	(786,831)	(18,349,821)
ගෙවියයුතු පාරිතෝෂිතය වෙත මාරු කිරීම	(37,774,172)	(14,384,929)
වසරතුල ගෙවීම්	(7,145,102)	(3,140,202)
වෙනත් ගනුදෙනු	(218,183)	-
	469,291,620	**417,639,183**

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

මූල්‍ය ප්‍රකාශනයට අදාළ සටහන්

16.	**වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ**	**31.12.2020** දිනට	**31.12.2019** දිනට
		රු.	රු.
	ප්‍රධාන කාර්යාලය **(අ)**	316,061,332	296,618,062
	වතු (ආ)	1,046,004,128	1,020,004,690
	මෙහෙයුම් නොවන ශේෂය	1,933,044	1,933,044
		1,363,998,504	**1,318,555,797**

අ).	**ප්‍රධාන කාර්යාලයේ වෙළෙඳ සහ වෙනත් ගෙවීම්වලට පහත දේ ඇතුළත් වේ**	**31.12.2020** දිනට	**31.12.2019** දිනට
	අත්තිකාරම් - ඕපල්ගල (බදු අත්තිකාරම)	4,480,000	4,480,000
	දැව අත්තිකාරම	786,379	786,379
	පොලි කෙමික්ස්	715,389	715,389
	පර්ත් වතුයාය	6,870,411	6,932,399
	ජනතා වතු සංවර්ධන මණ්ඩලය (JEDB)	97,709,342	97,709,342
	අත්තිකාරම් ලැබුන නිම් තේ තැරැව්කරුවන්	1,513,477	16,030,780
	අත්තිකාරම් ලැබුණු - අමු තේ දළු ගැනුම්කරුවන්	5,742,978	11,756,571
	රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව	28,709,029	28,709,029
	පොහොර සංස්ථාව	35,931,679	35,931,679
	හලාවත වැවිලි සමාගම	36,410,959	34,810,959
	ණය - ලංකා බණිජ වැලි	25,000,000	25,000,000
	උපචිත වියදම්	13,527,699	5,576,019
	සේ.අ.ආ/ව.සේ.අ.ආ/වැ.අ.අ- ගෙවිය යුතු	17,789,938	6,340,558
	සේ.භා.අ	1,226,571	157,034
	වෙනත් ගෙවිය යුතු දෑ	36,846,482	18,880,925
	ගස් අලේච්චිය මත ණය	2,801,000	2,801,000
	එකතුව	**316,061,332**	**296,618,062**

ආ).	**වතුවල වෙළෙඳ සහ අනිකුත් ගෙවිය යුතු දේවලට පහත දේ ඇතුළත් වේ**	**31.12.2020** දිනට	**31.12.2019** දිනට
	විවිධ ණයහිමියන්	34,047,026	70,854,109
	ඇල්කඩුව වතුයාය	172,137	172,137
	නැවත ගෙවනු ටෙන්ඩර් ගාස්තු	6,379,570	6,379,570
	වෙනත් වත්කම්	15,594,104	21,325,404
	වෘත්තීය සමිති	7,428,863	6,595,773
	කාර්ය මණ්ඩලට සහ කම්කරුවන්ට ගෙවිය යුතු මුදල්	49,177,269	33,408,555
	විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන	8,673,278	7,289,573
	ගෙවිය යුතු සේ.අ.අ.	413,339,668	421,921,940
	ගෙවිය යුතු ව.සේ.අ.අ	16,625,046	7,552,308
	ගෙවිය යුතු වැ.අ.අ	24,954	128,830
	ගෙවිය යුතු සේ.නි.භා.අ.	23,804,025	14,380,082
	ගෙවිය යුතු පාරිතෝෂික	402,314,300	364,540,128
	උපචිත වියදම්	1,018,144	1,489,328
	ගෙවිය යුතු පැමිණීමේ ප්‍රසාද දීමනා	2,036,935	1,843,993
	ගෙවිය යුතු සේ.අ.අ. අධිභාර	43,640,418	42,020,364
	ගෙවිය යුතු සේ.නි.භා.අ. අධිභාර	2,658,745	1,195,465
	ගෙවිය යුතු පාරිතෝෂික අධිභාර	14,296,172	14,525,548
	වෙනත් ගෙවිය යුතු දෑ	4,773,473	4,381,580
	එකතුව	**1,046,004,128**	**1,020,004,690**

16.1	**බැංකු ණය**	**100,000,000**

2020 අප්‍රේල් සහ මැයි මාසවලදී අපගේ මූදල් ප්‍රවාහ හිඟය පියවා ගැනීම සඳහා ඉහත සඳහන් දෑ අපි මහජන බැංකුවෙන් ලබාගෙන ඇත. මෙම ණය මුදල මහා භාණ්ඩාගාරය විසින් සහතික කරන ලදී.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

17	**ආදායම**	**31.12.2020**	**31.12.2019**
		රු.	**රු.**
	තේ	327,616,538	233,893,034
	අමු තේ දළු	419,437,439	292,842,800
	සුළු බෝග	11,544,276	2,262,052
	රබර්	8,237,326	6,935,151
		766,835,580	**535,933,037**

තේ අලෙවියට කසල තේ අලෙවියෙන් ලත් ආදායම ද ඇතුළත් වේ. අදාළ වියදම්/ විකුණුම් පිරිවැය අඩු කිරීමෙන් පසුව කසල තේ , සුළු බෝග සහ ගස් විකුණුම් වලින් ලත් ආදායම පෙන්වා ඇත

18	**වෙනත් ආදායම**	**31.12.2020**	**31.12.2019**
		රු.	**රු.**
	ගස් ටෙන්ඩර් කිරීම	97,038,052	**55,499,615**
	බදු කුලී	36,042,725	28,019,892
	කළමනාකරණ ගාස්තුව	17,174,029	15,743,339
	පොළී ආදායම	2,201,642	2,324,060
	හුනස්ගිරි දියඇල්ලේ විවේක උද්‍යානයෙන් ලැබෙන අදායම	712,535	1,332,494
	වෙනත් ආදායම් - වතු සහ ප්‍රධාන කාර්යාලය	3,442,121	3,132,140
	සංචාරක බංගලා ආදායම	1,867,178	923,195
	වෙනත් ආදායම්හි එකතුව	**158,478,281**	**106,974,735**

19	**පරිපාලන වියදම්**	**31.12.2020**	**31.12.2019**
		රු.	**රු.**
	මානව සම්පත් පිරිවැය	48,550,223	46,850,831
	නිශ්චිත දායකත්ව -සේ.අ.අ, වැ.අ.අ සහ ව.සේ.අ.අ	7,071,270	4,500,999
	නිශ්චිත දායකත්ව - සේ.නි.භා.අ	1,540,406	1,125,250
	ක්ෂය වීම-ප්‍රධාන කාර්යාලය.	1,303,308	1,073,658
	පාරිතෝෂික වියදම ප්‍රධාන කාර්යාලය සහ වතු	30,226,545	33,828,923
	විකුණුම් වියදම්	13,927,535	6,826,920
	වෙනත් පරිපාලන වියදම් - වතු සහ ප්‍රධාන කාර්යාලය	78,268,055	71,267,271
	මුළු පරිපාලන වියදම	**180,887,340**	**165,473,851**

20	**මූල්‍ය වියදම්**	**31.12.2020**	**31.12.2019**
		රු.	**රු.**
	මුදල් මත කොමිස්	5,597,184	5,049,882
	තේ තැරැව්කරුවන්ගේ අත්තිකාරම් මත පොළිය	2,015,159	3,767,109
	බැංකු ගාස්තු	239,718	72,139
	බැංකු අයිරා සහ බැංකු ණය පොළිය	19,848,781	10,221,274
	වෙනත් ණය පොළී- හලාවත වැවිලි සමාගම	1,600,000	1,600,000
	මුළු මූල්‍ය වියදම්	**29,300,841**	**20,710,404**

21 ආදායම් බදු

පසුගිය වසර දහ අට පුරාම රාජ්‍ය වැවිලි සංස්ථාවේ වාර්ෂික වාර්තාව තුළ ආදායම් බදු ගණනය දක්වන්නේ නොමැත. මෙම හේතුව නිසා සහ අඛණ්ඩ පාඩු ලැබීම හේතුවෙන් බදු අය කළ හැකි ලාභයන් ලැබීමට ඉඩ නොමැති බව උපකල්පනය කරන අතර රාජ්‍ය වැවිලි සංස්ථාව විසින් ආදායම් බදු ගෙවීමට ඇති ඉඩකඩ ඉතා අඩු ය. පසුගිය වසර විසි හතර පුරාම (1995 සිට 2019) දක්වා රාජ්‍ය වැවිලි සංස්ථාව ලාභ ලබා ඇත්තේ වසර හතරක් පමණි.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

22 ආශ්‍රිත පාර්ශව අනාවරණ

රජය රාජ්‍ය පාලිත ආයතන සමග ගනුදෙනු

සාමාන්‍ය ක්‍රියාකාරිත්වයේදී සංස්ථාව ආශ්‍රිත පාර්ශවයන් සමඟ ගනුදෙනුවලට එළඹේ. ආශ්‍රිත පාර්ශවයන් අතරට ශ්‍රී ලංකා රාජ්‍ය (සංස්ථාවේ අවසාන හිමිකරු ලෙස) විවිධ රජයේ දෙපාර්තමේන්තු සහ රාජ්‍ය පාලිත ආයතන ඇතුලත් වේ. තනි තනි වශයෙන් වැදගත් වන සහ සාමුහිකව ගත් කලෙක මිස තනිව ගත්කල වැදගත් නොවන රාජ්‍ය සහ රාජ්‍ය පාලිත ආයතන සමඟ සංස්ථාව විසින් සිදුකරන ලද ගනුදෙනු පිළිබඳ විස්තර පහත පරිදි වේ .

හිඟ ශේෂය:

ගෙවිය යුතු	**2020**	**2019**
	රු.	**රු.**
රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව	28,709,029	28,709,029
පොහොර සංස්ථාව	35,931,679	35,931,679
හලාවත වැවිලි සමාගම	36,410,959	34,810,959
ලංකා මිනරල් සෑන්ඩ්ස් සමාගම	25,000,000	25,000,000
ඇල්කඩුව වතුයාය	172,137	172,137
ජනතා වතු සංවර්ධන මණ්ඩලය (JEDB)	97,709,342	97,709,342
පර්ත් වතුයාය	6,870,411	6,932,399
ලැබිය යුතු		
ඇල්කඩුව වතුයාය	1,916,092	1,916,092
ජනතා වතු සංවර්ධන මණ්ඩලය (JEDB)	41,071,407	41,071,407
ජනතා වතු සංවර්ධන මණ්ඩලය (JEDB)	1,668,269	1,668,269

23 බැඳීම් සහ අවිනිශ්චිතතා

සේවක අර්ථසාධක මුදල්,සේවක භාරකාර මුදල් සහ පාරිතෝෂික නොගෙවීම් යනාදී කාරණා සම්බන්ධයන් ඇතුළුව ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ කළමනාකාරිත්වයට එරෙහිව මේ වන විට නඩු 697කට වැඩි ප්‍රමාණයක් ගොනුකර ඇත. සංස්ථාවේ නීතීඥයින් විසින් නඩු කටයුත්ත සාර්ථක විය හැකි නමුත් එහි සාර්ථකවීමේ සම්භාවිතාවය ඉතා අඩුබවට සංස්ථාව දැනුවත් කරනු ලැබ ඇත. ඒ අනුව,මෙම මූල්‍ය ප්‍රකාශනවලින් කිසිදු අවිනිශ්චිත වගකීමක් සඳහා ප්‍රතිපාදන සපයා නොමැත. කෙසේ වෙතත් 2020 වර්ෂයේදී සතිපතා පැමිණෙන නීතිමය අධිකරණ නඩු සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව විසින් තමන්ගේම අරමුදල් වලින් දිගටම ගෙවීම සිදු කරන ලදී.ඊට සමගාමීව 2017.01.01 දින සිට සේවක අර්ථසාධක මුදල් සහ සේවක භාරකාර මුදල් මාසිකව ගෙවීමට පියවර ගන්නා ලද අතර සේ.අ.අ සහ සේ.නි.හ.අ කිසිදු ප්‍රමදයකින් තොරව 2019 වර්ෂයේ ජූලි මස දක්වා නියමිත වෙලාවට ගෙවන ලදී.කිසිදු ප්‍රමාදයකින් තොරව ගෙවා ඇත. 2020 වර්ෂය තුළ අපි මාස තුනක දායක මුදල් ගෙවා ඇත.

24. ශේෂ පත්‍ර දිනයට පසු සිදුවීම්

ශේෂ පත්‍ර දිනයෙන් පසුව ඇති සියලුම ප්‍රමාණාත්මක සිදුවීම් සලකා බලා අවශ්‍ය අවස්ථාවලදී මූල්‍ය ප්‍රකාශනවල සුදුසු ගැලපීම් සහ හෙළිදරවු කිරීම් සිදු කර ඇත.

25 පෙර වසර ගැලපීම

පූර්ව වසර ගැලපුම්වලට පෙර මූල්‍ය වසරට අදාළ පහත ගනුදෙනු ඇතුළත් වන අතර මෙම ගැලපීම් මෙම වර්ෂය තුළ සිදු කරන ලදී.

විස්තර	**2020**	**2019**
	රු.	**රු.**
පාරිතෝෂික (අධිභාර, ඌන/අධි ප්‍රතිපාදන)	-	163,532,580
වෙනත් වියදම්/ගැලපුම්	(4,886,661)	10,158,950
එකතුව	(4,886,661)	173,691,530

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. PAL/C/SLSPC/01/2020/11 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2022 දෙසැම්බර් / 6 දින

සභාපති

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 අභිතකර මතය

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීම් ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ අභිතකර මතය සඳහා පදනම් කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 අභිතකර මතය සඳහා පදනම්

1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම්

(අ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 07 හි ඡේද 07 (අ) සහ (ආ) ප්‍රකාරව ඇප නැබූ වත්කම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන තුළ ප්‍රමාණවත් හෙළිදරව් කිරීමක් සිදු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බැංකු අයිරා වූ රු.101,282,759 සඳහා ඇප ලෙස නැබූ ස්ථාවර නැන්පතුවලට අදාළව මූල්‍ය ප්‍රකාශනවල කිසිදු හෙළිදරව් කිරීමක් සිදු කර නොතිබුණි.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 07 හි ඡේද 17 (ඇ) ප්‍රකාරව මූල්‍ය ක්‍රියාකාරම් තුළින් උත්පාදනය වන්නා වූ මුදල් ප්‍රවාහයන් වෙනම හෙළිදරව් කළ යුතු නමුත් ,සමාලෝචිත වර්ෂයේ සංස්ථාව ලබාගත් රු.100,000,000 ක ණය මූල්‍ය ක්‍රියාකාරම් තුළ හඳුනා නොගැනීම හේතුවෙන් මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් උත්පාදනය වූ මුදල් ප්‍රවාහය එම වටිනාකමින් අඩු වී තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 08 හි ඡේද 42 සහ 43 ප්‍රකාරව පෙර වර්ෂ වලදී සිදු වූ වැරදි අතීතානුයෝගිව ගැලපීමෙන් පසු සමාලෝචිත වර්ෂය සමඟ ඉදිරිපත් කරන සංසන්දනාත්මක තොරතුරුවල නිවැරදි කළ යුතු නමුත්, සමාලෝචිත වර්ෂය තුළ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයෙහි දක්වා ඇති රු.4,886,661 ක් සහ 2019 වර්ෂයේ රු.10,158,950 ක් වූ වැරදි ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සංසන්දනාත්මකව නිවැරදි කර දක්වා නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 13 හි 37 ඡේදය ප්‍රකාරව වර්ෂ 10 කට අධික කාලපරිච්ඡේදයක සිට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු.මි.645 ක් ලෙස පැවත එන සින්නක්කර ඉඩම් සහ සංස්ථාවේ වතු 14 කට අයත් හෙක්ටයාර් 11,178 ක් වූ ඉඩම් සාධාරණ අගයට තක්සේරුකර ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 34 ඡේදය ප්‍රකාරව රු.271,701,475 ක පිරිවැය වූ සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද වත්කම් ප්‍රත්‍යාගණනය කර සාධාරණ වටිනාකමට ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 37 ඡේදය ප්‍රකාරව එක සමාන ස්වභාවයක් හා භාවිතයක් පවතින වත්කම් පමණක් බාණ්ඩ කර ගිණුම්ගත කළ යුතු බව දක්වා තිබුණ ද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සංස්ථාවට අයත් වතුයායන්හි පවතින පරිගණක, උපකරණ, ගෘහ භාණ්ඩ හා සවිකිරීම් යන ස්ථාවර වත්කම් වර්ග සියල්ලම උපකරණ, ගෘහ භාණ්ඩ හා සවිකිරීම් යන තනි අයිතමය යටතේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 37 ඡේදය අනුව කෘෂිකාර්මික කටයුතු වලට අදාළ ධාරක ජීව විද්‍යාත්මක වත්කම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දේපළ පිරියත හා උපකරණ යටතේ වෙනම අයිතමයක් ලෙස ඉදිරිපත් කළයුතු වුවද, ජීව විද්‍යාත්මක වත්කම් යටතේ දක්වා තිබුණි.

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 හි 57 වගන්ති ප්‍රකාරව අස්ථිත්වයේ සේවා ප්‍රතිලාභ බැඳීම ගණනයේදී ආයුගණන ක්‍රමය යොදාගැනීම සිදුකළ යුතු නමුත් , සංස්ථාව විසින් සිය ප්‍රතිලාභ ගණනයේදී ආයුගණන ක්‍රමය භාවිතා කර නොතිබුණි.

(එ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා ඇති ශේෂය රු.1,611,520,641 ක ආයෝජන දේපළ සම්බන්ධයෙන් ප්‍රමිති 40 හි සඳහන් පහත හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

(i) 75 (ඌ) ඡේදය පරිදි උක්ත ආයෝජන දේපළ වලට අදාළ ගැණුම්, ඉදිකිරීම්, සංවර්ධනය කිරීම්, අලුත්වැඩියා, නඩත්තු හෝ වැඩිදියුණු කිරීම්වලට අදාළ ගිවිසුම්මය බැඳීම් තිබේද යන්න.

(ii) 78 (අ) ඡේදය ප්‍රකාරව ආයෝජන දේපළවල විස්තරයක් මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කළ යුතු වූවත්, 1982 පෙබරවාරි 27 දිනැති අංක 181/12 දරන රජයේ ගැසට් පත්‍රය මඟින් සංස්ථාවට ලබා දී ඇති දේපළ පිළිබඳව.

(ඒ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 41 හි 4 වන ඡේදය ප්‍රකාරව වන වගාව, පරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් යටතේ ගිණුම්ගත කළ යුතු වූවත්, පිරිවැය රු.35,642,201 ක් වූ වන වගාව ධාරක ජීව විද්‍යාත්මක වත්කම් යටතේ ගිණුම් ගත කර තිබුණි.

(ඔ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 41 හි 12 ඡේදය අනුව පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් සාධාරණ වටිනාකමට මැනිය යුතු බව දක්වා ඇති නමුත් සංස්ථාවේ වතු 11 ක හෙක්ටයාර 726.73 ක් පුරා විහිදුනු වන වගාවන් සමාලෝචිත වර්ෂය අවසානයේ තක්සේරු කිරීමකින් තොරව හෝ සාධාරණ වටිනාකමකට අගය කිරීමකින් තොරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු.3,314,581,133 ක් ලෙස දක්වා තිබුණු අතර, ඒ සඳහා සදොස් ලෙස සියයට 4 ක ක්‍රමක්ෂය වටිනාකමක් ද ගිණුම්ගත කර තිබුණි. තවද, සමාලෝචිත වර්ෂයේදී මෙම වගාව පරිනත වගාවන් ලෙස සලකා රු. 1,182,710 ක ක්‍රමක්ෂය වටිනාකම ආදායම් ප්‍රකාශනයේ වියදම් යටතේ දක්වා තිබීම නිසා එම අගයෙන් සංස්ථාවේ අලාභයද අධි ගණනය වී තිබුණි.

(ඕ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 41 හි 43 , 44 හා 45 ඡේද ප්‍රකාරව ජීව විද්‍යාත්මක වත්කම් පරිනත හා පරිනත නොවූ වගාවන් ලෙස වෙන වෙනම ඉදිරිපත්කළ යුතු වුවත් , සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් යටතේ අනාවරණය කර තිබුණු රු. 193,172,503 ක ජීව විද්‍යාත්මක වත්කම් එසේ වර්ගීකරණය කර ඉදිරිපත් කර නොතිබුණි.

1.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශනවල අංක 3.1.4.2 දරන සටහනෙහි දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් සාධාරණ අගයකට හෙළිදරව් කර ඇති බව දක්වා තිබුණද, රු.3,314,581,133 ක පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් සාධාරණ අගයට තක්සේරු නොකර 2012 වර්ෂයේ පැවති වටිනාකමටම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම්කර තිබුණි.

1.2.3 ගිණුම්කරණ අඩුපාඩු

(අ) සංස්ථාව සමාලෝචිත වර්ෂයේ ගෙවිය යුතු වතු කාර්ය මණ්ඩල අර්ථසාධක අරමුදල (ESPS) වෙත රු.187,457 ක්, සේවක අර්ථසාධක අරමුදල (ETF) වෙත රු.175,483 ක්, සේවක භාරකාර අරමුදල වෙත (EPF) 194,753 ක් හා ලංකා වැවිලි කරුවන්ගේ අර්ථසාධක අරමුදල (The Ceylon Planters Provident Society - CPPS) වෙත කරන ලද දායක මුදල් රු.319,722 ක් දෙවරක්

සටහන් වීම හේතුවෙන් අදාළ ගෙවිය යුතු වටිනාකම එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණු අතර අදාළ සමුච්චිත වියදම ද රු. 877,414 කින් අධිගණනය වී තිබුණි.

(ආ) හුන්නස්ෆෝල් හෝටලය සඳහා සංස්ථාව විසින් බදු පදනම මත ලබාදී ඇති මාර්ගය වෙනුවෙන් ලද ආදායම මුදල් පදනම මත ගිණුම්ගත කිරීම හේතුවෙන් රු.6,007,640 ක වටිනාකමකින් සමාලෝචිත වසරේ වෙනත් ආදායම් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සංස්ථාව ලංකා බැංකුවේ හයිඩ්පාර්ක් ශාඛාවේ පවත්වාගෙන යනු ලබන අංක 2327550 දරන ජංගම ගිණුමේ අයිරා ශේෂය රු. 4,123,000 කින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දැක්වීම හේතුවෙන් ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් අවතක්සේරු වී තිබුණි.

(ඈ) සංස්ථාව රු.1,609,054 ක මදුරුකුරු තොගයක් භෞතිකව සත්‍යාපනය නොකර 2017 වර්ෂයේ වූ පොත් අගය පදනම් කර ගනිමින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කර තිබුණි.

(ඉ) වතුයායන් 05 කට අයත් භෞතිකව නොපවතින පැළ තවාන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගැනීම හේතුවෙන් රු.3,594,787 කින් සංස්ථාවේ වත්කම් වැඩියෙන් පෙන්වා තිබුණු අතර අලාභයද එම ප්‍රමාණයෙන් ඌන ගණනය වී තිබුණි.

(ඊ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය පහත ගිණුම්කරණ අඩුපාඩු සහිතව පිළියෙල කර තිබුණි.

(i) සංස්ථාවේ සමාලෝචිත වර්ෂයට අදාළව, වෙළඳ ගෙවිය යුතු දෑ වෙනස් වීම රු.45,442,707 ක් වූවද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.172,413,700 ක් ලෙස සැලකීම හේතුවෙන් රු.126,970,933 කින් මෙහෙයුම් තුළින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය වැඩි වී තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ මුදලින් ගෙවන ලද සේවක පාරිතෝෂික ගෙවීම්, ලබාදෙන ලද උපලේඛනයට අනුව රු.10,159,690 ක් වූ නමුත්, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ හඳුනාගන්නා ලද ප්‍රමාණය රු.7,145,102 වුයෙන්, මෙහෙයුම් වලින් උත්පාදනය වූ මුදල් ප්‍රවාහය රු.3,014,588 ක් වැඩියෙන් දක්වා තිබුණි.

1.2.4 නොසැසඳුණු පාලන ගිණුම්

(අ) සංස්ථාව විසින් ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත ගෙවිය යුතු ණය මූල්‍ය ප්‍රකාශන අනුව රු.97,709,342 ක් වන අතර, ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ ලෙජර් ගිණුම් අනුව 2020 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වටිනාකම රු.119,318,495 ක් වේ. ඒ අනුව අදාළ වටිනාකම් අතර රු.21,609,153 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) ප්‍රධාන කාර්යාලයේ සහ වතුයායන් අතර සිදුවන භාණ්ඩ සහ මුදල් හුවමාරු කර ගැනීම සඳහා පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම් තුළ එකිනෙකට හිලව් නොවන රු.75,579,590 ක (හර) වෙනසක් නිරීක්ෂණය විය.

1.2.5 පැහැදිලි නොකළ වෙනස්කම්

(අ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් යටතේ දක්වා ඇති දේපළ පිරියත උපකරණ වලට අදාළ ස්ථාවර වත්කම් ලේඛනය සහ අදාළ ලෙජර් ගිණුම් අතර රු.168,874,507 වෙනසක් සහ පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම්වලට අදාළ, පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් ලේඛනය සහ අදාළ ලෙජර් ගිණුම් අතර රු.2,420,933 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂය සහ ප්‍රධාන කාර්යාලය විසින් පවත්වාගෙන යන උපලේඛනය අනුව ධාරක ජීව විද්‍යාත්මක වත්කම්වල ශුද්ධ පොත් අගය සහ එකතුකිරීම් ලෙස දක්වා ඇති ශේෂයන් අතර පිළිවෙලින් 12,043,774 සහ රු.1,525,154 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.2.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) සංස්ථාවේ ණය හිමි කාල විශ්ලේෂණය අනුව වසර 1 සිට වසර 4 දක්වා නිරවුල් නොකළ ශේෂය රු.363,323,605 ක් ද, වසර 5 ඉක්මවා ඇති නිරවුල් නොකළ ශේෂය රු.700,185,731 ක් ද වූයෙන් එම ණය ශේෂ නිරවුල් නොකිරීම මත සංස්ථාවේ වගකීම් අධි තක්සේරු වීමේ අවදානමක් පැවතිණි.

(ආ) වතු කාර්යමණ්ඩල අර්ථසාධක අරමුදල (ESPS) වෙත නිසි පරිදි දායක මුදල් නොගෙවීම හේතුවෙන් සමාලෝචිත දිනට පැවති බැරකම රු.16,625,046 ක් නිරවුල් නොකිරීම මත මෙම වගකීම් සඳහා ගෙවීමට සිදුවන අධිභාර සඳහා වෙන් කිරීම් සිදු කර නොතිබුණි.

(ඇ) වර්ෂ 8 කට පෙර සිට පවත්නා රු.786,379 ක් වූ දැව සඳහා ලද අත්තිකාරම් වටිනාකම නිරවුල් කිරීමට හෝ ලියාහැරීමට කටයුතු නොකිරීම නිසා සංස්ථාවේ වගකීම් අධි තක්සේරු වීමේ අවදානමක් පැවතිණි.

(ඈ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ දක්වා ඇති රු.169,523,942 ක ණයගැති ශේෂයන්ගෙන්, වර්ෂ 02 ත් 04 ත් අතර ශේෂය රු.1,984,314 ක් හෙවත් සියයට 0.7 වූ අතර, වර්ෂ 05 ඉක්මවා ඇති ශේෂය රු.87,063,235 ක් හෙවත් සියයට 50 ක් ලෙස පැවතුණි. මෙම ණයගැති ශේෂ අයකර ගැනීම සඳහා සංස්ථාව සමාලෝචිත වර්ෂයේද ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබීම මත අයකරගැනීමේ අවිනිශ්චිතතාවයක් නිරීක්ෂණය වූ අතර එම ශේෂ සඳහා අඩමාණ ණය වෙන්කිරීමටද සංස්ථාව කටයුතු කර නොතිබුණි.

(ඉ) 2014 ඔක්තෝබර් 15 දින සංස්ථාව විසින් ගිවිසුමකට එළඹීමකින් තොරව රු.මිලියන 6 ක ණය මුදලක් ඇල්කඩුව වැවිලි සමාගමට ලබා දී තිබුණු අතර, 2015 වර්ෂයේ සිට සමාගම විසින් මෙම ණය මුදල ගෙවීම පැහැර හැරීම නිසා අය නොවී පවතින ණය ශේෂයවන රු.1,916,092 ක් සඳහා අඩමාණ ණය වෙන්කිරීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි.

1.2.7 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

(අ) 2012 වර්ෂයටත් පෙර සිට පැවත එන රු.1,933,043 ක අක්‍රිය ශේෂයක් සමාලෝචිත වර්ෂයේදී ද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් තුළ වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ ලෙස දක්වා තිබුණු අතර, මෙම ශේෂය පිළිබඳ පැහැදිලි කිරීමක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) සංස්ථාවේ අයහපත් මූල්‍ය තත්ත්වය නිසා නිරවුල් කිරීමට නොහැකිව ඇති රු.174,415,850 ක ණය හිමි ශේෂ 06 ක් සඳහා ශේෂ සනාථන සහ එකතුව රු.101,184,952 ක් වූ ණය ගැති ශේෂ 29 ක් සඳහා ශේෂ සනාථන සහ පසුකාලින ශේෂ නිරවුල් කිරීම් වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) ගස් අලෙවිය මත ණය වටිනාකම වූ රු.2,801,000 ක වටිනාකම තහවුරු කර ගැනීම සඳහා අදාළ තක්සේරු වාර්තා, ඉන්වොයිස්පත්, සැපයුම්කරුවන්ගේ තොරතුරු සහ විකුණුම් ගිවිසුම් ආදිය විගණනය සඳහා ඉදිරිපත් නොවිය.

(ඈ) 2006 වසරේ සිට වතුයායන් 12 කට අයත් රු.6,379,570 ක ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු ලෙස ශේෂයක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ සමාලෝචිත වර්ෂයේදී ද පෙන්වා තිබුණු අතර, මෙම ශේෂ සනාථ කර ගැනීම සඳහා ලේඛනගත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) පාරිතෝෂික වෙන්කිරීම් වලට ගලපා ඇති රු.67,350,179 ක් වූ බැර ශේෂය සම්බන්ධයෙන් ප්‍රමාණවත් පැහැදිලි කිරීමක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඊ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ දේපළ පිරියත හා උපකරණ යටතේ පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙනවිත් ඇති රු.1,645,340 ක වන කළමනාකරණ වියදම් සහ රු.6,705,259 ක් වූ වෙනත් පවරාගත් වත්කම් යන වටිනාකම් තහවුරු කිරීම සඳහා අවශ්‍ය ලේඛනගත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(උ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු.1.149,166,505 ක් වූ දේපළ පිරියත හා උපකරණ යටතේ පවතින රු.649,377,816 ක් වූ ඉඩම්, රු.187,748,858 ක් වූ ගොඩනැගිලි සඳහා ඔප්පු/බලපත්‍ර , තක්සේරු වාර්තා සහ රු.148,535,052 ක් වූ වාහන සඳහා ලියාපදිංචි සහතික, විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඌ) සංස්ථාවේ අලකොල්ල, ගල්පිල්ල, හුන්නස්ගිරිය සහ රංගල වතුයායන්හි මාර්ග නවීකරණයට ලබාදුන් අරමුදල්වන රු.781,064 ක් විලම්භිත වත්කම් යටතේ හඳුනාගැනීමට හේතුවූ කරුණු සනාථ කිරීම සඳහා අවශ්‍ය ලේඛනගත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවූණි.

(එ) පොහොර, රසායනික ද්‍රව්‍ය ඇතුළු රු.4,870,669 ක පාරිභෝජ්‍ය තොග භෞතිකව සත්‍යාපනය කර නොතිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට පැවති රු.25,878,517 ක් වටිනා ණයගැති ශේෂ කුමන පුද්ගලයින්ගෙන් අයවිය යුතු ද යන්න හෝ එම ශේෂයන් සනාථ කිරීම සඳහා අවශ්‍ය උපලේඛනයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඔ) 2012 වර්ෂයටත් පෙර සිට පැවත එන සමාලෝචිත වර්ෂයේද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ණයගැති ශේෂයෙන් අඩු කර පෙන්වා ඇති රු. 47,537,070 ක විශේෂ හානිකරණය සඳහා වෙන් කිරීම් සහ රු.1,591,349 ක අඩමාණ ණය වෙන්කිරීම් සඳහා භාවිතා කළ පදනම පැහැදිලි කර නොතිබීම නිසා එහි නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමට නොහැකි විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සංස්ථාවේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සංස්ථාවේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සංස්ථාවේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම

හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා වෙත ලැබී නොමැති අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් නොතිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ අභිතකර මතය සඳහා පදනම කොටසේ 1.2.1 (අ) (ඇ) (ඊ) (උ) (ඌ) (එ) (ඒ) (ඕ) 1.2.2, 1.2.3 (ඇ) (ඉ) (ඊ ii), 1.2.4 (ආ), 1.2.5 (අ) (ආ), 1.2.6. (ඇ) (ඇ) (ඉ) සහ 1.2.7 (අ) (ආ) (ඇ) (ඊ) (උ) (ඒ) (ඔ) දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වාර්ෂයේදී මා විසින් සිදුකරන නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනුයාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ)	2015 මැයි 25 දිනැති අංක 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	MM බාණ්ඩයට අයත් නිලධාරීන්හට වාහන දීමනාව හිමි නොවන නමුත් සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂයේදී එම බාණ්ඩයේ නිලධාරීන් දෙනෙකු හට රු.1,200,000 ක ප්‍රවාහන දීමනාවක් සහ රු.394,560 ක ඉන්ධන දීමනාවක් ගෙවා තිබුණි.
(ආ)	2020 ජනවාරි 27 දිනැති අංක PED 01/2020 දරන රාජ්‍ය ව්‍යාපාර	සභාපතිගේ මාසික ඉන්ධන දීමනාව ලීටර් 150 ක් වූවද එම සීමාවන් ඉක්මවා ලබාගන ඇති

	චක්‍රලේඛයේ 1.2 වගන්තිය	වටිනාකම රු.280,907 ක ඉන්ධන ලීටර් 1,843 ක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනමැතිය 2022 අගෝස්තු 26 දින ලබා ගෙන තිබුණි
(ඇ)	අංක SLSPC/2016-17/MAY/10/ 10BP/146 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව	සාමාන්‍යාධිකාරී වෙත මාසික ඉන්ධන දිමනාව ප්‍රමාණවත් නොවන විශේෂ අවස්ථාවලදී මාසික ඉන්ධන දීමනාවට අතිරේකව ඉන්ධන ලීටර් 120 ක් සඳහා අනුමැතිය ලබාදී තිබුණු නමුත් එම සීමාව ඉක්මවා 2020 වර්ෂය පුරා ඉන්ධන ලීටර් 1,909 ක් ලබා ගෙන තිබුණු අතර එහි වටිනාකම රු.279,282 ක් විය.
(ඇ)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය	සෑම වාහනයක්ම මාස 12 ක කාලපරිච්ඡේදයක් තුළ හෝ කිලෝමීටර් 25,000 ක් ධාවනයෙන් පසුව හෝ එන්ජිමේ ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව ඉන්ධන පරීක්ෂාවකට ලක්කළ යුතු වුවත් සංස්ථාව විසින් පරිහරණය කරනු ලබන වාහන 55 ක එලෙස ඉන්ධන දහනය වීම් පරීක්ෂාවක් සිදු කර නොතිබුණි.
(ඉ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ - 1645 (අ) සහ 2006 ජූලි 14 දිනැති අංක 11/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි 3 (xii) වගන්තිය	සංස්ථාවට අයත් වාහන සඳහා වාහන භාර නිලධාරියා විසින් ලොග් සටහන් පොතක් පවත්වාගෙන යායුතු නමුත්, සංස්ථාවට අයත් වාහන 55 ක් සඳහා එලෙස වාහන ලොග් සටහන් පොත් පවත්වාගෙන ගොස් නොතිබුණි.
(ඊ)	1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 15 වන වගන්තිය හා 1980 අංක 46 දරන සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් පනතේ ii කොටසේ 16(i) වගන්තිය	2006 වර්ෂයේ සිට රු.413,339,668 ක් වූ සේවක අර්ථසාධක අරමුදල් දායකය සහ රු.23,804,025 ක සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් දායකය සමාලෝචිත වර්ෂය අවසන් දින දක්වා ගෙවීමට කටයුතු කර නොතිබුණු අතර, මේ නිසා සමාලෝචිත වසරේ අවසාන දිනට පිළිවෙලින්

		රු.43,640,418 ක් හා රු.2,658,745 ක් අධිභාර පනවා තිබුණි.
(උ)	1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ ii වන කොටසේ (5) (1) උපවන්තිය	සේවකයකු විශ්‍රාම ගිය හෝ මරණයට පත් වූ දින සිට දින 30 ක් ඇතුළත පාරිතෝෂික ගෙවීම් කළ යුතු වූවත් සංස්ථාව විසින් ඒ පරිද්දෙන් පාරිතෝෂික මුදල් නියමිත දිනට නොගෙවීම හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු පාරිතෝෂික ගිණුමේ ශේෂය රු. 402,314,300 ක මුදලක් හිඟව තිබුණු අතර 2020 වර්ෂය අවසාන වන විට රු.14,296,172 ක අධිභාර ප්‍රමාණයක් ගෙවිය යුතුව තිබුණි.
(ඌ)	2018 මාර්තු 19 දිනැති අංක 01/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 2 (අ) ඡේදය සහ 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 02 ඡේදය	සංස්ථාව සතු වර්තමානය වන විට භාවිතයට ගත නොහැකි අපහරණය කළ යුතු තත්වයේ පවතින ලොරි රථ 20 ක්, ට්‍රැක්ටර් හා ට්‍රේලර් 24 ක්, කාර් රථ 09 ක්, ජීප් රථ 03 ක් හා ගිලන් රථ 01 ක් , ත්‍රීවිල් රථ 01 ක් හා මෝටර් බයිසිකල් 36 ක් වශයෙන් සමස්ත වාහන 58 ක් 2022 දෙසැම්බර් 17 දින වන විටත් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.
(එ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ. 395 (ආ)	බැංකු ජංගම ගිණුම් සඳහා එක් මාසයක් අවසානයෙන් පසුව ඊළඟට පැමිණෙන මාසයේ 15 දින හෝ ඊට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කළ යුතු නමුත්, සංස්ථාව පිළියෙල කළ සැසඳුම් ප්‍රකාශයන්හි දිනය සටහන් නොකිරීම නිසා එම රීතියට අනුකූලව කටයුතු කර තිබේ ද යන්න පරීක්ෂා කළ නොහැකිව තිබූ අතර බැංකු ගිණුම් 14 ක් සම්බන්ධයෙන් බැංකු සැසඳුම් හා බැංකු ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.
(ඒ)	2006 අංක 10 දරන දේශීය ආදායම් බදු (සංශෝධිත) පනතේ 113 වගන්තිය	පුද්ගලයෙකු හෝ හවුල් ව්‍යාපාරයක් ස්වයං තක්සේරු පදනම මත කාර්තුවක් අවසානයේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට පිළිවෙලින්

අගෝස්තු 15, නොවැම්බර් 15, පෙබරවාරි 15 හා ජූලි වර්ෂයේ මැයි 15 යන දින හෝ ඊට පෙර ද ඉතිරි බදු මුදලක් වෙතොත් එය ජූලි වර්ෂයේ සැප්තැම්බර් 30 දින හෝ ඊට පෙර ගෙවිය යුතු නමුත් සංස්ථාව 2020/2021 තක්සේරුවට අදාළ ආදායම් බදු 2021 දෙසැම්බර් 31 දින වන විටත් ගණනය කර නොතිබුණි.

(ඔ)	2006 අංක 10 දරන දේශීය ආදායම් බදු (සංශෝධිත) පනතේ 106 වගන්තිය	ආදායම් බදු වාර්තාව ජූලි වර්ෂයේ නොවැම්බර් 30 හෝ ඊට පෙර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට භාර දිය යුතු නමුත් සංස්ථාව 2020/2021 තක්සේරු වර්ෂයට අදාළ ආදායම් බදු වාර්තාව 2021 දෙසැම්බර් 30 දින වන විටත් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට භාර දී නොතිබුණි.
(ඕ)	2014 පෙබරවාරි 11 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 5 (2) ඡේදය සහ 2003 ජුනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 5.1.3 වගන්තිය	මුදල් වර්ෂය ආරම්භවීමට දින 15 කට කලින් ඉදිරි මුදල් වර්ෂයේදී ක්‍රියාවට නැංවීමට අපේක්ෂිත වාණිජ ක්‍රියාකාරකම් ඇතුළත් ව්‍යාපාරික සැලැස්මක් පිළියෙල කර අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කිරීමෙන් පසු රේඛීය අමාත්‍යාංශය , රාජ්‍ය ව්‍යවසායකත්වය පිළිබඳ දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය සහ විගණකාධිපති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු නමුත් සංස්ථාව විසින් එවැනි වාර්තාවක් පිළියෙළ කර නොතිබුණි.
(ක)	2014 පෙබරවාරි 11 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5(2) වගන්තිය	ව්‍යාපාරික සැලැස්ම පදනම් කරගෙන ඉදිරි මුදල් වර්ෂයේදී ක්‍රියාවට නැංවීමට අපේක්ෂිත වාණිජ ක්‍රියාකාරකම් ඇතුළත් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු නමුත් සංස්ථාව 2020 වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිළියෙල කර නොතිබුණි.

(ග)	2003 ජුනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ	
	(i) 4.2.3 හා 4.2.6 වගන්ති	කාර්ය සාධන වාර්තා/ ප්‍රගති වාර්තා පිළියෙල කර කාර්තුමය, අර්ධ වාර්ෂික හා වාර්ෂික වශයෙන් ඉදිරිපත් කළ යුතු නමුත් සංස්ථාව එම වාර්තා පිළියෙල කර නොතිබුණි.
	(ii) 5.2.5 වගන්තිය	වාර්ෂික අයවැය මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15 කට කලින් පිළියෙල කර අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කිරීමෙන් පසු රේඛීය අමාත්‍යාංශයවන වැවිලි අමාත්‍යාංශය , රාජ්‍ය ව්‍යවසායකත්වය පිළිබඳ දෙපාර්තමේන්තුව මහා භාණ්ඩාගාරය සහ විගණකාධිපති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු නමුත් සංස්ථාව විසින් වාර්ෂික අයවැය ප්‍රමාදවී පිළියෙළ කර 2020 පෙබරවාරි 12 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමතකර අදාළ ආයතන වෙත යොමුකර නිබුණි.
(ච)	ජනාධිපති ලේකම් කාර්යාලය විසින් නිකුත් කරන ලද 1995 ජූලි 21 දිනැති අංක එස්ඒඅයි/ඒ/1/34 දරන රජයේ ඉඩම් පිළිබඳ මාර්ගෝපදේශයේ 07 වගන්තිය	රජයේ ඉඩම් බදු දීමේදී රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් තීරණය කරන ලද වෙළඳපොළ වටිනාකම මත පදනම්ව බදු කුලියක් තීරණය කළ යුතු නමුත් සංස්ථාව ස්වාධින රූපවාහිනී ආයතනය වෙත බදු පදනම මත ලබා දී තිබුණු රුඩ. 02 පර්චස්. 2.87 ක් සහ හුන්නස්ෆෝල් හොටෙල් ලිමිටඩ් වෙත ලබා දී තිබුණු රුඩ.2 පර්චස් 6 ක් (ගම්මඩුව හා හුන්නස්ගිරිය වතුයායන්හි) සඳහා 2022 මාර්තු 02 දින වනවිටත් රජයේ තක්සේරුවක් ලබාගෙන නොතිබුණු බවත්, ඕපලගල රාජ්‍ය වතුයායෙන් රුඩ.1 පර්චස් 39.07 ක් ඩයලොග් බ්‍රෝඩ්බැන්ඩ් නෙට්වර්ක් පුද්ගලික සමාගම

වෙත බදු පදනමට ලබාදීමේ දී වාර්ෂික බදු කුලිය ප්‍රධාන තක්සේරුකරු විසින් තීරණය කරන ලද පවත්නා වෙළඳපළ වටිනාකම මත පදනම්ව ගණනය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වසර දක්වා සංස්ථාවට රු.6,853,120 ක බදු කුලී ආදායමක් අහිමි වී තිබුණු බවත් නිරීක්ෂණය විය.

(ඵ) 1979 අංක 49 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා (සංශෝධන) පනතේ 07(1) ඒ උප වගන්තිය

හුන්නස්ගිරිය වතුයායෙන් රූඩ්.2 පර්චස් 6 ක භූමි ප්‍රමාණයක් හුන්නස්ෆෝල් හොටෙල් ලිමිටඩ් වෙත වසර 50 ක කාලයක් සඳහා අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමැතියක් නොමැතිව බදු පදනමට ලබා දී තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව .

ප්‍රසම්පාදන සැලැස්මෙහි ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තිය ප්‍රකාරව වතුයායන්හි ස්ථාවර වත්කම් මිලදි ගැනීමට අදාළ අධිකාරී මට්ටම, ආරම්භ කිරීමට අපේක්ෂිත දිනය හා අවසන් කිරීමට අපේක්ෂිත දිනය ආදී විස්තර ඇතුළත් කර නොතිබුණි.

3 අනෙකුත් විගණන නිරීක්ෂණ

3.1 කාර්යසාධනය

(අ) වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ දත්තයන්ට අනුව, 2020 වර්ෂයේ ශ්‍රී ලංකාවේ හෙක්ටයාරයක සම්මත වාර්ෂික නිමි තේ ඵලදාව කිලෝග්‍රෑම් 1,377 ක් වූවද, සංස්ථාව විසින් පාලනය කරනු ලබන වතු 15 හි එම ඵලදාව කිලෝග්‍රෑම් 103 ත් 992 ත් අතර ඉතා පහළ පරාසයක පැවතුණි.

(ආ) සංස්ථාව සතුව හෙක්ටයාර 4,189 ක තේ වගාවක් පවතින නමුත් ඒ අතරින් හෙක්ටයාර 2,838 ක් වර්ෂ 100 කට වඩා පැරණි නැවත වගා කළ යුතු තේ වගාවක් වන අතර එයින් හෙක්ටයාර 135 ක් පමණක් නැවත තේ වගාව සඳහා යොමු වී තිබුණි.

(ඇ) බාහිර වැවිලිකරුවන්ට ලබා තිබුණු හෙක්ටයාර් 1,356 කින් නිෂ්පාදනය කර තිබුණු සමස්ත නිමි තේ නිෂ්පාදනය, 2019 වර්ෂයේදී කිලෝග්‍රෑම් 99,850 වූ අතර එය 2020 වර්ෂයේදී කිලෝග්‍රෑම් 157,987 ක් විය. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කර තිබුණු තේ කර්මාන්තයේ දත්තයන්ට අනුව උක්ත භූමි ප්‍රමාණයේ වාර්ෂික සම්මත නිමි තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් 1,867,212 ක් වුවත් බාහිර වැවිලිකරුවන් විසින් නිෂ්පාදනය කර තිබුණේ, සමස්ත ඵලදාවෙන් සියයට 8 ක ප්‍රමාණයක් වීම මතභේදාත්මක කරුණක් ලෙස නිරීක්ෂණය කෙරේ.

(ඈ) වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ සංඛ්‍යාලේඛන අනුව 2020/2021 වර්ෂයට අදාළව නිකුත්කර තිබුණු දත්තයන්ට අනුව ශ්‍රී ලංකාවේ තේ කිලෝග්‍රෑම් එකක සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය රු.548 ක් විය යුතු වුවත්, සංස්ථාව පාලනය කරනු ලබන වතු 08 ක තේ කිලෝග්‍රෑම් එකක නිෂ්පාදන පිරිවැය රු.575 – රු.1,974 ක පරාසයක පැවතුණි.

(ඉ) සංස්ථාවේ අයවැය වාර්තාව අනුව 2020 වර්ෂයේදී අපේක්ෂිත නිෂ්පාදිතය කිලෝග්‍රෑම් 1,814,592 ක ප්‍රමාණය අතරින් කිලෝග්‍රෑම් 1,584,373 ක් ලබාගෙන තිබුණු අතර එය අපේක්ෂිත නිෂ්පාදිතයෙන් සියයට 87 ක ප්‍රමාණයකි.

(ඊ) තේ අපනයන සංගමය විසින් 2020 වර්ෂයට අදාළව අන්තර්ජාලය වෙත නිකුත්කර තිබුණු දත්තයන්ට අනුව තේ කිලෝග්‍රෑම් එකක සම්මත සාමාන්‍ය විකුණුම් වටිනාකම රු.631 ක් විය යුතු වුවත් සංස්ථාවේ එම අගය රු.386 ත් රු.470 ත් අතර පහළ පරාසයක පැවතුණි.

(උ) සංස්ථාවේ වතුයායන් 17 කට අදාළව සම්පූර්ණ භූමි ප්‍රමාණය හෙක්ටයාර් 11,012 ක් වුවද, ඉන් තේ සඳහා හෙක්ටයාර් 4,189 ක් ද රබර් සඳහා හෙක්ටයාර් 65 ක් ද, සුළු අපනයන භෝග හා වන වගාව සඳහා හෙක්ටයාර 2,471 යොදාගෙන තිබුණි. ඉතිරි ඉඩම් හෙක්ටයාර් 4,288 එනම් සියයට 39 ක් කිසිදු ආදායමක් ඉපයීමට දායක කර නොගෙන නිෂ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය.

(ඌ) 2012 වර්ෂයේ සංස්ථාවේ නිමි තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් 1,911,616 ක් වූ අතර එය සමාලෝචිත වර්ෂය වන විට කිලෝග්‍රෑම් 1,742,360 ක් දක්වා වර්ෂ හතක් තුළ කිලෝග්‍රෑම් 169,256 කින් එනම් සියයට 9 කින් පහළ ගොස් තිබුණු අතර එය 2020 වර්ෂයේ සම්මත ඵලදාවෙන් සියයට 30 ක් විය.

(එ) රබර් පර්යේෂණ ආයතනයේ ප්‍රකාශිත දත්තයන්ට අනුව 2020 වර්ෂයේ හෙක්ටයාරයක පැවතිය යුතු සාමාන්‍ය රබර් ගස් ප්‍රමාණය 516 ක් වන හෙයින් වලහන්දුව වතුයායේ හෙක්ටයාර් 65 ක භූමි ප්‍රමාණයක පැවතිය යුතු රබර් ගස් සංඛ්‍යාව 33,540 ක් වුවත් පැවති රබර් ගස් සංඛ්‍යාව 18,634 කි. එය තිබිය යුතු ප්‍රමාණයෙන් සියයට 55 ක් වේ. තවද 2020 වර්ෂය තුළ හෙක්ටයාරයක සාමාන්‍ය රබර් නිෂ්පාදනය කිලෝග්‍රෑම් 608 ක් වුවත් වලහන්දුව වතුයායේ හෙක්ටයාරයක සාමාන්‍ය රබර් නිෂ්පාදනය කිලෝග්‍රෑම් 456 ක එනම් සියයට 75 ක අගයක් ගෙන තිබුණි.

3.2 කාර්ය මණ්ඩල පරිපාලනය

(අ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙහි 2017 ජූලි 25 දිනැති , 2017 සැප්තැම්බර් 13 දිනැති, 2018 දෙසැම්බර් 21 දිනැති සහ 2019 සැප්තැම්බර් 09 දිනැති ලිපි ප්‍රකාරව ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයෙහි අනුමත කාර්ය මණ්ඩලයෙහි ස්ථිර තනතුරු 109 ක් කොන්ත්‍රාත් තනතුරු 3 ක් සහ තාවකාලික තනතුරු 2 ක් වූවද 2020 දෙසැම්බර් 31 දින වන විට ස්ථිර තනතුරු 19 ක ඌනතාවයක් ද තනතුරු 4 ක අනුමත තනතුරු ඉක්මවා පත්කිරීමක්ද, කොන්ත්‍රාත් තනතුරු 08 ක අනුමත තනතුරු ඉක්මවා පත් කිරීමක්ද, තනතුරු 2 ක ඌනතාවයක් ද සහ තාවකලික තනතුරු 2 ක ඌනතාවයක්ද පැවතුණි. ඊට අමතරව කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය ඉක්මවා පත්කිරීම් සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.3,126,189 ක් සහ ස්ථිර තනතුරු ඉක්මවා පත්කිරීම් සඳහා රු.2,417,804 ක වැටුප් හා දීමනා වශයෙන් ගෙවා තිබුණි.

(ආ) ආයතන සංග්‍රහයේ 11 පරිච්ඡේදයේ 5.2 වගන්තිය ප්‍රකාරව යම් තනතුරක පුරප්පාඩුවක් ඇති වූ වහාම එම තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු පත්කළ යුතු වූවත්, 2008 වර්ෂයේ සිට පුරප්පාඩුව පවතින "කළමණාකරු නීති" සඳහා ස්ථිර නිලධාරියෙකු පත් නොකොට කොන්ත්‍රාත් පදනම මත පත්කළ නිලධාරියා සඳහා සමාලෝචිත වර්ෂයේ සඳහා රු.220,609 ක වියදම් දරා තිබුණි.

(ඇ) 2018 ජූලි 18 දිනැති අංක 3/2018 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ II පරිච්ඡේදය අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියකින් තොරව තනතුරු 07 ක් සඳහා කොන්ත්‍රාත් පදනම මත හා ස්ථිර පදනම මත බඳවාගත් නිලධාරීන් සඳහා 2020 වර්ෂය තුළදී රු.3,051,901 ක වියදමක් සංස්ථාව දරා තිබූ තිබුණි.

(ඈ) 2003 ජූනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3.1 ඡේදය ප්‍රකාරව කිසියම් තනතුරකට බඳවා ගැනීම සඳහා තිබිය යුතු අධ්‍යාපන සහ අනෙකුත් සුදුසුකම් ඇතුළත් අනුමත බඳවා ගැනීම් හා උසස්කිරීමේ කාර්ය පරිපාටියක් සංස්ථාව සතුව නොතිබුණි.

(ඉ) ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 3 උපවගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවයේ සියලුම පුරප්පාඩු සඳහා පත්කිරීම් බලධාරියා විසින් ප්‍රසිද්ධ දැන්වීම් මඟින් අයදුම්පත් කැඳවීම් සිදුකළ යුතු වූවත් සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂයේ සිදුකළ නව බඳවා ගැනීම් 04 ක් ප්‍රසිද්ධ දැන්වීම් මඟින් අයදුම්පත් කැඳවීම් වලින් පරිබාහිරව සිදුකර තිබුණි.

3.3 කළමනාකරණ ක්‍රියාකාරකම්

(අ) මහනුවර, ගාල්ල සහ මාතලේ දිස්ත්‍රික්කවලට අදාළව සංස්ථාව විසින් පාලනය කරනු ලබන වතුයායන් 08 ක පර්චස් 450 ක් වූ භූමි ප්‍රමාණයක් හා මිඩිලන්ඩ් වතුයායේ නිල නිවාස 2 ක්ද, හුන්නස්ගිරිය වතුයායේ නිල නිවාස 2 ක්ද වසර 28 කට ආසන්න කාලයක සිට අනවසර පදිංචිකරුවන් භුක්ති විඳින බව නිරීක්ෂණය විය.

(ආ) සංස්ථාව සමාලෝචිත වර්ෂය අවසාන වන විට බදු පදනමට ලබා දී ඇති දේපළ වෙනුවෙන් බදුකරුවන්ගෙන් රු.8,911,700 ක බදු ආදයමක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව (කෙටුම්පත)

උක්ත වාර්තාවේ සඳහන් විගණන ඡේද සඳහා පිළිතුරු/කරුණු පැහැදිලි කිරීම්

1.2.1. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල නොවීම

(අ)(ආ) 2020 මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී සිදුවී ඇති මෙම අඩුපාඩු 2021 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කර ඇත.

(ඇ) විගණන වාර්තාවේ සඳහන් අඩුපාඩු ඇති නොවන පරිදි 2022 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය කටයුතු කරන බව දන්වා සිටින්නෙමු.

(ඈ) සංස්ථාව සතු ඉඩම්වලින් වලහන්දුව වතුයාය පමණක් රු. මි. 620 කට තක්සේරු කර ඇති අතර එම වටිනාකම හා 1996 දී අනෙකුත් ඉඩම්වල සංවර්ධන කටයුතු සඳහා වැය කර ඇති මුදල් ද ඇතුළත්ව 2020 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශනවල, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දේපල පිරියත හා උපකරණ යටතේ මුළු වත්කම් වටිනාකම ලෙස රු.මි. 645 ක් දක්වා ඇත. අනෙකුත් ඉඩම් තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව සමඟ අදාළ කටයුතු මේ වන විට ආරම්භ කර ඇත. මේ සඳහා වැයවන මුදල මහා භාණ්ඩාගාරය මගින් ලබා ගැනීමට අපේක්ෂා කරන අතර එම මුදල් ලද වහාම මෙම කටයුතු ආරම්භ කරන බව දන්වනු කැමැත්තෙමු.

(ඉ) ශූන්‍ය අගයක් පවතින ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම 2023 වර්ෂයේදී සිදු කිරීමට සැලසුම් කර ඇති බව දන්වා සිටින්නෙමු.

(ඊ) 2020 මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී සිදුවී ඇති මෙම වරද, 2022 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව දන්වා සිටිමු .

(උ) 2020 මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී සිදුවී ඇති මෙම වරද 2021 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කර ඇත.

(ඌ) 2023 වර්ෂයට අදාළ ආයතනයේ සේවක ප්‍රතිලාභ බැඳීම් ගණනය කිරීමේදී ආයු ගණන ක්‍රමය යොදා ගැනීමට අපේක්ෂා කරන බව දන්වා සිටිමු.

(එ) සංස්ථාව විසින් ප්‍රාදේශිය වැවිලි සමාගම් වෙත බදු දී ඇති දේපල වටිනාකම ආයෝජන දේපල ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති අතර, එම දේපල පිළිබඳ විස්තර හා ගිවිසුම්ගත බැඳීම් පිළිබඳව, 2022 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමු.

(ඒ) 2020 මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී සිදුවී ඇති මෙම වරද 2021 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කර ඇත.

(ඔ) සංස්ථාව සතු පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් තක්සේරු කිරීම 2023 වර්ෂයේදී ආරම්භ කිරීමට අපේක්ෂා කරන බව දන්වා සිටිමු. වන වගාවට අදාළව වැරදි ලෙස ගිණුම් ගත කර තිබූ ක්ෂය වටිනාකම 2021 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කර ඇත.

(ඕ) මෙම වරද 2022 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව දන්වා සිටිමු.

1.2.2. ගිණුම්කරණ ප්‍රතිපත්ති

පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් යටතේ දක්වා ඇති වාණිජමය දැව වගාව තක්සේරු කිරීමේ කටයුතු 2023 වර්ෂයේදී ආරම්භ කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමු.

1.2.3. ගිණුම්කරණ අඩුපාඩු

(අ) විගණන වාර්තාවේ සඳහන් කර ඇති රු. 877,414.00 වූ වියදම් අධිගණනය 2021 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කර ඇත.

(ආ) විගණන වාර්තාවේ සඳහන් අඩුපාඩු ඇති නොවන පරිදි 2022 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන බව දන්වා සිටින්නෙමු.

(ඇ) සංස්ථාවට අයත් ලංකා බැංකු ගිණුම් අංක 2327550.00 දරණ ජංගම ගිණුම යටතේ 2012 ට වර්ෂයට පෙර පැවැති බැංකු අයිරාවක් සඳහා බැංකුව විසින් අය කළ පොළියෙන් 50% කපා හැරීමට බැංකුව විසින් එකඟ වී තිබූ හෙයින්, ඒ අනුව ඊට අදාළ රු.4,123,000.00 ක මුදල පොත්වලින් ඉවත් කරන ලදී. කෙසේ වෙතත් බැංකුව විසින් එම මුදල පොත්වලින් කපා හැරීමට ප්‍රමාද කිරීම හේතුවෙන් මෙම ගැටළුව පැන නැගී තිබුණි. මේ වන විට අදාළ පොළී කපා හැරීම පිළිබඳව ලංකා බැංකුව විසින් 2022.03.03 දින යටතේ ලිපියක් නිකුත් කර ඇති අතර, ඒ අනුව එම ගැටළුව නිරාකරණය වී ඇත. **(ඇමුණුම් 01)**

(ඈ) රු. 1,609,054.00 ක් වූ මදුරු කූරු තොගය 2021 වර්ෂයේදී ටෙන්ඩර් කැඳවීම මඟින් විකුණන ලද අතර ඊට අදාළ ගිණුම් ගැලපීම් 2021 වර්ෂයේදී සිදු කරන ලදී.

(ඉ) අසාර්ථක වී ඇති තේ පැල තවාන් පිළිබඳව පරීක්ෂාකිරීම සඳහා 2023 වර්ෂයේදී කමිටුවක් පත් කිරීමට අපේක්ෂා කරන අතර එම කමිටුවේ නිර්දේශය මත ඉදිරි කටයුතු සිදුකිරීමට අපේක්ෂා කරන බව දන්වා සිටින්නෙමු.

(ඊ)I.II විගණන වාර්තාවේ සඳහන් ආකාරයේ අඩුපාඩු ඇති නොවන පරිදි 2021 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇත.

1.2.4. නොසැසඳුණු පාලන ගිණුම්

(අ) 2023 වර්ෂයේදී මෙම ශේෂ අතර පවතින වෙනස පිළිබඳව ජනතා වතු සංවර්ධන මණ්ඩලය සමඟ සාකච්ඡා කර මෙම ගැටළුව විසඳීමට කටයුතු කරන බව දන්වමු.

(ආ) ප්‍රධාන කාර්යාලය හා වතුයායන් අතර ජංගම ගිණුම් වල පවතින වෙනස්කම් පරීක්ෂාකර බලා අවශ්‍ය ගිණුම් ගැලපීම් 2022 වර්ෂය තුළදී සිදු කිරීමට කටයුතු කරන බව දන්වමු.

1.2.5. පැහැදිලි නොකළ වෙනස්කම්

(අ) සංස්ථාවට අයත් ගෝමර වතුයායේ වතු අධිකාරිව සිටි නිලධාරියා උසස්වීමක් ලැබ 2017.02.26 දින ආයතනයේ සාමාන්‍යාධිකාරී ලෙස රාජකාරි භාරගත් හෙයින් එම නිළධාරියා වෙනුවෙන් වූ පාරිතෝෂික වෙන්කිරීම් මුදල ගෝමර වතුයායෙන් ප්‍රධාන කාර්යාලය වෙත මාරු නොකිරීම නිසා මෙම වෙනස පැන නැගී ඇත. කෙසේ වෙතත් සමස්ථයක් ලෙස ගත් විට සංස්ථාවේ පාරිතෝෂික සඳහා වෙන් කිරීම් ශේෂයට මෙයින් බලපෑමක් සිදුවී නොමැති බව දන්වා සිටින අතර, එසේම අදාළ ගැලපීම් මේ වන විට සිදු කර ඇති බව දන්වා සිටින්නෙමු.

(ආ) 2020/12/31 දිනට වන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සටහන් අංක 9.1 යටතේ පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් වල වටිනාකම ලෙස රු. 3,314,581,132.89 ක වටිනාකමක් දක්වා ඇති අතර, එම මුදල සැකසී ඇති ආකාරය පහත දක්වා ඇත.

	2017/12/31 දිනට සංස්ථාවට අයත් වතුවල වාණිජ වන වගාවේ වටිනාකම	3,312,160,200.00
(+)	2018 වර්ෂය තුළ සංස්ථාව වතු වාණිජ වන වගාව සඳහා වැය කර ඇති මුදල	2,420,932.89
	මුළු මුදල	3,314,581,132.89

ඉහත පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් සඳහා ස්ථාවර වත්කම් ලේඛණයක් ආයතනය විසින් පවත්වා ගෙන නොතිබුණි. වාර්තාවේ සඳහන් රු. 2,420,933.00 ක මුදල එක් එක් වතු අනුව සැකසී ඇති ආකාරය දැක්වෙන ලේඛනයක් ආයතනය සතුව පවතින අතර එහි සහතික කළ පිටපතක් මේ සමඟ අමුණා ඇත.
(ඇමුණුම් අංක 02)

විගණන වාර්තාවේ සඳහන් දේපල පිරියත හා උපකරණවලට අදාළව ලෙජර් ගිණුම් හා ස්ථාවර වත්කම් පිළිබඳ විස්තර දැක්වෙන ලේඛණ අතර පවතින රු .168,874,507 ක වෙනස පිළිබඳව මේ වන විට පරීක්ෂා කරමින් පවතින අතර, ස්ථාවර වත්කම් පිළිබඳ ලේඛණවලට අදාළ නිවැරදි කිරීම් 2022 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සිදු කරන බව දන්වා සිටිමු.

(ඇ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂය සහ ප්‍රධාන කාර්යාලය විසින් පවත්වාගෙන යන උපලේඛණය අනුව ධාරක ජීව විද්‍යාත්මක වත්කම්වල ශුද්ධ පොත් අගය සහ එකතු කිරීම් ලෙස දක්වා ඇති ශේෂයන් අතර පවතින වෙනස්කම් මේ වන විට පරීක්ෂා කෙරෙමින් පවතින අතර, ඊට අදාළ නිවැරදි කිරීම් 2022 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සිදුකරන බව දන්වා සිටිමු.

1.2.6. <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

(අ) වසර ගණනාවක සිට සංස්ථාව මුහුණ පා ඇති මූල්‍ය අර්බුදය හේතුවෙන් ණය හිමියන් පියවීම නිසි පරිදි සිදු කිරීමට නොහැකි වී ඇත. කෙසේ වෙතත් සංස්ථාවේ සියළු ණය හිමියන් පිළිබඳ විස්තර මේ වන විට පරීක්ෂා කරමින් පවතින අතර, ඒ අනුව කල්පසු වූ ණය හිමියන් පියවීම හෝ එම ශේෂ නැවත ආදායමට ගැනීම පිළිබඳව 2022 වර්ෂය අවසන් වීමට පෙර තීරණයක් ගැනීමට නියමිත බව දන්වා සිටින්නෙමු.

(ආ) සංස්ථාව වසර ගණනාවක සිට මුහුණ දෙන මූල්‍ය අර්බුදය හේතුවෙන් වතු කාර්ය මණ්ඩල අර්ථසාධක සංගමය (ESPS) වෙත නිසි පරිදි දායක මුදල් යැවීමට නොහැකි වී ඇත. මෙම ගෙවීම් සඳහා අවශ්‍ය මුදල් මහා භාණ්ඩාගාරයෙන් ලබා ගැනීමට අපේක්ෂා කරන අතර, එම මුදල් ලද පසු මෙම ගෙවීම් නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමු.

(ඇ) SLSPC/PL/TB/T-88/2010 සහ SLSPC/PL/TB/T-88/ 2011 යන ගස් විකිණීමට අදාළ ටෙන්ඩර් සඳහා ලබාගත් මුදල් (ආපසු ගෙවිය යුතු තැන්පතු මුදල්) නැවත ගෙවීමක් සිදු නොකරන ලද්දේ එම ගණුදෙනුකරුවන් සහ සංස්ථාව අතර ඇතිවූ යම් ගැටළුකාරී තත්ත්වයක් හේතුවෙනි. මේ සම්බන්ධව කරුණු පරීක්ෂා කර 2023 වර්ෂයේදී එම මුදල් සංස්ථාවේ ආදායමක් ලෙස ගිණුම් ගත කිරීමට හෝ එම මුදල අදාළ පාර්ශ්ව වෙත නිදහස් කිරීමට කටයුතු කරන බව දන්වමු.

(ඈ) අය නොවන ණයගැතියන් සම්බන්ධව විස්තර පරීක්ෂා කිරීම සඳහා මේ වන විට නිලධාරී කමිටුවක් පත්කර ඇති අතර එම විස්තර ලද පසු එම මුදල් අයකර ගැනීම හෝ පොත්වලින් කපා හැරීම සම්බන්ධව නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා තවත් කමිටුවක් පත් කිරීමට අපේක්ෂා කෙරේ. එම කමිටු නිර්දේශ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල තීරණ පරිදි අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වමු.

(ඉ) ඇල්කඩුව වැවිලි සමාගමෙන් අය විය යුතු රු.1,916,092 00ක මුදල පිළිබඳව වැවිලි අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර එය පොත් වලින් කපා හැරීමට හෝ අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වා සිටින්නෙමු.

1.2.7. <u>විගණනය සඳහා සාක්ෂි නොමැති වීම</u>

(අ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් තුළ ඇතුළත් රු. 1,933,043.00 ක අක්‍රීය ගිණුම් ශේෂය 2012 වර්ෂයට පෙර සිට පැවත එන ශේෂයක් බැවින් මේ පිලිබඳව නැවත පරීක්ෂා කර, අවශ්‍ය අනුමැතීන් මත අදාළ ගිණුම් ගැලපීම් 2022 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සිදුකරන බව දන්වමු.

(ආ) විගණන වාර්තාවේ සඳහන් රු. 235,826,809.00 ක් වූ ණය හිමි ශේෂ එකතුව සැදී ඇති ආකාරය පහත දන්වා ඇත. කෙසේ වෙතත් ආයතනයේ පවතින අයහපත් මූල්‍ය තත්වය නිසා මෙම ශේෂ නිරවුල් කිරීමට නොහැකි වී ඇත.

විස්තරය	**මුදල රු.**
අත්තිකාරම් - ඔපල්ගල	4,480,000.00
පොලි කෙම්ක්ස්	715,389.00
පර්ත් වතුයාය	6,870,411.00
ජනතා වතු සංවර්ධන මණ්ඩලය (ජනවසම)	97,709,342.00
රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව	28,709,029.00
පොහොර සංස්ථාව	35,931,679.00
හලාවත වැවිලි සමාගම	36,410,959.00
ලංකා ඛණිජ වැලි ආයතනය – ණය	25,000,000.00
එකතුව	235,826,809.00

ශේෂ සනාථ කිරීම් සම්බන්ධ ලිපි සෘජුවම ජනවසම ගොඩනැගිල්ලේ පිහිටි විගණන කාර්යාලය වෙත යවන ලෙස අදාළ ආයතන වෙත දන්වා යවා තිබූ අතර, ඒවායේ පිටපත් අප වෙත යොමු කරන ලෙස එම ලිපි වල සඳහන් කර තිබුණි. ඒ අනුව ශේෂ සනාථ කිරීමට අදාළ ලිපිවල පිටපත්, හලාවත වැවිලි සමාගම සහ ලංකා මිනරල් සෑන්ඩ්ස් යන ආයතන විසින් පමණක් අප වෙත එවා තිබූ හෙයින් ඒවායේ පිටපත් මේ සමඟ අමුණා ඇත. (ඇමුණුම් අංක 03 හා 04)

කෙසේ වෙතත් අනෙකුත් ආයතන විසින් ශේෂ සනාථ කිරීම් ලිපි එවා නොතිබුන හෙයින්, සංස්ථාවේ පොත්වල සටහන් ශේෂයන් නිවැරදි ලෙස සලකා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලදී.

(ඇ) ගස් අලෙවිය මත ණය වටිනාකම වූ රු. 2,801,000.00 ක මුදල 2016 වර්ෂයට පෙර සිට පැවත එන ශේෂයක් වන අතර මෙම ශේෂයේ ස්වභාවය, එය කොපමණ කලක සිට පැවත එන ශේෂයක්ද හා එය සැදී ඇති ආකාරය පිළිබඳව පරීක්ෂා කර බලා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත මෙම මුදල පොත්වලින් ඉවත්කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමු.

(ඈ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ දැක්වෙන ආපසු ගෙවිය යුතු රු. 6,379,570.00 ක ටෙන්ඩර් තැන්පතු මුදල 2006 වර්ෂයට පෙර සිට ඉදිරියට රැගෙන ආ ශේෂයන් වේ. මේ පිළිබඳව පරීක්ෂා කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත 2022 වර්ෂය තුළ මෙම මුදල පොත්වලින් කපා හැරීමට අපේක්ෂා කරන බව දන්වා සිටින්නෙමු.

(ඉ) මේ සම්බන්ධයෙන් පරීක්ෂාකර බලා අදාළ පරිදි ගිණුම් ගැලපීම් 2022 වර්ෂය තුළ සිදු කරන බව දන්වා සිටිමු.

(ඊ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දේපල පිරියත හා උපකරණ යටතේ දක්වා ඇති වන කළමනාකරණ සැලැස්ම සකස් කිරීම සඳහා 2009 වර්ෂයේදී දරණ ලද වියදම වන රු. 1,645,340.00 මුදල ගිණුම් ගත කිරීමේදී සිදුවී ඇති වරද 2022 වර්ෂය තුළ නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමු. එසේම රු. 6,705,259.00 ක් වූ වටිනාකම 2010 වර්ෂයට පෙර සිට ඉදිරියට රැගෙන එන ශේෂයක් වේ. මෙම ශේෂය පැන නැගී ඇති ආකාරය හා සැකසී ඇති ආකාරය පරීක්ෂා කර අවශ්‍ය ගිණුම් ගැලපීම් 2022 වර්ෂය තුළ සිදු කිරීමට අපේක්ෂා කෙරේ.

(උ) සංස්ථාව සතු ඉඩම්, ගොඩනැගිලි හා වාහන සම්බන්ධයෙන් ආයතනයේ දැනට ඇති ලිපි ලේඛණ, 2021 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා පැමිණෙන විගණන නිළධාරීන් වෙත ලබාදීමට කටයුතු කරන බව දන්වා සිටින්නෙමු.

(ඌ) විලම්බිත වත්කම් ලෙස දක්වා ඇති රු. 781,064.00 ක මුදල් 2012 වර්ෂයට පෙර සිට පැවත එන ශේෂයක් වන අතර සංස්ථාව සතු වතුයායන්වල දේපල බදු දීමේදී එම දේපල වලට ප්‍රවේශවීමේ මාර්ග නඩත්තුව සඳහා දරණ ලද වියදම් මින් නිරූපණය වේ. එම මුදල් සැකසී ඇති ආකාරය පහත දක්වා ඇත.

විස්තරය	මුදල් රු.
අලකොල්ල වතුයාය	9,013.00
ගල්පීල්ල වතුයාය	62,159.44
හුන්නස්ගිරිය වතුයාය	588,762.33
රංගල වතුයාය	121,129.00
එකතුව	781,063.77

මෙම මාර්ග නඩත්තු වියදම්, 2012 වර්ෂයේදී Ernst & Young විගණන ආයතනයේ උපදෙස් මත, වසර 10 ක් තුළ කපා හැරීමට තීරණය කරණ ලදී. එසේ වුවද 2012 න් පසුව වසර කිහිපයක් එම ක්ෂය කපා හැරීම සිදු නොකර තිබූ හෙයින් 2021/12/31 දින වන විට රු . 438,730.00 ශේෂයක් ඉතිරිව ඇත.

(එ) 2020.12.31 දිනට කොටගඟ, ගෝමර, හෙයාපාර්ක්, හුන්නස්ගිරිය, වෛයිතලාව හා වලහන්දුව යන වතුවල පොහොර, රසායන ද්‍රව්‍ය හා වැවිලි කටයුතු සඳහා අවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය භෞතිකව සත්‍යාපනයට අදාළ සත්‍යාපන වාර්තාවල පිටපත් මේ සමඟ අමුණා ඇත. එසේම ඒ පිළිබඳ ලිපි ගොණු විගණන නිලධාරීන්ට ලබා දෙන ලදී. **(ඇමුණුම් අංක 5)**

(ඒ) අය නොවන ණය ගැනියන් සම්බන්ධව විස්තර පරීක්ෂා කිරීම සඳහා මේ වන විට නිළධාරී කමිටුවක් පත්කර ඇති අතර එම විස්තර ලද පසු එම මුදල් අයකර ගැනීම හෝ පොත්වලින් කපා හැරීම සම්බන්ධව නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා තවත් කමිටුවක් පත් කිරීමට අපේක්ෂා කෙරේ. එම කමිටු නිර්දේශ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල තීරණ පරිදි අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වමු.

(ඔ) මෙම ශේෂයන් 2012 වර්ෂයට පෙර සිට ඉදිරියට රැගෙන ආ ඒවා වන බැවින් එම වටිනාකම් සැකසී ඇති ආකාරය පිළිබඳව පරීක්ෂාකර බලා 2022 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අදාළ හෙලිදරව් කිරීම් සිදු කිරීමට කටයුතු කරන බව දන්වමු.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.2.2. නීතිරීති /විධානයට යොමුව

(අ) විගණන වාර්තාවේ සඳහන් පරිදි 2020 වර්ෂයේදී ප්‍රවාහන දීමනා සහ ඉන්ධන දීමනා ගෙවා ඇත්තේ පහත සඳහන් නිළධාරීන් වෙතය.

ආර්.අයි.බී.එස්.එස්. බණ්ඩාර මහතා	-	අභ්‍යන්තර විගණක (මෙම නිළධාරියා 2021.05.21 දින සේවයෙන් ඉල්ලා අස්වන ලදී.)
බී. වී.එල්.සී බෙනරගම මිය	-	කළමනාකාරිණී - ඉඩම්
ආර්.සී කහවිට මහතා	-	කළමානකාරිණී - වැවිලි

අදාළ ගෙවීම් සිදු කර ඇත්තේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මතය.

මෙම ප්‍රවාහන දීමනා ගෙවීම සම්බන්ධව 2021.09.30 දිනැතිව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙතින් එවන ලද ලිපිය හා අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි කළමනාකරු - ඉඩම් වෙත ගෙවන ලද ප්‍රවාහන හා ඉන්ධන දීමනාව 2022 ජනවාරි මාසයේ සිට නවතා දමන ලදි.

වතු අධිකාරි ලෙස පත්වීමක් ලබා දී ඇති ආර්.සී කහවිට මහතා එම වකවානුවේදීම වැඩ බැලීමේ පදනම මත කළමනාකරු - වැවිලි තනතුරෙහි සේවය කරන ලදි. වතු අධිකාරිවරයෙකු ලෙස ඔහුගේ පත්වීම් ලිපියට අනුව සුපරීක්ෂණ කටයුතු සඳහා මෝටර් රථයක් ලබා දිය යුතු බැවින් ඔහුට ලබා දිය යුතු සුපරීක්ෂණ මෝටර් රථය වෙනුවට ප්‍රවාහන දීමනාවක් ලබා දෙන ලදි. ඒ සඳහා රියදුරෙකු ලබා නොදෙන ලදී.

ඒ අනුව සුපරීක්ෂණ රථයක් ලබා දීම වෙනුවට රියදුරෙකු නොමැතිව රු. 50,000/- ක දීමනාවක් ලබා දීම සංස්ථාවට වඩා වාසිදායක විය.

(ආ) සංස්ථාවේ සභාපති සඳහා වතු අධික්ෂණ කටයුතු සහ වෙනත් ක්ෂේත්‍ර රාජකාරි කටයුතු වෙනුවෙන් අවශ්‍ය ඉන්ධන ප්‍රමාණයන් 2020 වර්ෂයට අදාළ වාර්ෂික වියදම් ඇස්තමේන්තුවට ඇතුළත් කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත. කෙසේ වෙතත් අදාළ චක්‍රලේඛ සීමාවන් ඉක්මවා 2020 සහ 2021 යන වර්ෂවල සභාපතිගේ වාහනය සඳහා ලබා ගෙන ඇති ඉන්ධන සම්බන්ධ විස්තර, 2022.08.26 දින පැවත්වීමට නියමිත අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව දන්වා සිටින්නෙමු.

(ඇ) සංස්ථාවේ සාමාන්‍යාධිකාරි සඳහා වතු අධික්ෂණ කටයුතු සහ වෙනත් ක්ෂේත්‍ර රාජකාරි කටයුතු වෙනුවෙන් අවශ්‍ය ඉන්ධන ප්‍රමාණයන් 2020 වර්ෂයට අදාළ වාර්ෂික වියදම් ඇස්තමේන්තුවට ඇතුළත් කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත. කෙසේ වෙතත් අදාළ චක්‍රලේඛ සීමාවන් ඉක්මවා 2020 සහ 2021 යන වර්ෂවල සාමාන්‍යාධිකාරිගේ වාහනය සඳහා ලබා ගෙන ඇති ඉන්ධන සම්බන්ධ විස්තර, 2022.08.26 දින පැවත්වීමට නියමිත අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව දන්වා සිටින්නෙමු.

(ඈ) සංස්ථාව සතු ධාවන තත්ත්වයේ පවතින වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කිරීමක් මේ දක්වා සිදු කර නොමැත. වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේදය අනුව මේ සඳහා සංස්ථාවට විශාල මුදලක් වැය කිරීමට සිදු වන අතර සංස්ථාවේ දැනට පවතින අයහපත් මූල්‍ය තත්ත්වය අනුව මෙය අසීරු කටයුත්තකි. එසේම සංස්ථාව සතු ට්‍රැක්ටර් වැනි වාහන වල ඉන්ධන දහනය පරීක්ෂා කිරීම සම්බන්ධව ගැටළුද පවතියි. කෙසේ වෙතත් 2023 වර්ෂයේදී මෙම ඉන්ධන දහනය පරීක්ෂා කිරීමේ කාර්යය ආරම්භ කිරීමට කටයුතු කරන බව දන්වා සිටින්නෙමු.

(ඉ) 2021 වර්ෂයේ සිට සංස්ථාව සතු වාහන සඳහා ලොග් පොත් නඩත්තු කිරීම සිදු කරන බව දන්වා සිටින්නෙමු.

(ඊ)(උ) සංස්ථාව බොහෝ කලක සිට මුහුණ දෙන මූල්‍ය අර්බුදය හේතුවෙන් සේවක අර්ථසාධක දායක මුදල්, සේවා නියුක්තියන්ගේ භාර අරමුදලේ දායක මුදල් සහ සේවක පාරිතෝෂික මුදල් නියමිත පරිදි ගෙවීමට නොහැකිවීමෙන් මෙම අධිභාර මුදල් ගෙවීමට සිදුව ඇත. මෙම හිඟ මුදල් පියවීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් මුදල් ලබා ගැනීමට අපේක්ෂා කරන අතර එම මුදල් ලැබීමෙන් පසුව අදාළ ගෙවීම් නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වා සිටින්නෙමු.

(ඌ) සංස්ථාව සතු භාවිතයට ගත නොහැකි අපහරණය කළ යුතු තත්ත්වයේ පවතින වාහන අපහරණය කිරීමේ කටයුතු 2023 වර්ෂයේදී ආරම්භ කරන බව දන්වා සිටින්නෙමු.

(එ) 2021 වර්ෂයේ සිට මාසික බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීමේදී ඒවා පිළියෙල කළ දිනයන් සඳහන් කිරීමට කටයුතු කර ඇති බව දන්වමු. 2021 මූල්‍ය ප්‍රකාශන පරීක්ෂා කිරීම සඳහා පැමිණෙන විගණන නිළධාරීන් වෙත ආයතනයට අයත් සියළුම බැංකු ගිණුම් වලට අදාළ බැංකු ප්‍රකාශන හා බැංකු සැසඳුම් ප්‍රකාශ ලබා දීමට කටයුතු කරන බව දන්වා සිටින්නෙමු.

(ඒ)(ඔ) ආයතනය බොහෝ කලක සිට මුහුණ දෙන මූල්‍ය අර්බුදය හේතුවෙන් ආයතනය විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතුව තිබූ බදු පිළිබඳව හා ආදායම් බදු වාර්තා යැවීම සම්බන්ධව අවධානයක් යොමු වී නොමැත. එබැවින් මේ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කර, එම උපදෙස් පරිදි ඉදිරි කටයුතු සිදු කිරීමට අපේක්ෂා කෙරේ.

(ඕ)(ක) සංස්ථාවේ 2023 වර්ෂය සඳහා ව්‍යාපාරික සැලැස්මක් හා ඒ මත පදනම්ව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කිරීමට කටයුතු කරන බව දන්වා සිටින්නෙමු.

(ග) i 2023 වර්ෂය සඳහා සකස් කිරීමට නියමිත ක්‍රියාකාරී සැලැස්ම අනුව කාර්තු, අර්ධ වාර්ෂික හා වාර්ෂික වශයෙන් කාර්ය සාධනය ඇගයීමට ලක් කිරීමටත්, එම වාර්තා අදාළ ආයතන වෙත යැවීමටත් කටයුතු කරන බව දන්වා සිටින්නෙමු.

ii 2020 වර්ෂයට අදාළ අයවැය ලේඛන පිළියෙල කිරීමේ ප්‍රමාදයක් සිදු වී තිබුනද 2020 අයවැය ලේඛනය සඳහා 2020.02.12 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදි අනුමැතිය ලබා ගෙන ඇත. එම අයවැය ලේඛනයේ පිටපතක් මේ සමඟ අමුණා ඇත. **(ඇමුණුම් අංක 06)**

(ච) ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් ගම්මඩුව වතුයායේ රූඩ් 02 පර්චස් 2.87 ක් ස්වාධීන රූපවාහිණී ආයතනය වෙත බදුදීම සඳහා රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අංක: MPI/2/IND/98 හා 1998.12.18 දිනැති ලිපිය මඟින් අනුමැතිය ලැබී ඇත. අදාළ ලිපියේ පිටපතක් මේ සමඟ අමුණා ඇත. **(ඇමුණුම් අංක 07)**

සංස්ථාවට අයත් හුන්නස්ගිරිය වතුයායේ රූඩ් 01 පර්චස් 20 ක් (අංක 2196 දරණ පිඹුරුපත අනුව) ස්වාධීන රූපවාහිණී ආයතනය වෙත බදුදීම සඳහා රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු, වැවිලි කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ අංක:එම්පීඅයි/2/එස්පීඩී/ඉඩම් හා 1996.08.15 දිනැති ලිපිය මඟින් අනුමැතිය ලැබී ඇත. අදාළ ලිපියේ පිටපතක් මෙයට අමුණා ඇත. **(ඇමුණුම අංක 08)**

හුන්නස්ගිරිය වතුයායේ පර්චස් 40 ක්, පිපල්ස් මීඩියා නෙට්වර්ක් (පුද්ගලික) සමාගම වෙත 2008 වර්ෂයේදී බදු දීම සඳහා වන බදු ගිවිසුම අත්සන් කිරීම වෙනුවෙන් ජනතා වතු කළමණාකරන සහ සංවර්ධන අමාත්‍යාංශයේ අංක : PEMD/Ad/Ep/C/1 හා 2007.11.07 දිනැති ලිපිය මඟින් අනුමැතිය ලැබී ඇත. අදාළ ලිපිවල පිටපතක් මේ සමඟ අමුණා ඇත. **(ඇමුණුම අංක 09)**

(ඡ) සංස්ථාවට අයත් ගම්මඩුව වතුයායේ රූඩ් 2 පර්චස් 2.87 ක් ස්වාධීන රූපවාහිණී ආයතනයට බදු දීමේදී එම ආයතනය සමඟ බදු ගිවිසුමක් අත්සන් කර නොමැති අතර ඒ හේතුවෙන් රජයේ තක්සේරුව මත පදනම් වූ බදු කුලියක් අය කර නොමැත. එම ආයතනය සමඟ බදු ගිවිසුමක් අත්සන් කිරීම වෙනුවෙන්, එම ආයතනය වෙත 2020/12/23 හා 2021/10/22 දිනැති ලිපි යවා ඇති අතර ඒ සම්බන්ධයෙන් මේ දක්වා පිළිතුරක් ලැබී නොමැත. එසේම ස්වාධීන රූපවාහිනී ආයතනය සමඟ මේ සම්බන්ධව 2021.03.16 දින සංස්ථා ප්‍රධාන කාර්යාලයේ සාකච්ඡාවක්ද පවත්වන ලදි. එහිදී ගිවිසුම අත්සන් කිරීමට දිනයක් අප වෙත දන්වන බව පැමිණි නිලධාරීන් එකඟ වුවත් එලෙස කටයුතු සිදු නොවීම නිසා, අදාළ නිළධාරීන් දුරකථනයෙන් සම්බන්ධ කර ගැනීමට උත්සාහ කළ ද එය සාර්ථක නොවීය. ඒ අතර කිහිප අවස්ථාවකදීම එකී ආයතනයේ සභාපති ධූරයද වෙනස් විය. මෙවැනි ප්‍රායෝගික ගැටළු මත මේ දක්වා අදාළ බදු ගිවිසුම අත්සන් කිරීමට නොහැකි වී ඇත. එබැවින් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ සහාය ඇතිව මෙම ගැටළුව නිරාකරනය කර ගැනීමට අපේක්ෂා කරන බව දන්වා සිටිමු.

සංස්ථාවට අයත් හුන්නස්ගිරිය වතුයායෙන් හුන්නස්හෝල්ස් හොටෙල් ලිමිටඩ් වෙත රූඩ් 02 පර්චස් 06 ක භූමි ප්‍රමාණයක් හෝටලයේ පිවිසුම් මාර්ගය සඳහා අංක 08 දරණ 2008.08.08 දිනැති බදු ගිවිසුම මගින් වසර 50 කට බදු දී ඇත. අදාළ බදු මුදල තීරණය කිරීමේදී තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් තක්සේරු වාර්තාවක් ලබා ගෙන

නොමැත. මේ සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කර එම උපදෙස් පරිදි ඉදිරි කටයුතු සිදු කරන බව දන්වා සිටිමු.

සංස්ථාව සතු ඕපල්ගල රාජ්‍ය වතුයායෙන් රූඩ් 01 පර්චස් 39.07ක ඉඩම් ප්‍රමාණයක් ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ් (පුද්ගලික) සමාගම වෙත, 2000.01.01 දිනැති අංක 111 දරණ ගිවිසුම මගින් බදු දී ඇත. මෙහිදී රජයේ තක්සේරු වටිනාකමට වඩා අඩු මුදලක් අදාළ ගිවිසුමේ සඳහන් වී ඇත. මේ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කර එම උපදෙස් මත ඉදිරි කටයුතු සිදු කරන බව දන්වා සිටිමු.

(ට) සංස්ථාව සතු හුන්නස්ගිරිය වතුයායෙන් රූඩ් 02 පර්චස් 06 ක ඉඩම් කොටසක් හුන්නස්හෝල්ස් හොටෙල් ලිමිටඩ් ආයතනය වෙත බදු දීමේදී අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගෙන නොමැත. මේ සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කර එම උපදෙස් පරිදි අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වා සිටින්නෙමු. (මෙම ඉඩම් බදු දීම සම්බන්ධව විස්තර ඉහත (ඡ) යටතේ දක්වා ඇත.

2.2.3 ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව පිහිටුවීමට අදාළ පාර්ලිමේන්තු පනතේ සඳහන් සංස්ථාවේ බලතල හා කාර්තව්‍යන්ට අනුකූල වන පරිදි ආයතනයේ කටයුතු පවත්වාගෙන ගොස් ඇති බව දන්වා සිටින්නෙමු.

2.2.4 සංස්ථාව මුහුණ දෙන මූල්‍ය අර්බුදය හේතුවෙන් ආයතනයේ ස්ථාවර වත්කම් මිලට ගැනීම පිලිබඳව නිවැරදි පුරෝකථනයන් සිදු කිරීමට අපහසු වී ඇත. කෙසේ වුවත් 2023 වර්ෂයට අදාළ ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමේදී වතුයායන්හි ස්ථාවර වත්කම් මිලට ගැනීම්ද එහි ඇතුළත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටින්නෙමු.

3.<u>අනෙකුත් විගණන නිරීක්ෂණ</u>

3.1 <u>කාර්යසාධනය</u>

(අ) වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ දත්තයන්ට අනුව 2019 වර්ෂයේ ශ්‍රී ලංකාවේ හෙක්ටයාරයක සම්මත නිමි තේ ඵලදාව කිලෝ ග්‍රෑම් 1482 ක් වුවද 2020 ට අදාළ එම අගය කි.ග්‍රෑ 1376.8 කි. සංස්ථාවේ සංඛ්‍යාලේඛණ අනුව 2019, 2020 හා 2021 වර්ෂයන්ට අදාළව, සංස්ථාව සතු වතුවල නිමි තේ ඵලදාව පිළිබඳ පරාසයන් පහත දක්වා ඇත.

වර්ෂය	හෙක්ටයාරයකට නිමි තේ ඵලදාව (කිලෝ ග්‍රෑම්)
2019	174 – 723
2020	201 – 991
2021	198 - 1131

ඉහත වගුව අනුව 2019 වර්ෂයට සාපේක්ෂව 2020 හා 2021 වර්ෂවලදි සංස්ථාව සතු වතුවල තේ ඵලදාව සැලකිය යුතු මට්ටමකින් ඉහල නැංවීමට හැකි වී ඇති බව දන්වා සිටින්නෙමු.

(2019 වර්ෂයේදී සංස්ථාවේ පාලනය යටතට ගත් විහාරගල වත්ත හා 2019 වර්ෂයේ වෙනම වත්තක් ලෙස හඳුනාගෙන 2022 වර්ෂයේදී ඕපල්ගල වතුයායට නැවත සම්බන්ධ කරන ලද කුඩාඔය වත්ත පිලිබඳ දත්ත ඉහත වගුවට ඇතුළත් කොට නොමැත)

(ආ) සංස්ථාවේ ලිපි ගොනු අනුව 2020 වන විට ආයතනය සතු තේ ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 4,189.06 වන අතර එයින් හෙක්ටයාර් 2,838ක් වසර 100 ට වඩා පැරණි තේ වගාවක් වේ. එයින් හෙක්ටයාර් 180 ක, නැවත තේ වගා කටයුතු, රේඛීය අමාත්‍යාංශයේ මුදල් ප්‍රතිපාදන යොදා ගෙන මේ වනවිට ආරම්භ කර ඇත.

(ඇ) සංස්ථාවේ ලිපි ගොනු අනුව 2019 වර්ෂයේදී බාහිර වැවිලිකරුවන්ට ලබාදී තිබූ ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 1,391ක් වන අතර, එම වර්ෂයේ බාහිර වැවිලිකරුවන්ගේ සමස්ත තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් 99,850 විය. එම නිෂ්පාදනය 2020 හා 2021 වර්ෂවලදී පිළිවෙලින් කි.ග්‍රෑ. 157,987ත්, කිලෝ ග්‍රෑම් 170,645ත් විය.

ඒ අනුව 2019 වර්ෂයට සාපේක්ෂව 2020 හා 2021 වර්ෂවලදී තේ නිෂ්පාදනයේ සැලකිය යුතු ප්‍රගතියක් ලබා ගැනීමට හැකිවී ඇත. කෙසේ වෙතත් බාහිර වැවිලිකරුවන් වෙත ලබා දී ඇත්තේ ඉතාමත් අඩු ඵලදාවකින් යුත් තේ ඉඩම් වන අතර, 2020 වර්ෂයේ ආරම්භයේ සිට පොහොර ලබා ගැනීමේ ගැටළු සහගත තත්ත්වයක් පැවතීම හේතුවෙන් අපේක්ෂිත පරිදි තේ නිෂ්පාදනය වර්ධනය කර ගැනීමට නොහැකි විය.

(ඈ) විගණන වාර්තාවෙහි, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තුමේන්තුව විසින් 2018/2019 වර්ෂයන්ට අදාළව නිකුත් කර තිබූ දත්තයන්ට අනුව ශ්‍රී ලංකාවේ කි.ග්‍රෑ. එකක සාමාන්‍ය පිරිවැය රු. 484.00ක් ලෙස දක්වා තිබුණ ද, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ සංඛ්‍යාලේඛණ අනුව 2020 වර්ෂයට අදාළව ශ්‍රී ලංකාවේ තේ කි.ග්‍රෑ. එකක සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය රු. 547.77 වේ. විගණන වාර්තාවේ සඳහන් පරිදි වතුයායන් 9ක වාර්ෂික නිෂ්පාදන ඒකක පිරිවැය රු. 500.00 සිට රු. 1974.00 ක පරාසය තුළ පැවති බව පිළිගන්නෙමු.

(ඉ) 2020 වර්ෂයේ ආරම්භයේ සිට පොහොර ලබා ගැනීමේ ගැටළු සහගත තත්ත්වයක් පැවතීම හේතුවෙන් අපේක්ෂිත පරිදි තේ නිෂ්පාදනය වර්ධනය කර ගැනීමට නොහැකි විය.

(ඊ) විගණන වාර්තාවේ සඳහන් පරිදි සංස්ථාවට අයත් වතුවලට අදාළ 2020 වර්ෂය සඳහා වන ශුද්ධ විකුණුම් සාමාන්‍ය (NSA) රු.386.00 - රු.470.00 ක පරාසයක පැවති බව පිලිගන්නෙමු.

(උ) වර්ෂ 2020 වර්ෂය වනවිට සංස්ථාව සතු භූමි ප්‍රමාණය හෙක්ටයාර 11,012 වන අතර එයින් තේ වගාව සඳහා හෙක්ටයාර 4,189.06 ක් ද, රබර් වගාව සඳහා හෙක්ටයාර 64.56 ක් ද, සුළු අපනයන භෝග හා වන වගාව සඳහා හෙක්ටයාර 2,471.38 ක් වෙන්වී තිබුණි. ඊට අමතරව මුඩුබිම්, කෑලෑ, ගල්පර්වත හා නකල්ස් රක්ෂිත කලාපය තුළ පිහිටි ඉඩම් ප්‍රමාණයද ඇතුළුව වගා නොකරනලද බිම් ප්‍රමාණය හෙක්ටයාර 4,287.70 කි. වගා නොකරන ලද භූමි ප්‍රමාණයෙන් වැඩි ප්‍රතිශතයක් නකල්ස් රක්ෂිත කලාපයේ පිහිටා ඇති බැවින් එම ප්‍රදේශ තුළ කිසිදු වගාවක් කළ නොහැකි බව දන්වා සිටින්නෙමු.

(ඌ) සංස්ථාවේ ලිපිගොනු අනුව 2012 වර්ෂයේ සංස්ථාවේ නිමි තේ නිෂ්පාදනය (බාහිර වැවිලිකරුවන් ලබාගත් නිෂ්පාදනය ඇතුළුව) කිලෝ ග්‍රෑම්. 2,102,344ක් විය. එසේම 2020 හා 2021 යන වසර වලදී සංස්ථාවේ නිමි තේ නිෂ්පාදනය පිලිවෙලින් කිලෝ ග්‍රෑම්. 1,742,363 හා කිලෝ ග්‍රෑම් 1,803,226 කි.

2020 හා 2021 වර්ෂවලදී සංස්ථාවේ තේ වගාව සඳහා වෙන්වී ඇති භූමි ප්‍රමාණයන් පිළිවෙලින් හෙක්ටයාර් 4,189.06 ක් හා 4,199.74 වේ. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ සංඛ්‍යාලේඛණ අනුව, සංස්ථාව 2020 හා 2021 වර්ෂවල ලබාගත් නිමි තේ නිෂ්පාදනය, සම්මත නිමි තේ නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස ගත්විට පිළිවෙලින් 30% ක් හා 31% ක් වේ.

(එ) ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනයේ දත්ත අනුව හෙක්ටයාරයකට සිටුවිය හැකි රබර් පැළ සංඛ්‍යාව 516 ක් වන අතර, අසාර්ථක වන පැළ සංඛ්‍යාවද සැලකිල්ලට ගත්විට, හෙක්ටයාරයක සමාන්‍යයෙන් පවතින රබර් ගස් ගණන 300-500 අතර ප්‍රමාණයක් වේ. කෙසේ වෙතත් සංස්ථාවට අයත් වලහන්දුව වතුයායේ හෙක්ටයාරයක සාමාන්‍ය රබර් නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් 456 ක් ලෙස පවතින බව පිලිගන්නෙමු.

3.2 <u>කාර්ය මණ්ඩල පරිපාලනය</u>

(අ)(ආ)(ඇ) සංස්ථාවේ සමස්ත අනුමත කාර්ය මණ්ඩලය තුළ, එක් එක් තනතුරු ඛාණ්ඩය යටතේ අනුමත වී ඇති තනතුරු සංඛ්‍යාව (ස්ථිර හෝ කොන්ත්‍රාත්) නොඉක්මවන පරිදි කාර්ය මණ්ඩල බඳවා ගැනීම් සිදු කර ඇත. ඒ අනුව

සමස්ථ අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා බඳවා ගැනීම් සිදුවී නොමැත. කිසියම් තනතුරක් වෙනුවෙන් ස්ථිර නිලධාරියෙකු බඳවා ගැනීමකින් තොරව එම තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත නිළධාරියෙකු බඳවා ගැනීමෙන් අවශ්‍ය විටක අදාළ නිළධාරියාගේ කොන්ත්‍රාත් සේවා කාලය අවසන් කිරීමට හැකි වීම නිසා එය ආයතනයට වඩා වාසිදායක වේ. එසේම ආයතනයේ තනතුරු පුරප්පාඩු පැවතිය ද ආයතනය මුහුණ දෙන මුල්‍ය අර්බුදය හේතුවෙන්, අත්‍යවශ්‍ය සීමිත කාර්ය මණ්ඩලයක් මගින් සංස්ථාවේ කටයුතු පවත්වාගෙනයාමට සිදුව ඇති බව දන්වා සිටින්නෙමු.

(ඈ) සංස්ථාවේ බඳවා ගැනීමේ පටිපාටිය සකස් කිරීම සම්බන්ධයෙන් කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව සහ අමාත්‍යාංශය විසින් ලබා දුන් උපදෙස් මත, එවකට සකස් කර තිබූ බඳවා ගැනීමේ පටිපාටිය තෙවරක් සංශෝධනය කිරීමෙන් අනතුරුව එය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යොමු කිරීම සඳහා 2021.12.14 දිනැති ලිපිය මගින් වැවිලි අමාත්‍යාංශයට යොමු කරන ලදි. ඒ අනුව වැවිලි අමාත්‍යාංශය විසින් අමාත්‍යාංශ ලේකම්වරයාගේ නිර්දේශය මත කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යවන ලද කෙටුම්පත් බඳවා ගැනීමේ පටිපාටිය එම දෙපාර්තමේන්තුව විසින් නැවත වරක් සංශෝධන සඳහා අප ආයතනය වෙත යොමු කළ අතර, එම උපදෙස් පරිදි සිව්වන වතාවටද අදාළ සංශෝධන සිදු කර එය 2022.07.07 දිනැති ලිපිය මඟින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත භාර දෙන ලදි.

(ඉ) විගණන වාර්තාවේ සඳහන් බඳවා ගැනීම් කොන්ත්‍රාත් පදනම මත සිදු කරන ලද කෙටිකාලීන පත්වීම් වේ. ස්ථිර සේවකයින් බඳවා ගැනීමේදී, සෑම විටම දැනට සකස් කර අනුමැතිය සඳහා යවා ඇති බඳවා ගැනීමේ පටිපාටියට අනුව, ප්‍රසිද්ධ දැන්වීම් පළ කර අදාළ බඳවා ගැනීම් සිදු කරනු ලැබේ. තාවකාලික පත්කිරීම් සඳහා ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පළ කිරීමේදී විශාල පිරිවැයක් දැරීමට සිදු වන අතර, සංස්ථාව දැනට මුහුණ දී ඇති මුල්‍ය අර්බුදය හේතුවෙන් එවැනි වියදම් දැරීමද අසීරු වී ඇති බව දන්වා සිටින්නෙමු.

3.3 <u>කළමනාකරණ ක්‍රියාකාරකම්</u>

(අ) විගණන වාර්තාවේ සඳහන් සංස්ථාවට අයත් වතුවල අනවසරයෙන් පර්චස් 450 ක් සහිත භූමියක පදිංචිවී සිටින අයවළුන් අතරින් පර්චස් 05 ක භූමි ප්‍රමාණයක් භුක්ති විඳිමින් සිටි තල්වඩම් ගෙදර රංජිත් සුභසිංහ හා සින්තාමනී යන අයගෙන් එම භූමිය නැවත අත්පත් කර ගෙන ඇත. එසේම විගණන වාර්තවේ සඳහන් අනෙකුත් නිල නිවාසවල අනවසර පදිංචිකරුවන්ට හා ඉහත සඳහන් පර්චස් 445 ක භූමි ප්‍රමාණයක් අනවසරයෙන් භුක්ති විඳින පාර්ශ්වයන්ට එරෙහිව මේ වන විට නඩු පවරා ඇත.

(ආ) සංස්ථාව විසින් 2020 පෙබරවාරි 06 දිනට පෙර විවිධ පාර්ශ්ව වෙත බදු දී ඇති ඉඩම්වලින්, නියමිත පරිදි රජයේ තක්සේරුව මත බදු අය නොවන ඉඩම් සම්බන්ධ විස්තර අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර එම උපදෙස් පරිදි අදාළ ක්‍රියාමාර්ග ගන්නා බව දන්වා සිටින්නෙමු.

2020 පෙබරවාරි 06 දිනෙන් පසුව මේ දක්වා සංස්ථාව සතු කිසිදු ඉඩමක් බදු දී නොමැත.

